المكتب التعاوني للدعوة والإرشاد
وتوعية الجاليات بالبديعة
Badeea Islamic Center

البديعة
badeea

# ජේසුස් දෙවියන් වහන්සේගේ පුත්‍ර යාද?

## هل المسيح (عليه السلام) إبن الله؟



سنهالي

تأليف الشيخ :
زين العابدين
ترجمة :
جيم سليم

# ජේසුස්
# දෙවියන් වහන්සේගේ
# පුත්‍රයාද?

**Forum for Religious and Cultural Studies**
D.S. Senanayake Mawatha,
Cólombo 08,
Sri Lanka.

# හැඳින්වීම

ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේ ලෙස මැදහත්කම් කරන්නාවූ අපගේ හවුල් සහෝදර සහෝදරියන් වෙනුවෙන් ඉතාම යහපත් මාර්ගය කුමක්ද? යන්නත් දෙවියන්වහන්සේ සැබෑ ලෙස හඳුනා ගැනීමටත් අපට කළ හැකි එකම කාර්යය මේ පොත් පිංච තුලින් ඔබට දායාද කරන්නෙමු.

ජේසුස් නම් සත්‍යවාදී මනුෂ්‍ය පුත්‍රයාණන් හා එතුමණ්ගේ අසහාය දේව පණිවිඩයත් වර්ථමාන මනුෂ්‍යයා නොසැලකිලිමත් කමින් හා අශෝභන අයුරින් පරිශීලනය කිරීම පිළිබඳව අප කම්පාවට පත්ව සිටින්නෙමු. එබැවින් ඔබ උදෙසා සැබෑවූ එකම දෙවියන්වහන්සේ හඳුනා ගැනීම ලොව ඔබ ලබන වටිනාම සැපතයි. උන්වහන්සේ සැමදාම එකසේ සිටින්නාවූද ස්වයංභූ දෙවිකෙනෙකි.

ජේසුස් තුමන් පොළොවට පැමිණියේ ඉශ්‍රායේල් ජනයාට දෙවිඳුන් ප්‍රකාශ කරන්නටය. නමුත් උන්වහන්සේ දෙවියන්වහන්සේ වූයේ නැත. ඔහු දේව රාජ්‍යය මනුෂ්‍යයාට ප්‍රකාශ කළාවූ ශ්‍රේෂ්ඨ මිනිසෙකි. දේව දූත මෙහෙවරෙහි යෙදුනාවූ නබිවරයෙකි. මේ කුඩා ග්‍රන්ථයෙන් අප ඒ ගැන අවධාරණය කරන අතරම සත්‍යව්‍යංගයෙන් නොව සත්‍ය ලෙසම හුවා දක්වන්නෙමු.

කිතුණු සහෝදර සහෝදරියන් දෙවියන් වහන්සේ ලෙස ක්‍රිස්තුස් වහන්සේද අදහති. මෙය බයිබලය නම් වූ ශුද්ධවූ ග්‍රන්ථයටද නිගා කරන්නා සේ අප පිළිගනිමු. හේතුව ජේසුස් නම් මරියතුමියගේ පුත්‍රයායි. ඔහු මනුෂ්‍යයෙකි. මිනිසා මැවුම්කරුවාණන් අමතක කොට මැවීමේ කාර්යයට නමස්කාර කර දෙවියන්වහන්සේට විරුද්ධව ක්‍රියා කරන්නේය. ජේසුස් වහන්සේම දෙවියන්වහන්සේට යාච්ඤා කොට ඉල්ලා සිටියේ 'ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණෙනි! ඔබගේ නාමය ගෞරවයට පැමිණේවා' යනුවෙති. අප කරන කියන දේ පිළිබඳ සැලකිලිමත් වීම මෙය තුල අවධාරණය

වී ඇත. දෙවියන්වහන්සේව ගෞරවයට පැමිණවීම ජේසුස්ගේ ක්‍රියාවයි. අපද එය ආදර්ශයට ගෙන කටයුතු කළ යුතුයි.

කිතුණු සහෝදර සහෝදරියනි! අප ඔබට සත්‍යයට අවතීර්න වන්නට ආරාධනා කර සිටින්නෙමු. ඔබ හරි ලෙසින් සිතා දැඩිව අල්ලා ගෙන සිටින විස්වාසයන් බයිබලයට ඉදුරාම පටහැනිය. ජේසුස් තුමන් කිසිදා දෙවියන්වහන්සේව සිටියේ නැත. එතුමා දෙවිඳුන්ගේ දූත මෙහෙවර මොනවට ඉටු කළ තැනැත්තානන්ය. එබැවින් සැබෑ වූ එකම දෙවිඳුන් 'එලෝහිම්' නොහොත් 'අල්ලාහ්'මය. විශ්වාස කරන්නාහට උන් වහන්සේ ප්‍රකාශ වන්නේමය.

අප කිතුණු සහෝදරත්වය හඳුනමු. ඔවුන්ට අප 'අල්ලාහ්' නාමයෙන් ප්‍රේම කරන්නෙමු. ඔවුනට නින්දා නොකරමු. නමුදු ඒ අතර සත්‍යය මාර්ගය ප්‍රකාශ කරමු. ඇත්තේ එකම එක දෙවියෙකි. හේ සියළු මැවීමෙහි කතෘවර 'අල්ලාහ්මය' උන් වහන්සේව සොයා එම මාර්ගය ඔබට විවෘත කර සහ සැපත දායාද කරනු වස් මෙම පොත් පිංච සකස් කරලීමේ සැබෑ අරමුණයි. එය කියවා සොයා දැන ගන්නට කිතුණු ජනතාවට මුළු හදින් ආරාධනා...

එමෙන්ම පාඨක සහෘදයෙනි, මේ පිළිබඳ ඔබට යම් ප්‍රශ්නයක් හෝ තහවුරු කරගැන්මක් අවශ්‍ය වන්නේනම් ඒ සඳහා ඔබ වෙනුවෙන් අප නිරතුරු අවධියෙන් සිටින අතර දවසෙහි පැය 24 පුරාම අපට කථාකර තොරතුරු දැනගත හැකිය. ඔබට සදා සැපත උරුමකර දීමට මාර්ගය අප කියාදෙමු. විවෘත කරගැනීම ඔබ සතුය.

මෙයට

F. R. C. S. ප්‍රකාශන කමිටුව

# පෙරවදන

ස්වර්ගයේ සිටින තේජෝත්තමයාණන් වන දෙවියන්වහන්සේගේ නාමයෙන්

ජේසු තුමන් යනු එකම සර්ව බලධාරී දෙවියන්වහන්සේට පමණක් මිනිසුන් නැමදිය යුතු යැයි උපදෙස් කළ සත්‍ය දූතයන්ගෙන් කෙනෙකු යැයි මුස්ලිම්වරු විශ්වාස කරති. එපමණක් නොව මුහම්මද් තුමන්ද ශුද්ධ කුර්ආනයේ සඳහන් මෙම කරුණ මෙසේම පැහැදිලි කරන හෙයින් ජේසු තුමන් දෙවියන්ගේ දූතයෙකු ලෙසින් පිළිගෙන ගරු කිරීම මුස්ලිම්වරුන්ගේ අනිවාර්ය වගකීමක් වන්නේය.

නමුත් මේ අතර ක්‍රිස්තියානි ආගමිකයන් ජේසු තුමන් දෙවියන්වහන්සේගේ පුත්‍රයා යැයි විශ්වාස කරති.

මේ ආකාරයෙන් ලොව ඇති ප්‍රබලම ආගම් දෙකෙහි ජේසු තුමන් පිළිබඳ ස්ථාවරය මෙසේ හාත්පසින්ම වෙනස් දෙයාකාරයකින් තිබෙනු දැකිය හැකිය.

එසේ නම් මෙහි සත්‍යය කුමක්ද?

එය කුමක්දැයි සොයා බැලීම අපගේ පැහැර හැරිය නොහැකි වගකීමකි.

කුර්ආනයේ ජේසු තුමන්ව පසසමින් සඳහන් වී ඇති වැකි හුවා දක්වා ඒ අනුව එතුමන් දෙවියන්වහන්සේගේ පුත්‍රයාම යැයි මුස්ලිම්වරුන් සමග තර්ක කිරීමට කිතුනු ආගමිකයන් විසින් කරන වෑයම් වැඩි වෙමින් පවතින මෙවන් කාලවකවානුවක" මෙම ප්‍රශ්නයට පැහැදිලි විසඳුමක් ඉදිරිපත් කිරීම නොපමාව කළ යුතු කාර්ය භාරයක් බවට පත් වී ඇත.

මෙම ග්‍රන්ථයේ බිහි වීම ඒ අනුව කළ අධීක්ෂණයක ප්‍රතිඵලයකි.

ශුද්ධවූ බයිබලය හෝ කුර්ආනය පිළිබඳ විපරමක මෙතෙක් නොයෙදුනු කෙනෙකුට වුවද තර්කානුකූල ස්ථාවරයකින් මෙම ප්‍රශ්නය දෙස බලන කල" සර්වබලධාරී දෙවියන්වහන්සේට පුතෙකු හෝ එවන් කිසිදු ඥාති සබඳතාවයක් තිබිය නොහැකිය යන කරුණ පහසුවෙන්ම වැටහෙනු ඇත.

මෙසේ මෙය පිළිබඳ තාත්වික පැහැදිලි කිරීමක් සාක්ෂාත්ව තිබෙන අතරම පූජකයන් විසින් නොමඟ යවනු ලැබීම නිසා සත්‍ය මාර්ගයේ ගමන් කර ස්වර්ගයට ඇතුල් වන අවස්ථාව කිතුනු සොහොයුරන්ට අහිමි වෙමින් පවතින තත්ත්වය ඉතා සංවේගජනකය.

බයිබලයේද සඳහන් ඇතැම් වැකි උපුටා දක්වමින් ජේසුස් තුමන් දෙවියන්වහන්සේගේ පුත්‍රයෙකුද? නැතිද? යන ප්‍රශ්නයට පැහැදිලි කිරීම් මා මෙම කෘතියෙන් කොටස් හතරකින් ඉදිරිපත් කර ඇත්තෙමි.

ජේසුස් තුමන් දේව කුමාරයෙකු යැයි තර්ක කරන්නට කිතුනුවන් ඉදිරිපත් කරන තර්ක ඒ සඳහා පිළිගත නොහැක්කේ ඇයිද යන කරුණ පළමු කොටසෙහි මා පැහැදිලි කර ඇත්තෙමි.

දෙවියන්වහන්සේටම අදාල ඇතැම් සුදුසුකම් ගැන විස්තර බයිබලයේම සඳහන් වී ඇත. එමෙන්ම සාමාන්‍ය මිනිසුන්ට අදාල ගති ලක්‍ෂණද බයිබලයේ සඳහන් වේ. එසේ සඳහන් වී ඇති කරුණුවලින් දෙවියන්වහන්සේගේ ලක්‍ෂණ කිසිවක් ජේසුස් තුමන්ට නොගැලපෙන සැටි මෙන්ම එහි සඳහන් මිනිස් ලක්‍ෂණ එතුමන්ට කෙසේ කදිමට ගැලපෙන්නේද යන කරුණ දෙවෙනි කොටසෙන් පැහැදිලි කර ඇත්තෙමි.

එපමණක් නොව ජේසුස් තුමන් දේව කුමාරයෙකු නොවේ යැයි දෙවියන්වහන්සේ විසින්ම බයිබලයේ පවසන ආකාරයද දැකිය හැකිය. එසේම ජේසුස් තුමන්ම තමා දේව කුමාරයෙකු නොවේ යැයිද පවසනු, බයිබලයේ කිහිප තැනකම සඳහන් වී ඇත. මේ පිළිබඳ තුන්වැනි කොටසෙහි විස්තර කර ඇත්තෙමි.

ජේසුස් තුමන් දෙවියන්වහන්සේගේ පුත්‍රයා යැයි කුර්ආනයම පිළි ගන්නේ යැයි තර්ක කිරීමට කිතුනුවන් උපුටා දක්වන කරුණු පිළිගත නොහැක්කේ ඇයිද යන කරුණ අවසාන කොටසෙහි මා පැහැදිලි කර ඇත්තෙමි.

මෙම පොත මධ්‍යස්ථ සිතකින් යුතුව කියවා බලන කිතුනු සොහොයුරන් ඇතුළු ඕනෑම කෙනෙකු මෙහි ඉදිරිපත් කර ඇති තර්ක පිළිගනු නිසැකය. තවද ඔවුන් ජේසුස් තුමන් දෙවියන්වහන්සේ හෝ දේව කුමාරයෙකු නොව" ලොවට දෙවියන්වහන්සේගේ පණිවිඩය ගෙන ආ සත්‍ය දූතයෙකි යන කරුණද පිළිගනු නොඅනුමානය. අපගේ බලාපොරොත්තුවද එයයි.

මෙයට

**පී. සෙයිනුල් ආබිදීන්**

# දෙවියන් වහන්සේට පුත්‍රයෙක්ද?

සර්වබලධාරී දෙවියන්වහන්සේ කෙබන්දෙක්ද?

- ➢ ඔහු හුදෙකලාය
- ➢ ඔහු කිසිවෙකු හෝ කිසිවක් වෙත ආධීන නොවේ
- ➢ ඔහු කිසිවෙකු නොවැදුවේය
- ➢ ඔහු කිසිවෙකු විසින් වදනු නොලැබුවේය
- ➢ ඔහුට සමාන කිසිවෙකු නොමැත
- ➢ සියළුම විශ්වයන් මවන ලද්දේ ඔහු විසිනි
- ➢ ඔහු සියල්ල පාලනය කරන්නා වේ
- ➢ මැවීමට හා විනාශ කිරීමට හැක්කේ ඔහුට පමණි
- ➢ ඔහු සදාකාලිව පවතින්නේය

සර්වබලධාරී දෙවිඳුන් පිළිබඳ නුවණට ගැලපෙන කෙටි විග්‍රහය මෙයයි.

නමුත් ඇතැම් ලබ්ධිකයන් දෙවියන්වහන්සේට බිරියන්, දරුවන්, සොහොයුරන් වැනි නෑකම් යා කරමින් දෙවියන්වහන්සේගේ අද්විතීය තත්ත්වය කෙලසන්නට වෑයම් කරති.

තමන් සතුව සත්‍ය ආගමක් තිබේය යැයි පවසන කිතුනු සොහොයුරන්ද මෙලෙසින්ම තර්ක කරමින් බයිබලයේ සඳහන් සත්‍ය කියුම්ද නොසලකා තමන්ව මුලා කර ගනිමින්, අනුන්ද නොමඟ යැවීමට උත්සාහ කරති.

ඔවුන්ගේ මෙම තර්ක අධීක්ෂණය කිරීමට පෙර සර්වබලධාරී දෙවියන්වහන්සේට පුතෙකු අවශ්‍ය දැයි යන පැනය අප විමසුමට ලක් කරමු.

# දෙවියන්වහන්සේට පුතෙකු අවශ්‍යද?

පුතෙකු අවශ්‍ය වන්නේ මහළු විය හෝ මරණය බලාපොරොත්තු වන්නෙකුටය.

කවරෙකුට ඔහුගේ වයෝවෘධ වියෙහි ආහාර පාන, ඉඳුම් හිටුම් හා වස්ත්‍ර සොයා ගැනීමට උපකාර අවශ්‍ය වන්නේද දූ දරුවන් අවශ්‍ය වන්නේ එවැන්නෙකුටය.

මිනිසා දූ දරුවන් ප්‍රිය කිරීමට අන් කරුණු කාරනා තිබුනද අවශ්‍යථාවයක් ලෙසින් ඇති මූලික කරුණු මේවාය. මරණයක් හෝ මහළු වීමක් නැතය යන සහතිකය සමග මිනිසා ලොව උපදින්නේ නම් බොහෝසෙයින් ඔහුට දරුවෙකු අවශ්‍ය යැයි නොසිතනු ඇත. එවැනි තත්ත්වයක් තුල බහුතරයක් මිනිසුන් දරුවෙකු බිහිකරමින් අනවශ්‍ය වියදම් හෝ වගකීම් දැරීමට ඉදිරිපත් නොවනු ඇත. එය අවශ්‍යද නොවේ. වගකීමට ඇති බිය නිසා එක දරුවෙකු හෝ දරුවන් දෙදෙනෙකුට වඩා ඇති කිරීමට බියෙන් ඒ සඳහා මිනිසා අද පවුල් සැලසුම් කරන සැටිද, යම් සුළු ප්‍රමාදයකින් දෙවැනි හෝ තෙවැනි දරුවෙකු පිලිසිඳ ගත් විට එය විනාශ කිරීමට පවා මිනිසා ක්‍රියා කරන සැටිද අප අද දකින්නෙමු.

දරුවන් නිසා තමන්ට අනාගතයේදී ප්‍රයෝජන තිබෙන බව වටහා ගෙන සිටින විටම එයට එතරම් කැමැත්තක් නොදක්වන හා එය තමන්ට කරදරයක් විය හැකි යැයි සිතන මිනිසා, එවැනි කිසිදු ප්‍රයෝජනයක් නැති විටෙක ආරම්භ වසර කිහිපයකට පමණක් සීමාවන දරු සුරතලට ආශාවෙන් පමණක් දරුවන් ඇති කරති යැයි සිතීම අසීරුය.

දෙවියන්වහන්සේ ගැන විශ්වාස කරන මිනිසුන් දෙවියන්ට මරණයක් නැත යැයිද විශ්වාස කරති. දෙවියන්ට මහන්සිය හෝ විඩාව ඇති වේ යැයි නොසිතති. ඔහු මහළු වියට පත් වන බවක් හෝ ඔහුට ලෙඩ දුක් ඇති වන බවක් හෝ පිළි නොගනිති.

නමුත් ඔහුට පුතෙකු අවශ්‍යය යන මිනිස් දුබලකම පමණක් ඔහුට තිබේ යැයි කියති.

දෙවියන්වහන්සේ නිසි අන්දමින් වටහා ගෙන ඇත්තන් මෙලෙසින් ඔහුට දරුවන් අවශ්‍ය යැයි නොකියනු ඇත.

එසේ වුවද ජේසු තුමන් දෙවියන්වහන්සේගේ පුත්‍රයා යැයි විශ්වාස කරන ජනයා මෙවැනි තර්ක නිසා සිය විශ්වාසය අත් හරින්නේ නොමැත. එය කිරීමට මෙම කරුණ පිළිබඳ වඩාත් ගැඹුරින් සාකච්ඡා කළ යුතුය. කුමන පදනමක සිට ඔවුන් මෙසේ විශ්වාස කරත්ද, එම පදනමේ ඇති පිළිගත නොහැකි තත්ත්වය ඔවුන්ට පැහැදිලි කර දිය යුතුය. ඔවුන් තරයේ විශ්වාස කරන ග්‍රන්ථයෙන්ම ඔවුන්ගේ මෙම ප්‍රකාශය නිෂ්ප්‍රභා කරන කරුණු ගෙන හැර දිය යුතුය. ඔවුන්ට නිසි පැහැදිලි කිරීමක් විය හැක්කේ එවැනි ව්‍යායාමයකි. මෙම කෘතියෙන් කරනු ලබන ප්‍රෝත්සාහයද එයමය.

# පළමු කොටස

# 1. ජේසු තමන්ගේ පුත්‍රයෙකු යැයි දෙවියන්වහන්සේ විසින්ම කීම

කිතුනු සොහොයුරන් ජේසුස් තුමන් දෙවියන්වහන්සේ යැයි විශ්වාස කරන්නේ පහත සඳහන් කරුණු දක්වමිනි:

- ජේසුස් තුමන් තමන්ගේ පුත්‍රයෙකු යැයි දෙවියන්වහන්සේම ශුද්ධ බයිබලයේ සඳහන් කරයි
- ජේසුස් තුමන් හා දෙවියන්වහන්සේ එකිනෙකා වෙන් කළ නොහැකි පුද්ගලයන් දෙදෙනෙක් යැයි බයිබලය පවසයි
- ජේසුස් තුමන් දෙවියන්වහන්සේම යැයි බයිබලය ප්‍රකාශ කරයි
- ජේසුස් තුමන් පියෙකු නොමැතිව ලොව උපන්නේය
- ජේසුස් තුමන් ප්‍රාතිහාර්යයන් ගනනාවක්ම සිදු කර පෙන්වූයේය
- ජේසුස් තුමන් මළවුන්ගෙන් ආපසු නැගිටියේය
- ජේසුස් තුමන් පරිශුද්ධ ආත්මයෙන් පුරවනු ලැබුවේය

ඉහත සඳහන් කරුණුවලින් කිතුනුවන් ප්‍රධාන වශයෙන් ඉදිරිපත් කරන්නේ දෙවියන්වහන්සේ විසින්ම බයිබලයේ ජේසුස් තුමන් තම පුත්‍රයා යැයි සඳහන් කර තිබෙන ප්‍රකාශයයි.

**තවද අහසින් කටහඬක් නික්මී 'මගේ ප්‍රේමණීය පුත්‍රයාණෝ මොහුයි. මාගේ මහත් ප්‍රසාදය මෙතුමන් කෙරෙහියැ' යි කියැවිණි. -මතෙව් 3:17**

මෙම බයිබල් වැකිය අනුව ජේසුස් තුමන් ව 'මගේ දයාබර පුත්‍රයා' යැයි දෙවියන්වහන්සේ අමතා ඇත. එසේ දෙවියන්වහන්සේ විසින්ම ජේසුස් තුමන්ව සිය පුතා යැයි කියා ඇති නිසා එය එසේම විය යුතු යැයි කිතුනුවන් තර්ක කරති.

දෙවියන්වහන්සේ විසින් යමෙකුව සිය පුත්‍රයා යැයි කී සැනින් එම ප්‍රකාශය එලෙසින්ම වචනාර්ථයෙන් පිළි ගන්නට කිතුනුවන් සූදනම් වන්නේ නම් ඔවුන්ගේ එම ස්ථාවරයෙහි ඔවුන් අවංක හා ඒකාකාරී විය යුතුයි. එසේ නොවේද? එසේ ඔවුන් අවංක වන්නේ දැයි විමසා බලමු.

**ශුද්ධ බයිබලය අප කියවා බැලුවහොත් එහි ජේසුස් තුමන්ට පමණක් නොව අනෙකුත් කිහිප දෙනෙකුටම 'පුත්‍රයා' යන මෙම ආමන්ත්‍රණය දෙවියන්වහන්සේ භාවිතා කරනු දැකිය හැකිය.**

මේ අනුව එසේ දෙවියන්වහන්සේ විසින් 'පුත්‍රයා' යනුවෙන් අමතනු ලබන සියල්ලන්වම දේව කුමාරයන් ලෙසින්ම පිළිගැනීම කිතුනුවන්ගේ අවංක ස්ථාවරය විය යුතුයි.

දැන් අප දෙවියන්වහන්සේ 'පුත්‍රයා' යැයි බයිබලයේ අමතන පුද්ගලයන් ගැන බලමු.

## ඉශ්රායෙල් දේව කුමාරයෙකු ලෙසින්

**'ඉශ්රායේල් ජනතාව මාගේ කුළුඳුල් පුත්‍ර රත්නය ය. එබැවින් මට පූජා ඔප්පු කරනු පිණිස මාගේ පුතුට යන්න අවසර දෙන්නට මම ඔබට කියමි. එහෙත් ඔබ ඔවුන්ට යන්නට අවසර නොදෙන්නෙහි නම් මෙන්න මම ඔබේ කුළුඳුල් පුත්‍රයා මරා දමන්නට යමි' යි කියන්නැ'යි වදළ සේක** නික්මයාම 4:22 23

**'මම ඉශ්රායේල්ගේ පියා වෙමි. එප්‍රායිම් මාගේ කුළුඳුල් පුත්‍රයා වන්නේ ය'** -ජෙරමියා 31:9

මෙහි දෙවනුවට ඇති වැකිය පෙර වැකියටත් වඩා පැහැදිලි අරුතක් දෙයි. තවද පෙර වැකියේ ජේසුස් තුමන් ගැන දෙවියන්වහන්සේ විසින්ම එලෙසින් ප්‍රකාශ කළ බවක් සඳහන් වී නැත. එහි සඳහන් වන්නේ යම් අද්භූත ශබ්දයක එසේ පවසන බවයි. එය දෙවියන්වහන්සේ ගේ හඬක් නොව යක්ෂයාගේ හඬක්ද විය හැකිය.

ඇයිද යත් යක්ෂයා විසින් ජේසු තුමන් පරීක්ෂණයට ලක් කළ බවක් බයිබලයේම (මැතිව් 4: 9, 10 හි සඳහන් වෙයි) නමුත් ඉශ්‍රායේල් පිළිබඳ සඳහන් කරන දෙවන වැකියේ දෙවියන්වහන්සේම මෙසේ පවසන බව ඉතා පැහැදිලිවම සඳහන් වී ඇත. ඒ අනුව බලන කල ජේසුස් තුමන්ට වඩා දෙවියන්වහන්සේගේ කුමරු ලෙසින් බුහුමන් ලැබීමට සුදුස්සා වන්නේ ඉශ්‍රායේල්ය.

එසේ නමුත් අවිනිශ්චිත ප්‍රකාශයක් අනුව ජේසුස් තුමන් දෙවියන්වහන්සේගේ පුත්‍රයා යැයි තර්ක කරන කිතුනුවන් මෙම පැහැදිලි ප්‍රකාශය අනුව ඉශ්‍රායේල් දෙවියන්වහන්සේගේ පුතුන් යැයි පිළිගැනීම ප්‍රතික්ෂේප කරති.

මෙසේ දෙවියන්වහන්සේ විසින් ශුද්ධ බයිබලයේ 'පුත්‍රයා' යැයි ආමන්ත්‍රණය කරනු පුද්ගලයන් තවත් කිහිප දෙනෙකුම සිටිති.

## දාවිත් දේව කුමාරයෙකු ලෙසින්

**'නුඹ මාගේ පුත් කුමරුය. අද මම ඔබේ පිය රජු වූයෙමි'** (ගීතාවලිය 2:7)

**'මම ඔහුට පියෙක් වන්නෙමි. ඔහුද මට පුත්‍රයෙක් වන්නේ ය'** (1 වංශාවලිය 17:13)

## සොලමන් දේව කුමාරයෙකු ලෙසින්

'ඔහු මාගේ නාමයට මාළිගාවක් ගොඩනගනු ඇත. ඔහු මට පුත්‍රයෙක් වන්නේ ය. මම ඔහුට පියෙක් වන්නෙමි' (1 වංශාවලිය 22:10)

## ආබ්‍රහම් දේව කුමාරයෙකු ලෙසින්

'මම ඉශ්රායේල්ගේ පියා වෙමි. එප්‍රායීම් මාගේ කුළුඳුල් පුත්‍රයා වන්නේය' (ජෙරමියා 31:9)

## සාමුවෙල් දේව කුමාරයෙකු ලෙසින්

'මම ඔහුට පියෙක් වන්නෙමි. ඔහු මට පුත්‍රයෙක් වන්නේ ය' (2 සාමුවෙල් 7:14)

ජේසුස් තුමන් හැර අන් අයවද දෙවියන්වහන්සේ 'පුත්‍රයා' යැයි අමතා තිබියදීත් කිතුනුවන් ඒ කිසිවෙකු දේවත්වයෙන් නොපුද, ජේසු තුමන් පමණක් ඒ සඳහා වෙන් කර ගනිති මේ ඇයි? එක් අතකින් බලන කල මෙය ශුද්ධ බයිබලයේ 'උපදෙස්වලටම' පටහැනි නොවන්නේද?

## සියළුම මිනිස් දරුවන් දේව කුමාරයන් ලෙසින්

'ඔබ දෙවි සමිඳුනන්ගේ දරුවෝය' (ද්විතීය නීති සංග්‍රහය 14:1)

එතුමාණෝ අනාථයන්ගේ පියාණෝද (වන සේක) (ගීතාවලිය 68:5)

අතරමංවූ දරුවන්ට දෙවියන්වහන්සේ පියෙකු වැනිය යැයි බයිබලයේ පවසා ඇති නමුත් කිතුනුවන් එසේ අතරමංවී අනාථ කඳවුරුවල සිටින්නන් හා අනාථ නිවාසවල සිටින්නන් දෙවියන්වහන්සේගේ පුත්‍රයන් යයි අමතා ඔවුන්ගෙන් 'අපට නිසි මඟ පෙන්වන්නැ' යි යාඥා නොකරන්නේ මන්ද?

ඒ ඇයිද යත් 'පුත්‍රයා' යන ආමන්ත්‍රණය තමා වැදූ පුතුන්ට යොදන අදහසින් මෙවන් අවස්ථාවල බයිබලයේ දෙවියන්වහන්සේ විසින් භාවිතා කර නොමැත යන සාමාන්‍ය සත්‍යය ඔවුන්ට පවා වැටහෙන හෙයිනි. මෙම යෙදුම්වලින් අදහස් වන්නේ 'මාගේ ගැත්තනි, මාගේ වහළුනි, මාගේ ජනයිනි' වැනි වූ ආමන්ත්‍රණයන් පමණකි එය හැරෙන්නට කිතුනුවන් විසින් ජේසුස් තුමන් වෙනුවෙන් පමණක් 'පුත්‍රයා' යන වචනයෙන් දීමට තැත් කරන අරුත බයිබලයෙන් අදහස් කරන ලද්දක් නොවන බව මෙයින් පැහැදිලි වේ.

## ජේසුස් තුමන්ගේ ප්‍රකාශය

කිතුනුවන් විසින් දේව පුත්‍රයෙකු යැයි විශ්වාස කරනු ලබන ජේසුස් තුමන් තෙමේම යහපත් මිනිසුන් එම පදයෙන්ම ආමන්ත්‍රණය කරනු බයිබලයේම දැකිය හැක.

'ඔබ මිනිසුන්ට ඔවුන්ගේ වරද කමා කරන්නහු නම් ඔබේ ස්වර්ගීය පියාණන් වහන්සේ ඔබටත් කමා කරන සේක'. (මතෙව් 6:14)

සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝය. මන්ද ඔවුන් දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යැයි කියනු ලබනු ඇත. (මතෙව් 5:9)

මෙසේ ඔබ ස්වර්ගයේ සිටින ඔබගේ පියාගේ පුත්‍රයින් වනු ඇත. (මතෙව් 5:45)

ස්වර්ගයේ සිටින පියාණන් වහන්සේ තමන් වහන්සේගෙන් ඉල්ලන්නන්ට ඊට වඩා කොපමණ යහපත් දෑ දෙන සේක්ද? (මතෙව් 7:11)

මිහිපිට කිසිවෙකුට හෝ 'පියාණෙනි'යි නොකියන්න. මන්ද ඔබට සිටින්නේ එකම පියාණන් කෙනකු පමණී. උන් වහන්සේ ස්වර්ගයේ වැඩ වසන සේක. (මතෙව් 23:9)

එසේ වුවත් එතුමාණන් පිළිගත් සියල්ලනට එතුමාණන්ගේ නාමය අදහා ගත් අයට එතුමාණෝ දේව දරුකමේ වරම දුන් සේක. (යොහන් 1:12)

'එවිට ඔබේ ඉෂ්ට විපාකය අනර්ඝ වනු ඇත. ඔබ මහෝත්තමයාණන්ගේ පුත්‍රයින් වනු ඇත'. (ලූක් 6:35)

## පාවුල්ගේ ප්‍රකාශය

අප දෙවියන් වහන්සේගේ දරුවන් බැවින් දෙවියන් වනාහී මිනිස් කලාශිල්පයෙන් හා දක්ෂකමින් හා කැටයම් කළ රිදියට වත් ගලට වත් සමාන යයි නොසිතිය යුතුය. (ක්‍රියා 17:29)

මෙසේ ශුද්ධාත්මයාණෝ අපගේම ආත්මය හා එක්ව අප දේව දරුවන් බවට සාක්ෂි දරන සේක. (රෝම හසුන 8:16)

'මම ඔබට පියෙක් වන්නම්. ඔබ මාගේ දූ පුත්තු වෙති'යි සියලු බලැති සමිඳුණෝ වදරන සේක. (දෙවැනි කෝරින්ති 6:18)

මෙතෙක් අප ඉදිරිපත් කළ බයිබල් වැකි අනුව පහත සඳහන් කරුණු කිසිදු සැකයකින් තොරව සනාථ වේ:

- ❖ ජේසුස් තුමන් විෂයයෙහි සඳහන් වනවාටත් වඩා පැහැදිලිව දෙවියන්වහන්සේ අන් දේව පණිවිඩකරුවන්ව 'පුත්‍රයන්' යැයි ආමන්ත්‍රණය කරයි
- ❖ යහපත් මිනිසුන්ද මෙලෙසින් ආමන්ත්‍රණය කරනු ලබති
- ❖ දෙවියන්වහන්සේ සියළුම මනුෂ්‍ය වර්ගයා සිය 'පුත්‍රයන්' යැයි පවසති
- ❖ ජේසුස් තුමන්ගේ ප්‍රකාශයන්ද එය තහවුරු කරයි
- ❖ දැනට ක්‍රිස්තියානි ආගම වශයෙන් ලොව පවතින ලබ්ධිය ස්ථාපිත කළ පෘවුල් තුමන්ද මෙය පිළිගනිති

'පුත්‍රයා' යන වචනය දෙවියන්වහන්සේ විසින් යොදනු ලබන්නේ වැදූ පුතුන් විෂයයෙහි නම් ලොව සිටින සියළුම මනුෂ්‍යයන් දෙවියන්වහන්සේගේ පුතුන්ම යනුවෙන් කිතුනුවන් පිළි ගත යුතුය. එසේ ඔවුන් පිළි නොගන්නේ නම් බයිබලයේ 'පුත්‍රයා' යනුවෙන් ආමන්ත්‍රණය කරනු ලබන කිසිවෙකු -ජේසුස් තුමන් ද ඇතුලත්ව- දෙවියන්වහන්සේ වැදූ පුතුන් නොවන බව හෝ ඔවුන් පිළිගත යුතුය.

## දේව කුමාරයා යන්නෙහි විග්‍රහය

බයිබලයේ ජේසුස් තුමන් දේව කුමාරයා යැයි අමතනු ලබති. එලෙසින්ම දෙවියන්වහන්සේගේ පණිවිඩකරුවන් කිහිප දෙනෙකුම මෙසේ අමතනු ලබති. මෙම ආමන්ත්‍රණයන් අප කෙසේ විග්‍රහ කළ යුතුද? මේ සඳහා අපගේ සිතට වහල් වෙමින් හා අපගේ තර්ක විතර්කවලට අවශ්‍ය පරිදි විග්‍රහ ඉදිරිපත් නොකර බයිබලයේ ආලෝකයෙන්ම මේ සඳහා පැහැදිලි කිරීමක් ලැබීමට වෑයම් කිරීම සාධාරණ හා නිවැරදි වනු ඇත.

'දේව කුමාරයා' යන ඇමතුමෙන් අදහස් කරනු ලබන්නේ දෙවියන්වහන්සේට උපන් පුත්‍රයෙකු යනුද නැත්නම් එය දෙවියන්වහන්සේගේ අණසක පිලිපදිමින් ලොව ජීවත් වන යහපත් ගැත්තන් ප්‍රශංසා මුඛයෙන් අමතනු පිණිස දෙවියන්වහන්සේ විසින් යොදු ගත් වචනයක්ද?

මෙය නිසි පරිදි වටහා ගැනීමෙන් මෙම ගැටළුව නිරාකරණය කර ගත හැක. මෙම පදයට දෙවියන්වහන්සේගේ ශාරීරික දරුවෙකු යන අරුත තිබිය නොහැකිය. ඇයිද යත් කිතුනුවන්ම මෙම වචනයට අන් අය වෙනුවෙන් ප්‍රතිචාර දක්වන්නේ මෙලෙසිනි. බයිබලයේ මෙසේ සඳහන් වෙයි:

> **මිහිපිට කිසිවෙකුට හෝ 'පියාණනි'යි නොකියන්න. මන්ද ඔබට සිටින්නේ එකම පියාණන් කෙනකු පමණි. උන් වහන්සේ ස්වර්ගයේ වැඩ වසන සේක.** (මතෙව් 23:9)

මෙම වැකියේ ඇත්තේ නිර්දේශයක් හෙවත් ආඥාවකි. ඒ අනුව ලොව සිටින කිසිවෙකු තවත් කෙනෙකුට 'පියාණෙනි' යැයි ආමන්ත්‍රණය නොකළ යුතුය යැයි බයිබලය අණ කරයි. නමුත් ලොව සිටින සියල්ලන්ටම පියවරු සිටිති. කිතුනුවන්ටද එසේමය. ඔවුන් සිය පියවරුන් අමතන්නේ 'පියා' යන වචනයෙනි. එවිට ඔවුන් බයිබලයේ ආඥාවකට පිටු පාන්නෝ වෙත්ද?

කිසිසේත් නැත යනු කාගේත් පිළිතුර වනු ඇත. එයින් ගම්‍ය වන්නේ බයිබලයේ ඇති මෙම ආඥාව වචනාර්ථයෙන්ම ගැනීම ප්‍රායෝගික නැත යන්නයි. සර්වබලධාරී දෙවියන්වහන්සේ අපගෙන් අපේක්ෂා කළේද එවැන්නක් නොවේ. එනම් 'පියාණෙනි' යන ඇමතුමට අරුත් දෙකක් ඇත. එසේ පිළි නොගන්නා කිතුනුවා බයිබලයේ ආඥාවකට තමා පිටුපාන බව පිළි නොගෙන එසේ කළ නොහැක.

ඒ අනුව 'පියාණන්' යනු අප මැවීමෙන් ජීවය දුන් දෙවියන්වහන්සේවද, එමෙන්ම අපට ලෞකික වශයෙන් ජීවය දුන් භෞතික පියාද අදහස් කිරීම සඳහා උපයෝගී කරනා වචනයකි. එසේ එය භාවිතා වන අවස්ථා වෙන් වශයෙන් හඳුනා ගැනීම කිසි සේත් අපහසු නොවන ඉතා පහසු කරුණකි.

කිතුනුවන් ඕනෑකමින්ම වරදවා ගෙන ඇත්තේ මෙම සරල කරුණයි.

පෙරකී බයිබල් වැකිය 'ලොව සිටින කිසිවෙකුට දෙවියන්වහන්සේ යැයි නොඅමතන්න. නුඹලාගේ දෙවියන්වහන්සේ ස්වර්ගයේ සිටින්නාය' යැයි කියා බැලුවහොත් මෙම වැකියේ නියම අරුත පහසුවෙන් වටහා ගත හැකි වනු ඇත.

ඒ වෙනුවට එය 'ලොව සිටින කිසිවෙකුට 'පියාණෙනි' යැයි නොඅමතන්න. නුඹලාගේ පියාණන් ස්වර්ගයේ සිටින්නාය' ලෙසින් එය වචනාර්ථයෙන්ම ගත් කල එය අනර්ථයක් වන අතර එය ප්‍රායෝගිකද නොවන්නේය.

පාසැලකට සිය දරුවෙකු ඇතුල් කරන විට, රජයේ විවිධ ඉල්ලුම්පත්වල, ඡන්ද දයකයන්ගේ නාම ලේඛනයේ, ගමන් බලපත්‍රයේ, උප්පැන්න හා විවාහ සහතික වැනි ලියවිලිවල 'පියාගේ නම' යැයි අසා තිබෙන තීරයේ කිතුනුවන් ලියන්නේ 'ස්වර්ගයේ සිටින මාගේ පියාණන්' යනුවෙන්ද? නැතිනම් ලෝකයේ සිටි හෝ සිටින ඔවුනොවුන්ගේ සත්‍ය පියවරුන්ගේ නමද? එසේ කිරීමෙන් ඔවුන් බයිබල් ආඥාවක් පිටුපාන බවක් අදහස් වෙයිද? එසේ බලන කල මෙම බයිබල් ආඥාවට පිටු නොපා මෙලොව කටයුතු බෙහෝමයක් කිතුනුවන්ට නිසි පරිදි කර ගැනීමට නොහැකි වනවා නොවේද?

නමුත් 'කියන කොට එහෙම වුනාට කරන කොට මෙසේ' විය යුතුමය. එහි කිසි වරදක් නැත. මන්ද යත් බයිබලයෙහි සඳහන් එම දෙසුම වචනාර්ථයෙන් කරන ලද්දක් නොවන බව සාමාන්‍ය ඥාණයක් ඇති ඕනෑම කෙනෙකුට වැටහෙනු ඇත. බයිබලයේ 'පියාණන්' යන වචනයට නියම අරුත වන්නේ 'මැවුම්කරු' හෙවත් 'සර්වබලධාරී

දෙවියන්වහන්සේ' යැයි මෙයින් මනාව පැහැදිලි වේ. එසේ නම් 'පියාණන්' යන එම වචනය සමඟ සැසඳෙන 'පුත්‍රයා' යන වචනය වෙනුවට යෙදිය යුත්තේ 'මවනු ලැබුවා' වැනි වචනයක් පමණි.

මෙම සාමාන්‍ය ව්‍යාකරණය වටහා ගත්විට කිතුනුවන් කිසි විටෙක ජේසුස් තුමන් දෙවියන්වහන්සේ ගේ පුත්‍රයා යැයි නොකියනු ඇත.

දෙවියන්වහන්සේගේ පුත්‍රයා යැයි ජේසුස් තුමන් අමතනු ලබන නිසා ඔහුද දේවත්වයෙන් පිදිය යුතු යැයි කිතුනුවන්ගේ ස්ථාවරය කෙතරම් වැරදි සහගත දැයි බයිබලයම පවසන සැටි බලන්න:

# බයිබලයේ ප්‍රකාශය

## දෙවියන්වහන්සේ එකම දෙවියාය

**මා හැර අන් දෙවි කෙනෙකු නුඹට නොසිටිය යුතුය** (නික්මයාම 20:3)

**මේ දේ පමණක් පෙන්වන ලද්දේ සමිඳාණන් වහන්සේ වන දෙවියන් වහන්සේ බවත් උන් වහන්සේ හැර අන් දෙවි කෙනෙකු නැති බවත් ඔබ දැන ගන්නා පිණිසය** (ද්විතීය කථාව 4:35)

**ඉශ්රායේල්වරුනි! සවන් දෙන්න. අපේ සමිඳාණන් වහන්සේ වන දෙවියන් වහන්සේ අසහාය සමිඳාණන් වහන්සේ ය. දෙවි සමිඳාණන් වහන්සේට ඔබේ මුළු සිතින් ද ඔබේ මුළු වීර්යයෙන් ද ප්‍රේම කළ යුතුය. අද දින මා ඔබට දෙන මෙම අණ පණත් සිතේ ධාරණය කර ගන්න.** (ද්විතීය කථාව 6:4 6)

**මා පමණක් දෙවිඳාණන් බව මා හා සමාන අන් කිසිවෙකු නැති බව පිළිගන්න.** (යෙසායා 46:9)

'මමත් දෙවිකෙනෙක් වෙමි' යැයි දෙවියන්වහන්සේ පවසා තිබුනහොත් ජේසුස් තුමන්ව දෙවිකෙනෙක් යැයි කිතුනුවන් විශ්වාස කිරීමට යම් පදනමක් ඇත. නමුත් 'දෙවියන්වහන්සේ මා වෙමි, මා පමණක්ම වෙමි' යන අරුතින් බයිබල් වැකි තිබෙන නිසා එකම දෙවියන්වහන්සේ හැර අන් කිසිවෙකු දෙවියෙකු විය නොහැකිය යන කරුණ ඉතා පැහැදිලි වෙයි.

'මට සමානයෙක් නැත' යන වැකිය මෙය තවත් තහවුරු කරයි.

කරුණු මෙසේ තිබියදී 'දේව පුත්‍රයා' යන වචනවලට ප්‍රතිවිරුද්ධ අරුත් දෙමින්

දෙවියන්වහන්සේගේ මෙවන් ප්‍රකාශවලට පටහැනිව ක්‍රියා කිරීම පිළිබඳ කිතුනුවන් දෙවරක් නොසිතන්නේ මන්ද?

**අජරාමර ජීවනය වන්නේ මෙයයි: එනම් දෙවියන්වහන්සේ වන ඔබ හා ඔබ එවූ තැනැත්තාණන් වන ජේසු ක්‍රිස්තුස් ඔවුන් විසින් හඳුනා ගනු ලැබීමයි. ඉටු කරනු පිණිස ඔබ මට පැවරූ වැඩ කොටස සම්පූර්ණ කරමින් මම මිහිපිට ඔබ තේජෝමහිමයට පැමිණවීමි.** (යොහන් 17:3 4)

ඉහත සඳහන් වන්නේ ජේසුස් තුමන් විසින් කළ ප්‍රකාශයකි. මෙය කිතුනුවන් විසින් දෙවියන්වහන්සේ යැයි සලකනු ලබන ජේසුස් තුමන්ගේ ප්‍රකාශයයි. තමා දෙවිකෙනෙකු නොවේ යනුවෙන් ජේසුස් තුමන් ඉදිරිපත් කරන පැහැදිලිම පාපොච්චාරණයකි මෙය.

- 'සත්‍ය වූ එකම දෙවියන්' යැයි දෙවියන්වහන්සේ ගැන සඳහන් කිරීමෙන් 'තමා දෙවියෙකු වන්නේ නැත' යැයි එතුමන් තහවුරු කරති
- 'ඔබ එවූ ජේසුස්' යැයි මෙහි සඳහන් කිරීමෙන් තමා දෙවියන්වහන්සේ විසින් එවනු ලැබූ දූතයෙක් යැයි ජේසුස් තුමන් තහවුරු කරති
- 'මට ඉටු කරන්නට ඔබ නියම කළ සේවය මා අවසන් කර....' යැයි කීමෙන් තමා එම එකම දෙවියන්වහන්සේ විසින් අණ කරන්නක් ඉටු කරන සුවච සේවයෙකු පමණක් යැයි ජේසුස් තුමන් තහවුරු කරති
- 'සේවය අවසන් කර' ඇත යනුවෙන් පැවසීමෙන් තමාට පවරන ලද කාර්යභාරය තමා නිම කර ඇති බැවින් තමන්ගෙන් උපකාර පැතීම නිෂ්ඵල දෙයක් යැයි ජේසුස් තුමන් හඟවති

මෙසේ තමා දෙවියන්වහන්සේ විසින් එවනු ලැබුවෙකු මිස දේවත්වයෙන් පිදිය යුතු දෙවිකෙනෙකු නොවේ යැයිද,

දෙවියන්වහන්සේ එකම හා සමානයෙක් නොමැති සර්වබලධාරියෙකු යැයිද,

තමා පැමිණි කටයුත්ත තමා නිම කර ඇති බවද විවිධ ආකාරයෙන් නැවත නැවතත් ජේසුස් තුමන් ප්‍රකාශ කරන විටත් ඒ සියල්ල ඉවත ලා එතුමන් කරන්නට නොකී බරපතල වරදක් හෙවත් දෙවියන්වහන්සේට සමානයෙක් ඇති කිරීමේ වරද සත්‍ය පණිවිඩකරුවෙක්ව පැමිණි ජේසුස් තුමන් විසින්ම කරන ලද්දේ යැයි එතුමන්ටම වරද පැටවීම කෙතරම් දරුණු ක්‍රියාවක්දැයි කිතුනුවන් මඳක් නොසිතන්නේ ඇයිද?

## පළමු ආඥාව

**ගුරුතුමනි, දහම් නීතියෙහි ශ්‍රේෂ්ඨතම ආඥාව කවරෙකදැයි ඇසීය.**

**ජේසුස් වහන්සේ පිළිතුරු දෙන සේක්, 'ඔබේ මුළු හෘදයෙන්ද ඔබේ මුළු ජීවයෙන්ද, ඔබේ මුළු බුද්ධියෙන්ද, ඔබේ දෙවියන් වහන්සේ වූ ස්වාමින්වහන්සේට ප්‍රේම කරනු. එයයි මූලිකවූත් ශ්‍රේෂ්ඨ වූත් ආඥාව.** (මතෙව් 22: 36 38)

නිර්දේශය මෙසේ තිබියදී හදවතින් ආත්මයෙන් හා සිතෙන් අඩක් බැගින් ජේසුස් තුමන්ට දීම පළමු ආඥාව ප්‍රතික්ෂේප කරනවා වැනිය.

ජේසුස් තුමන් දේව පුත්‍රයෙකු යැයි කිතුනුවන්ගේ විශ්වාසය ජේසුස් තුමන් අනුමත කරන්නේ නම් එතුමන් මෙවැන්නක් පවසනු ඇතිද?

## එම දිනය කුමරුද නොදනිති

පහත බයිබල් වැකියෙහි ජේසුස් තුමන් මෙසේ පවසති:

**'ඒ දවස ගැනවත් ඒ පැය ගැනවත් කිසිවෙක් හෝ නොදනිති. ස්වර්ගයේ දේව දූතයෝ පවා නොදනිති. පුත්‍රයාණන්වත් නො දනිති. පියාණන්වහන්සේ පමණක් එය දන්නා සේක'** (මාර්ක් 13:32)

ජේසුස් තුමන් දේව කුමාරයෙකු හෙවත් කිතුනුවන්ගේ විශ්වාසය පරිදි දෙවියන්වහන්සේ නම්, එම දිනය හා හෝරාව එතුමන් නොදැන සිටිත්ද? දෙවියන්වහන්සේ නොදන්නා දෙයක් ලොව තිබිය හැකිද? කිතුනු සහෝදරවරුනි, මඳකට සිතා බලන්න.

## දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ තමන්ට කිසිදු බලයක් නැත

**'ඔබට අවශ්‍ය මොනවාද?' යි එතුමාණෝ ඇසූ සේක. ඔබගේ රාජ්‍යයේදී මාගේ පුතුන් දෙදෙනාගෙන් කෙනෙකු ඔබගේ දකුණු පසෙහිද කෙනෙකු ඔබගේ වම්පසෙහිද හිඳගන්නට ඔවුනට වර දුන මැනවි'** (මතෙව් 20:21)

මෙම ඉල්ලීමට ජේසුස් තුමන්ගේ පිළිතුර කුමක් වූයේද? එය මෙලෙසින් විය:

**එවිට ජේසු වහන්සේ ඔවුන් අමතමින්, 'සැබවින්ම ඔබ මාගේ කුසලානෙන් පානය කරනු ඇත. එහෙත් මාගේ දකුණු පස හෝ මාගේ වම් පස හෝ හිඳ ගැනීමට වර දීම මා සතු වූවක් නොවේ. මාගේ පියාණන් වහන්සේ කවරකු සඳහා ඒවා පිළියෙල කරන ලද සේක්ද, ඒවා අයිති ඔවුන්ටයැ' යි පැවසූ සේක.** (මතෙව් 20:23)

අවසාන දිනයේ ලෝ වැසියන් එක් රැස්ව සිටින විට, ඔවුන්ට සුදුසු පරිදි ස්වර්ගය ප්‍රධානය කිරීම හෝ නිරය නියම කිරීම සර්වබලධාරී දෙවියන්වහන්සේගේ ස්වෛරී

බලයෙන් සිදු කරනු ලබන්නකි. එවැන්නක් තබා, ස්වර්ගයේ තමාගේ දෙපසින් සිටින්නේ කවුරුන්ද යන කරුණ පවා තීන්දු කර ගැනීමට තමාට බලය නැත යැයිද, එය කළ හැක්කේ දෙවියන්වහන්සේට පමණක් බවද ජේසුස් තුමන් මෙහිදී ඉතා පැහැදිලිවම ප්‍රකාශ කර තිබීම තම මුලාවෙන් ගැලවීමට කිතුනුවන්ට ප්‍රමාණවත් නොවීම ඔවුන්ගේම අවාසනාවකි.

දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ මෙවැන්නක් සඳහා හෝ තමාට බලය නැත යැයි ජේසුස් තුමන් විසින්ම පැහැදිලිවම ප්‍රකාශ කර තිබියදී සිය පාපයන් සමා කර තමන් ගලවා ගන්නා මෙන් කිතුනුවන් ජේසුස් තුමන්ට යාඥා කිරීම කෙතරම් අනුවණ ක්‍රියාවක්ද?

## දෙවියන්වහන්සේ අමරණීය, අදෘශ්‍යමානය

**අජරාමර වූද අදෘශ්‍යමාන වූද එකම දෙවිඳුණන්වූද සදතනික රාජෝත්මයාණන්ට සදතනයෙන් සදතනයට ගෞරවමහිම වේවා! තේජෝමහිම වේවා! ආමේන්.** (1 තිමති 1:17)

දෙවියන්වහන්සේගේ සුවිශේෂ ලක්ෂණයන් දෙකක් ලෙසින් බයිබලය සඳහන් කරන්නේ ඔහු 'අමරණීයය හා අදෘශ්‍යමානය' යන ලක්ෂණයි. මෙය ජේසුස් තුමන් විෂයයෙහි ගැලපෙන්නේදැයි කිතුනු සහෝදරවරුන්ගෙන් අසනු කැමැත්තෙමු.

## ජේසුස් තුමන් ග්‍රහණය කර නොගන්න

**ජේසුස් වහන්සේ ඇයට කථා කොට 'මා තවමත් පියාණන්වහන්සේ වෙත නො නැංග නිසා මට අත නොතබන්න. එනමුත් මගේ සොහොයුරන් වෙත ගොස් මම මගේ පියාණන් හා ඔබේ පියාණන්ද මගේ දෙවියන්වහන්සේ හා ඔබේ දෙවියන්වහන්සේද වෙත නැගෙන්නෙමියි ඔවුන්ට දන්වන්නැ'යි පැවසූ සේක.** (යොහන් 20:17)

ජේසුස් තුමන් ග්‍රහණය කිරීම මගින් නිත්‍ය ජීවය ලැබිය නොහැකි බව ජේසුස් තුමන් පවසන මෙම වැකිවලින් සනාථ වේ. එපමණක් නොව පියාණන් යන වචනයටද මෙම වැකි පෙල පැහැදිලි විග්‍රහයක් දෙයි.

## ජේසුස් තුමන් මනුෂ්‍ය පුත්‍රයෙක්

'දේව පුත්‍රයා' යැයි බයිබලයේ සඳහන් ආමන්ත්‍රණය වැරදි බවට මෙතරම් පැහැදිලි කිරීම් තිබෙන අතරම එය පිළි නොගෙන දේවත්වයෙන්ම එතුමන් පුදන්නට මුරණ්ඩු කරන කිතුනුවන් ජේසුස් තුමන් විසින්ම තමා සාමාන්‍ය මනුෂ්‍ය පුත්‍රයෙකු යැයි බයිබලයේ කිහිප තැනකම කර ඇති සඳහන් ගැන කුමක් කියන්නේද?

ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් 'සිවලුන්ට ගුහාත් අහස් පක්ෂීන්ට කැදලිත් තිබේ. එහෙත් හිස තැබීමට හෝ තැනක් මනුෂ්‍ය-පුත්‍රයාණන්ට නැතැ' යි කී සේක. (මතෙව් 8:20)

'කෙසේ වුවත් පොළොවේ පාප සමා කරන්නට මනුෂ්‍ය පුත්‍රයාණන්ට බලය ඇති බව ඔබ දැනගත යුතුව ඇතැ' යි පවසා, ඉන්පසු අංශභාග රෝගියා වෙත හැරී 'නැගිටින්න ඔබේ සයනය ගෙන ගෙදර යන්නැ'යි පැවසූ සේක. (මතෙව් 9:6)

ඒ දුටු ජන සමූහයා ගරු සරු බියෙන් පිරී එවන් බලයක් මිනිසුනට දුන් දෙවියන් වහන්සේට ප්‍රශංසා කළහ (මතෙව් 9:8)

ජේසුස් වහන්සේ පිලිප්පී කායිසාරී පෙදෙසට පැමිණි කල 'මනුෂ්‍ය පුත්‍රයාණන් කවරෙක්ය කියා ජනයා කියත්ද?' යි තම ගෝලයින්ගෙන් ඇසූ සේක. (මතෙව් 16:13)

මන්ද මනුෂ්‍ය පුත්‍රයාණෝ ස්වකීය දූතයින් සමගින් ස්වකීය පියාණන්ගේ තේජෝමහිමයෙන් යුතුව වඩිනා සේක. ඉන්පසු එතුමාණෝ එක් එක් පුද්ගලයාට ඒ ඒ අය කළ දේ අනුව එල-විපාක දෙන සේක. (මතෙව් 16:27)

ජේසුස් වහන්සේ සෙසු ගෝලයන් සමගින් ගලීලියේදී යළි එක්වූ කල ඔවුන් ඇමැතූ එතුමානෝ, 'මනුෂ්‍ය පුත්‍රයාණන් මිනිසුන්ගේ අත්වලට පාවාදෙනු ඇත. (මතෙව් 17:22)

එහෙත් මා ඔබට කියන්නේ එලියා දැනටමත් පැමිණ ඇති වගයි. ඔහු හැඳිනගැනීමට අපොහොසත් වූ ඔවුහු තමන් රිසි පරිදි ඔහුට හිංසා කළහ. මනුෂ්‍ය පුත්‍රයාණන්ද එලෙසම ඔවුන් අතින් වධ හිංසා විඳිනු ඇතැ'යි කීසේක. (මතෙව් 17:12)

ඔහු කන්දෙන් බැස එද්දී ජේසුස් වහන්සේ ඔවුනට උපදෙස් දුන් සේක 'මනුෂ්‍ය පුත්‍රයාණන් මරණින් නැගිටවනු ලබන තෙක් ඒ ඔබ දුටු දෑ ගැන කිසිවකුටත් නො කියන්නැ' යි වදාළහ. (මතෙව් 17:9)

ජේසුස් වහන්සේ පිළිතුරු දෙන සේක්, 'සත්තකින්ම මම ඔබට කියන්නම්. සියල්ල අළුත් වූ කල්හි මනුෂ්‍ය-පුත්‍රයාණන් ස්වර්ගික තේජෝමහිමයෙන් යුතුව තම සිහසුනෙහි වැඩ හිඳින කල මා අනුව ආ ඔබත් ඉශ්‍රායේල් ගෝත්‍ර දොළොස විනිශ්චය කරමින් සිහසුන් දොළොසක් මත හිඳගනු ඇත'. (මතෙව් 19:28)

'අප යමින් සිටින්නේ යෙරුසෙලමටයි. එහිදී මනුෂ්‍ය-පුත්‍රයාණෝ නායක

**පූජකයන් හා දහම් පඬිවරුන් අතට පාවා දෙනු ලබන්නාහ. ඔවුහු එතුමාණන් මරණයට තීන්දු කරත.** (මතෙව් 20:18)

**මනුෂ්‍ය-පුත්‍රයාණන් සේවය ලබන්නට නොව සේවය කරන්නටත් බොහෝ දෙනෙකුට මිදීමේ මිළයක් වශයෙන් තම ජීවිතය දීමටත් පැමිණි ලෙසින්ම ඔබත් කළ යුතුයැ'යි පැවසූ සේක.** (මතෙව් 20:28)

**මන්ද පෙරදිගින් නැගෙන විදුලිය අසුරු සැනෙකින් බටහිරට විහිද යන්නේ යම් සේද මනුෂ්‍ය-පුත්‍රයාණන්ගේ පැමිණීමත් එසේම වන්නේය.** (මතෙව් 24:27)

**මනුෂ්‍ය-පුත්‍රයාණන් එතුමන් ගැන ලියැවී ඇති පරිද්දෙන්ම සිය ගමන යනු ඇත. එහෙත් මනුෂ්‍ය-පුත්‍රයාණන් පාවා දෙන මිනිසාට වන විපතක මහත ඒ මිනිසා නූපන්නා නම් එය ඔහුට වඩා යෙහෙකැ' යි පිළිතුරු දුන් සේක.** (මතෙව් 26:24)

**'ජේසුස් වහන්සේ එයට පිළිතුරු දෙමින් 'හරි එය ඔබ කී පරිදිමයි. එහෙත් මම ඔබට මෙසේ කියමි. මනුෂ්‍ය-පුත්‍රයාණන් පරාක්‍රමයාණන් වහන්සේගේ දකුණු පස අසුන්ගෙන සිටිනුත් අහසේ වළාකුළු මතින් ආපසු වඩිනුත් මතු කාලයේදී ඔබට දකින්න ලැබෙනු ඇතැ' යි පැවසූ සේක.** (මතෙව් 26:64)

**ඉන්පසු යළිත් තම ගෝලයන් වෙත පැමිණි එතුමාණෝ ඔවුන් අමතමින් 'හා ඔබ තවමත් නින්දේ? තවමත් විවේක ගනිමින්? හෝරාව ළං ලංව එයි. මනුෂ්‍ය පුත්‍රයාණන් පව්කරුවන්ගේ අත්වලට පාවා දෙනු ලබයි.** (මතෙව් 26:45)

ඉහත අවස්ථාවල ජේසුස් තුමන් තමන්ව 'මනුෂ්‍ය පුත්‍රයෙකු' යැයි හඳුන්වා දෙයි. එමෙන්ම අනෙක් සුභ අසුන්වලද කිහිප තැනකම මෙසේ තමන් මනුෂ්‍ය පුත්‍රයෙකු යැයි ජේසුස් තුමන් පවසනු දැකිය හැකිය. එපමණක් නොව ජේසුස් තුමන් 'දේව පුත්‍රයෙකු' යැයි සඳහන් වැකිවලට වඩා 'මනුෂ්‍ය පුත්‍රයෙකු' යැයි සඳහන් වැකිවල සංඛ්‍යාව අධිකය. ජේසුස් තුමන් දේවත්වය ලැබූ කෙනෙකු නම් මෙලෙසින් ශුද්ධ බයිබලයේම තමන් මනුෂ්‍ය ආත්මයක් ලද පුද්ගලයෙකු යැයි නැවත නැවතත් පවසන්නේ ඇයි?

අප විසින් මෙතෙක් ඉදිරිපත් කළ බයිබල් වැකිවලින් ජේසුස් තුමන් දෙවියන්වහන්සේට උපන් පුතෙකු නොවන බව හා එතුමන්ගේ උපතේ ආශ්චර්යය හැර එතුමන්ට දෙවියන්වහන්සේ විසින් දෙනු ලැබුවේ මරණයෙන් අවසන් වන ජීවිතයක් හා දෙවියන්වහන්සේ විසින් කියා දෙන්නට හැරුනු විට අන් කිසිවක් ගැන දැනුමක් නැති සීමිත ඥාණයක් බවත් මනාව ඔප්පු වේ. මේ සියළු වැකිවල අන්තර්ගතය

ප්‍රතික්ෂේප කිරීමෙන් තොරව ජේසුස් තුමන්ට දේවත්වයකින් පිදීම කළ නොහැකිය.

වෙනත් ලෙසකින් පවසනවා, නම් බයිබලයට පටහැනි වීමෙන් තොරව ජේසුස් තුමන්ට 'දෙවියන්වහන්සේ' යැයි කිව නොහැක.

එසේත් නොමැතිව 'දේව පුත්‍රයා' යනුවෙන් ජේසුස් තුමන් ඇමතීමෙන් අදහස් වන්නේ ඔහු දෙවියන්වහන්සේගේ ආඥාවන් නිසි අන්දමින් පිළිපැදි හා තමන්ට තම ස්වාමියා විසින් පවරන ලද කාර්යභාරය මැනවින් ඉටු කළ විශිෂ්ඨ පණිවිඩකරුවෙක්ය යැයි කිතුනුවන් පිළි ගන්නේ නම්, බයිබලයේ ප්‍රකාශයන් සියල්ලම නිසි ආකාරයෙන් අනුගමනය කළ විශ්වාසිකයින් බවට ඔවුන්ට පත්විය හැක.

මුරණ්ඩු සිතින් වැරදි මාර්ගයේම මරණය තෙක් රැඳී සිට නිත්‍ය අග්නිය ළඟා කර ගන්නවාද? නැතිනම් පැහැදිලිවම ප්‍රකාශයට පත්ව තිබෙන සත්‍යය පිළිගෙන ස්වර්ග රාජ්‍යයේ සදකල් සතුටින් ජීවත් වනවාද?

මෙම දෙකින් ඔවුන් තෝරා ගන්නේ කුමක්ද?

මින් පසුවත් ඔවුන් ජේසුස් තුමන් දේව කුමාරයෙකු යැයි පවසනවා නම් එයත් සමගම බයිබලයේ සඳහන් පරිදි දෙවියන්වහන්සේට අවනත වන සියළුම යහපත් ගැත්තන් දේව පුත්‍රයන් යැයි පිළිගත යුතුව තිබේ.

## 2. එකක්තුල එකක්නම් එහි අරුත දෙවියන් යනුවෙන්ද?

ජේසුස් තුමන් දෙවියන්වහන්සේගේ පුත්‍රයා යැයි තර්ක කිරීමට කිතුනුවන් ඉදිරිපත් කරන තවත් එක් සාධකයක් වෙත දැන් අප යොමු වෙමු.

**'මමත් පියාණන්වහන්සේත් එකයැ'යි වදාළ සේක** -යොහන් 10:30

මෙහි අරුත 'මා හා පියාණන් වෙන් වෙන් දෙදෙනෙකු නොවේ. අප දෙදෙන කෙනෙකු අනෙකා සමග සම්මිශ්‍ර වී එක් අයෙකු බවට පත්ව ඇත්තෙමු' යනුවෙන් වේ.

'දේව පුත්‍රයා' යන ආමන්ත්‍රණය වරදවා විග්‍රහ කර ඇත්තාක් මෙන් 'මා හා පියාණන් එකෙකි' යන වැකියටද කිතුනුවන් වැරදි අර්ථ කථනයක් දෙති.

**'මා පියාණන්වහන්සේ තුලත් ඔබ මා තුළත් මා ඔබ තුළත් යන අධ්‍යාත්මික සබඳතාවයකින් අප වෙළී සිටින බව ඒ දවසේදී ඔබ වටහා ගනු ඇත' - යොහන් 14:20**

'මා පියාණන් තුල වෙමි' යැයි ජේසුස් තුමන් පැවසූ වැකිය වැරදි අන්දමින් විග්‍රහ කරන කිතුනුවන්, පහත වැකියේ ප්‍රකාශයටද එලෙසින්ම අරුත් දීම ප්‍රතික්ෂේප කරන්නේ මන්ද? එතුමන් ජනයා අමතා 'මා ඔබ තුලද ඔබ මා තුලද සිටින්නෙහිය' යන ප්‍රකාශයට 'ජේසුස් තුමන් හා මිනිසුන් එකෙකි' යැයි කීමට ඉදිරිපත් වුවහොත් සියළුම මිනිසුන් දෙවියන් යැයි කීමේ ප්‍රයෝගික නොවන තත්ත්වයක් ඇති වනු ඇත. ජේසුස් තුමන් පිළිබඳ කිතුනුවන් ගේ ප්‍රකාශය මෙවන් පුදුම අරුතකට මග විවෘත කරනු ඇත.

**'එවුන සියල්ලන් ඒකත්වයක් වන පිණිස පියවූ ඔබ මා තුලෙහිද මා එබ තුලෙහිද සිටින්නාක් මෙන් ම ඔබ මා එවූ බව ලෝකයා විශ්වාස කරන පිණිසත් අප තුල ඔවුන් ඒකත්වයක් වන පිණිසත් යාච්ඤා කරමි'** (යොහන් 17:21)

නමුත් එසේ අරුත් කළ විට සියළුම මිනිස් වර්ගයා දෙවියන් වන අතර එවිට ජේසුස් තුමන්ට සුවිශේෂී තත්ත්වයක් නැති වනු ඇත. මෙය ප්‍රයෝගික තත්ත්වයක නොවේ. මේ අනුව පෙර සඳහන් 'මා හා පියාණන් එක්කෙනෙකි යන වැකියද විග්‍රහ කළ යුත්තේ වචනාර්ථයෙන්ම නොව එය නිදසුනක් ලෙස ගනිමිනි.

ඉතා සමීපව ඇසුරු කරන මිතුරන් දෙදෙනෙකුවද 'ඔවුන් දෙදෙනාම එකෙකි' යැයි පවසනු අප ලොව දකින්නෙමු. මෙය කිසිවෙකු වචනාර්ථයෙන්ම ගන්නේ නැත. බයිබලයේද මෙවන් නිදසුන් සහිත වැකි ඇති බව දැකිය හැකිය හැකිය.

උත්පත්ති 2:24 වැකියෙන්ද අදහස් වන්නේ එම සැමියා හා බිරිඳ එකම මස් වැදැල්ලක් වූ බවක් නොවේ යැයි කාහටත් වැටහේ. එය හැර බිරිඳ ආහාර අනුභව කිරීමෙන් සැමියාගේ කුස පිරෙන බවක් හෝ බිරිය ඉටු කරන එවැනි ශාරීරික අවශ්‍යතාවයක් නිසා සැමියාද එයින් නිදහස් වන බවක් මෙයින් අදහස් නොවේ. මෙයින් අදහස් කරනු ලබන්නේ ඔවුන් අතර ඇති සමීප සබඳතාවයයි. හෙවත් අන්‍යෝන්‍ය ප්‍රේමයයි.

**මිනිසෙක් තම පියා හා මවද අත්හැර සිය බිරිඳට බැඳෙන්නේ මේ නිසාය. මෙසේ ඔවුහු එකම මාංශයක් වෙති. ඔවුහු තවදුරටත් දෙදෙනෙකු නොව එක්කෙනෙක්ම වන්නෝය.** (මාර්ක් 10:7 8)

මෙම වැකියේද ජේසුස් තුමන් සම්බන්ධ වැකිවලට වඩා බලවත් ලෙසින් 'දෙදෙනෙකු නොව' යැයිද සඳහන් වේ. මෙම වැකියේ නිදර්ශනාත්මක අරුත කිතුනු ලොව වටහා ගන්නා සැටියෙන්ම ජේසුස් තුමන් පවසන පෙරකී වැකිවලද අරුත විග්‍රහ කළ යුතුව ඇත.

# 3. 'දෙවිවරුන්' යනු දෙවියන්වහන්සේ අදහස් කිරීමේ යෙදුමක්ද?

බයිබලයේ ඇතැම් තන්හි ජේසුස් තුමන්ව 'දෙවිවරුන්' යන යෙදුමෙන් ආමන්ත්‍රණය කරනු ලැබ ඇත. මෙහි අරුත දෙවියන්වහන්සේ වන නිසා ජේසුස් තුමන් දෙවියන්වහන්සේම යැයි කිතුනුවන් තර්ක කරති.

නමුත් මෙම තර්කයද ඔවුන්ගේ මතය ඔප්පු කිරීමට ඔවුන්ට පිහිට වන්නේ නැත. ඇයිද යත් බයිබලයේම මෙය ප්‍රතික්ෂේප වන වැකි පෙලක් ඇත.

**ජේසුස් වහන්සේ ඔවුන්ට උත්තර දෙමින් 'පියාණන්වහන්සේගෙන් බොහෝ යහපත් ක්‍රියා නුඹලාට දැක්වීමි. එයින් කොයි ක්‍රියාව නිසා මට ගල් ගසන්නහුද?' යි ඇසූ සේක යුදෙව්වරු උන්වහන්සේට උත්තර දෙමින් 'අප නුඹට ගල් ගසන්නේ යහපත් ක්‍රියාවක් නිසා නොව දේව අපහාසය නිසාය. මනුෂ්‍යයෙක් වූ නුඹ දෙවියන් වහන්සේ වෙන්ට හදන නිසාය' ජේසුස් වහන්සේ ඔවුන්ට උත්තර දෙමින් 'නුඹලාද දෙවිවරුය මම කීමි යැයි ව්‍යවස්ථාවෙහි ලියා තිබෙනවා නොවේද? දෙවියන්වහන්සේගේ වචනය ලැබුවන්ට දෙවිවරු යයි උන්වහන්සේ කීසේක් නම් මම දෙවියන්වහන්සේගේ පුත්‍රයෙමියි මා කී නිසා පියාණන්වහන්සේ විසින් කැපකොට ලෝකයට එවන ලද තැනැත්තා ගැන නුඹ දෙවියන්වහන්සේට අපහාස කරන්නෙකි යැයි නුඹලා කියවුද?** (යොහන් 10:32 36)

ජේසුස් තුමන් මිනිසෙකුව සිටින විටම 'දෙවිඳුන්' යැයි තමා හඳුන්වා ගත් නිසා යුදෙව්වන් එතුමන්ට ගල් ගසා හිරිහැර කිරීමට තීරණය කළහ. එවිට පිළිතුරු දුන් ජේසුස් තුමන් 'දෙවිවරුන්' යනු දෙවියන්වහන්සේගේ වැකියන් ලබා ගත් පුද්ගලයාය යැයි පැහැදිලි කළේය. එනම් බයිබලයේ භාවිතා වන 'දෙවිවරුන්' වැනි ආමන්ත්‍රණ දෙවියන්වහන්සේ අදහස් කරන ආමන්ත්‍රණ නොව දෙවියන්වහන්සේගේ පණිවිඩකරුවන් හැදින්වීම සඳහා උපයෝගී කළ යෙදුම් බව මෙයින් පැහැදිලි වේ. තමා පමණක් නොව දෙවියන්වහන්සේගේ වැකියන් රැගෙන පැමිණෙන සියල්ලන්ම 'දෙවිවරුන්ම' යැයි ජේසුස් තුමන් පවසති. මෝසේ, ආබ්‍රහම්, දවිත්, සොලමන් වැනි 'දෙවිවරුන්' විශාල සංඛ්‍යාවක් ලොවට පැමිණියහ. නමුත් ඒ කිසිවෙකුට දෙවියන්වහන්සේ යැයි නොකියන කිතුනුවන් ජේසුස් තුමන්ට පමණක් දෙවියන්වහන්සේ යැයි කියති.

පහත වැකියෙන් මෝසේද 'දෙවිවරයෙක්' යැයි සඳහන් වෙයි:

**තවද සමිඳාණන් වහන්සේ මොසෙස්ට කථා කොට මෙසේ වදාළ සේක:**

**'බලන්න මම නුඹ සහෝදර වූ පාරාවෝ ඉදිරියේ දෙවි කෙනෙකු මෙන් කරමි** (නික්මයාම 7:1)

මෙම වැකියෙන් මිනිසුන් සියල්ලෝම 'දෙවිවරුන්' යැයි සඳහන් වෙයි:

**'තෙපි දෙවිවරුය' යි කීවෙමි: තෙපි සියල්ලෝ අති මහෝත්තමයාණන්ගේ පුත්‍රයෝ වන්නහු ය'.** (ගීතාවලිය 82:6)

පහත වැකියෙන් රජෙකුද 'දෙවිවරයෙක්' යැයි කියැවේ:

**ස්වාමීන් වන රජතුමෙනි.** (1 රාජාවලිය 1:2)

මෙසේ දෙවියන්ගේ පණිවිඩකරුවන් පමණක් නොව, සාමාන්‍ය මිනිසුන්ටද 'දෙවිවරුන්' යැයි කීමෙන් මෙම යෙදුමෙහි අරුත සැකෙවින් පැහැදිලි වේ.

පහත වැකිය අනුව නිවසේ ප්‍රධානියෙකුද 'දෙවිවරයෙකි'

**'ගෙදර ස්වාමියා නැගිට දොර වැසූ පසු නුඹලා පිටත සිට තට්ටු කරමින්, 'ස්වාමිනි අපට දොර හැරිය මැනවැ'යි කන්නලවු කරනු ඇත'**(ලූක් 13:25)

පහත වැකියෙන් ස්වාමි පුරුෂයෙකුද 'දෙවිවරයෙක්' යැයි සඳහන් වේ:

**ඔවුන් තම සැමියන්ට යටත් වූයේ ආබ්‍රහම්ට කීකරුව 'තම හාම්පුතා ඔහු' යයි පැවසූ සාරා පරිද්දෙනි.** (1 පේතෘස් 3:6)

'යහපත් මිනිසුන්ද දෙවිවරුන්' වෙති යැයි පහත වැකි පවසයි:

**"අපේ ස්වාමීන්වන දාවිත් නොදැනුවත්ව.** (පළමු රාජාවලිය 1:11)

**උන් මාගේ ස්වාමිවූ ඒසව්ට එවන ලද තෑග්ගක්ය'.** (උත්පත්ති 32:18)

මේ අනුව රජුන් නිවසේ ප්‍රධානීන් යහපත් මිනිසුන් යන සියළුම දෙනාටම බයිබලයේම මෙම ආමන්ත්‍රණය යෙදෙනු දැකිය හැකිය. එපමණක් නොව මේ කිසිදු අවස්ථාවක එම වචනය 'දෙවියන්වහන්සේ' යන අරුතෙන් භාවිතා කර නොමැති බවද පැහැදිලිය. මෙමගින් ජේසුස් තුමන්ට 'දෙවිවරයෙක්' යැයි බයිබලයේ සඳහන් වී තිබීමේ තර්කය එතරම් ප්‍රබල එකක් නොවන බව මොවුන්ට නොවැටහෙන්නේ මන්ද?

# 4. පියෙකු නොමැති උපදින සියල්ලෝම දෙවියන්වහන්සේ වෙත්ද?

අනෙක් සාමාන්‍ය මිනිසුන් මෙන් ජේසුස් තුමන් පියෙකුට නොඋපන්නේය. එනිසා ඔහු දෙවියන්වහන්සේ වෙති යැයි කිතුනුවන් තර්ක කරති.

ජේසුස් තුමන් පියෙකු නොමැතිව ආශ්චර්යමත් ආකාරයෙන් දෙවියන් විසින් මවනු ලැබූවෙකු යැයි මුස්ලිම්වරුන්ද පිළි ගනිති. එය පිළි නොගෙන කෙනෙකුට මුස්ලිමෙකුව පැවතිය නොහැක.

නමුත් පියෙකු නොමැතිව උපන් නිසාම කෙනෙකුට දේවත්වයෙන් ගරු කළ යුතුය යන තර්කය ඉතා දුර්වල එකකි. 'පියා නොමැතිව උපන්නේය' යැයි කිතුනුවන් පවසන විට 'පියා නොමැති' යන කරුණ ඉස්මතු කර පවසන ඔවුන් 'උපන්නේය' යන කරුණ යටපත් කරති. 'ඉපැදීම' යන කරුණ මිනිස් ලක්ෂණයකි. තවද 'උපන්නේය' යනුවෙන් අදහස් වන්නේ එයට පෙර තිබූනු වසර ලක්ෂ හෝ කෝටි ගණනක කාලයක් පුරා ඔහු ලොව නොසිටි බව හා පසුව ඔහු ලොව ජනිත වූ බවයි. එනම් බිහි වූ බවයි. එසේ වසර ලක්ෂ ගණනාවක් ලොවෙහි නොසිටි පුද්ගලයෙකු, මෙම මුළු මහත් විශ්වයේ මැවුම්කරුවා හෙවත් දෙවියන්වහන්සේ විය හැක්කේ කෙසේද? දෙවියන්වහන්සේ නොමැති එවන් දැවැන්ත කාල වකවානුවක් ලොවට තිබුනේ නම් ලොව එවිට පරිපාලනය කළේ කවුරුන්ද? තවද 'පියෙකු නොමැතිව උපන්නේය' යන තර්කය ඔවුන් ඉදිරිපත් කරන විටම ඔහුට 'පියෙකු නැති' බව කිතුනුවන් විසින්ම පිළිගන්නට යෙදෙන නිසා ඔහුට දෙවියන්වහන්සේ පියා වීමද ඔවුන්ම නොපිළි ගන්නවා යැයිද ගත හැක. එපමණක් නොව ජේසුස් තුමන් පියෙකු නොමැතිව උපන් නමුත් ඔහුට මවක් සිටියාය. එසේ නම් 'දෙවියන්වහන්සේට සිටිය නොහැක්කේ පියෙකු පමණි. නමුත් ඔහුට මවකු සිටිය හැකිය' යැයි කිතුනුවන් පවසනවාදැයි අසනු කැමැත්තෙමු. මෙයත් දෙවියන්වහන්සේගේ ලක්ෂණයක්ද? එසේනම් සර්වබලධාරි දෙවියන්වහන්සේටද මවක් සිටියේ යැයි කිතුනුවන් කියන්නට සූදනම් වන්නේද!

දෙවියන්වහන්සේ පිළිබඳ පිළිගත හැකි මතය වන්නේ දෙවියන්වහන්සේ යනු කිසිවෙකු විසින් මවනු හෝ වදනු නොලැබූ, කිසිවෙකුට දරුවෙකු ලෙසින් නූඋපන් ආරම්භයක් හෝ අවසානයක් නොමැති අසමසම ප්‍රභවයක්ය යන්න පමණි. ශුද්ධ කුර්ආනය දෙවියන්වහන්සේ පිළිබඳ දෙන විග්‍රහය මෙයයි.

## පියෙකු නොමැතිව 'උපන්' තවත් කෙනෙකු මෙන්න

**ඒනොක් සෙත්ගේ පුත්‍රයාය. සෙත් ආදම්ගේ පුත්‍රයාය. ආදම් දෙවියන්වහන්සේගේ පුත්‍රයාය. (ලූක් 3:38)**

**පියෙකු පමණක් නොමැති වසර 2000 ට පමණ පෙර මෙලොව උපන් ජේසුස් තුමන් දෙවියන්වහන්සේ නම්, වසර දස දහස් ගනනකට පෙර පියෙකු හෝ මවක් නොමැති දෙවියන්වහන්සේගේම දෑතින් ස්වර්ගයේම නිර්මාණය කරනු ලැබූ පළමු මිනිසා වන ආදම් දෙවියන්වහන්සේගේ පුත්‍රයා යැයි අමතනු ලැබීමට වඩාත් සුදුස්සා වන්නේය.**

ඒ අතින් ගත් කල ජේසුස් තුමන්ට වඩා කිහිප අංශයකින්ම ආදම් වෙනස් හා විශිෂ්ඨය. නමුත් දේවත්වයෙන් ආදම් පිදීමට කිතුනුවන් නොපෙළඹෙති.

**ස්ත්‍රියකගෙන් උපන් තැනැත්තා පවිත්‍ර වන්නේ කෙසේද? (යෝබ් 25:4)**

ස්ත්‍රියක් විසින් වදනු ලැබූ නිසා ජේසුස් තුමන් පවිත්‍ර නොවන බව මෙම වැකිය ඉඟි කරයි. නමුත් ආදම්ට පමණක් නොව 'ඒවට' හෝ මෙම අඩුව නොමැත. මන්ද ඔවුන් දෙදෙනම ස්ත්‍රියක් විසින් වදනු නොලැබ ආශ්චර්යමත් ආකාරයෙන් ස්වර්ගයෙහිදීම මවනු ලැබූ දෙදෙනෙකු වන හෙයිනි.

උත්පත්ති 2:21 22 බයිබල් වැකිවලින් පැවසෙන්නේද ජේසුස් තුමන් ස්ත්‍රියක් විසින් වදනු ලැබූ නිසා එතුමන් පවිත්‍ර නොවන බවයි. එසේ අපවිත්‍ර කෙනෙකු කෙසේ නම් දෙවියන්වහන්සේ විය හැකිද?

එසේ නම් කිතුනුවන් බයිබලයේ දෙසුම් හෝ පිළි නොගනිත්ද? ඔවුන් ගමන් කරන්නේ බයිබලයටද ගරුසරු නොපෙන්වමින්ද?

තවද බයිබලයේ සඳහන් මෙල්කිසදෙක් ජේසුස් තුමන්ට වඩා උසස් පුද්ගලයෙකු යන අදහස එහිම පිළිබිඹු වෙයි. ඔහු ගැන මෙසේ බයිබලයේ සඳහන් වෙයි:

**මේ මෙල්කිසදෙක් තෙමේ සාලෙම්හි රජ ද පරමෝත්තම දෙවියන් වහන්සේගේ පූජකයෙක් විය. ආබ්‍රහම් රජවරුන් පලවා හැර පෙරළා එද්දී මේ මෙල්කිසදෙක් ඔහු හමු වී ඔහුට ආශීර්වාද කළේය. (හෙබ්‍රෙව් 7:1)**

ආබ්‍රහම්ට පවා අශීර්වාද කළ හැකි මොහු කවරෙක්ද? ඒ ගැන බයිබලයම මෙසේ පැහැදිලි කරයි:

**තවද ඔහුගේ පියාගේ හෝ මවගේ හෝ පෙළපත ගැනවත් උපත හෝ මරණය හෝ ගැනවත් සටහනක් නැත. මේ තෙමේ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් හා සමාන ය. ඔහු සදහට ම පූජකයෙක් ව සිටියේය. හෙබ්‍රෙව් 7:3)**

**මේ මෙල්කිසදෙක් කොපමණ ශ්‍රේෂ්ඨ ද කියා සලකා බලන්න. සමිඳුන් තෝරාගත් ජනයාගේ පළමුවෙනියා වූ ශ්‍රේෂ්ඨතම ආබ්‍රහම් පවා, රජවරුන්**

සමග සටන් කර පැහැර ගත් දෙයින්, දශයෙන් කොටස මෙල්කිසදෙක්ට පිදිය. (හෙබ්‍රෙව් 7:4)

පියා නොමැති එකම කරුණක් නිසා ජේසුස් තුමන් දෙවියන්වහන්සේට පුත්‍රයා වී යැයි විශ්වාස කරන කිතුනුවන් පියා නොමැතිව මවක් නොමැතිව එනිසා පෙර පාරම්පරිකයන් නෑසියන් කිසිවෙකු නොමැතිව උපන් ආදම් හෝ ඉහත වැකිවලින් විශ්මය පළ කරනු ලබන හා බයිබලයේම 'මොහු කෙතරම් ප්‍රබලදැයි බලන්න' ආශ්චර්යය පළ කරනු ලබන මෙල්කිසදෙක් හෝ දේවත්වයෙන් පිදුම් ලැබීමට සුදුසු යැයි නොසිතති. වෙනෙකක් තබා මෙම මෙල්කිසදෙක් නමවත් කිතුනුවන් බොහෝ දෙනෙකු නොදන්නා බවක් පෙනේ.

බයිබලයේ සඳහන් කරුණු නිසි අන්දමින් අධීක්ෂණයට ලක් කළහොත් ආදම් හා මෙල්කිසදෙක් පමණක් නොව ආදම්ගේ සහකාරිය වන ඒවද ජේසුස් තුමන්ට වඩා විශිෂ්ඨ පුද්ගලයෙකු බව බයිබලයේම සඳහන් වී ඇති සැටි පැහැදිලි වනු ඇත. කිතුනුවන් සිය ශුද්ධ ග්‍රන්ථය ඇත්තෙන්ම විශ්වාස කරත් නම් මෙම පුද්ගලයන් දේවත්වයෙන් පිදීමට ඉදිරිපත් විය යුතුය. එසේ නොමැති නම් මිනිසුන් -ඔවුන් කෙතරම් ආශ්චර්යමත් ආකාරයෙන් මවනු ලැබුවද- කිසි සේත් දෙවියන්වහන්සේ හා සම නොවෙති යන නොසෙල්විය හැකි සත්‍යය පිළි ගත යුතුය. මෙලෙසින් වැනෙන හා අස්තීර ස්ථාවරයක සිටීමෙන් ඔවුන්ට කිසිදු ජයක් ගෙන නොදෙනු නොඅනුමානය.

## 5. ප්‍රාතිහාර්යයන් කර පෙන්වීමෙන් පමණක් කෙනෙකු දෙවියන්වහන්සේ විය හැකිද?

මිනිසුන් විසින් කළ නොහැකි, දෙවියන්වහන්සේ විසින් පමණක් කළ හැකි ප්‍රාතිහාර්යයන් කිහිපයක්ම ජේසුස් තුමන් සිදු කර තිබීම කිතුනුවන් තම තර්කය සඳහා ඉදිරිපත් කරන තවත් වාදයකි. මෙම ප්‍රාතිහාර්ය නිසා එතුමන් දෙවියන්වහන්සේ ලෙසින්ද, දෙවියන්වහන්සේගේ පුත්‍රයා ලෙසින්ද, දේවත්වයට හිමි ලක්ෂණ ඇති පුද්ගලයෙකු ලෙසින් මෙන්ම දෙවියන්වහන්සේගේ ස්වරූපයක් යැයිද පිළිගත යුතු යැයි ඔවුන් කියති.

නමුත් මෙම තර්කද බයිබලයේ ආලෝකයෙන්ම පිළිගත නොහැකි වාදයන් බවට පත්වන සැටි පෙන්වන්නට අප කැමැත්තෙමු.

### මළවුන් නැගිටවීම

මරණයට පත්වූවන් නැවත නැගිටවීමෙන් ජේසුස් තුමන් සිදු කළ විශාලතම ප්‍රාතිහාර්යය අප නිදසුනකට ගනිමු. මෙය ඔහු දෙවියන්වහන්සේ බවට සාධක ලෙසින්

ගැනීමට සුදුසු කරුණක් නම් මෙයම තවත් පුද්ගලයන් විසින් කර ඇති බවට බයිබලයම දෙස් දෙයි. බයිබලය නිරීක්ෂණය කරන කල ජේසුස් තුමන් විසින් එසේ පණ උපදවනු ලැබුවේ තිදෙනෙකුට පමණක්ය යන සත්‍යය පැහැදිලි වනු ඇති අතර තවත් පුද්ගලයන් මෙයටත් වැඩි සංඛ්‍යාවකට නැවත පණ උපදවා ඇති බව එහිම සඳහන් වෙයි.

**සමිඳුනන් වහන්සේ එලියාගේ හඬට සවන් දුන් සේක. ළමයාගේ ප්‍රාණය නැවත ඔහු තුලට පැමිණ ඔහු ජීවත් වුණේය.** (1 රාජාවලිය 17:22)

**තවද ඔහු ඇඳට නැගී ළමයා පිට වැතිර තමාගේ කට ඔහුගේ කට පිට ද තමාගේ ඇස් ඔහුගේ ඇස් පිට ද තමාගේ අත් ඔහුගේ අත් පිටද තබා ළමයා පිට දිගා විණි. ළමයාගේ මාංශයද උණුසුම් විය.** (2 රාජාවලිය 4:34)

ජේසුස් තුමන් කළාක් මෙන්ම එලියා හා එලිෂා මළවුන් නැගිට වූ බවට බයිබලය පවසන විට ඔවුන්ව දේවත්වයෙන් පිදීමට කිතුනුවන් ඉදිරිපත් නොවන්නේ මන්ද? එපමණක් නොව දහස් ගනන් මිනිස් ඇටකටුවලට එසක්කියේල් ප්‍රාණය දී නැගටවූයේය යැයි එසකියේල් 37 වැනි පරිච්ඡේදයෙහි සඳහන් වෙයි.

ජේසුස් වහන්සේ පණ ඉපදවූයේ එතුමන් ජීවත් වූ කාල පරිච්ඡේදයේ තිදෙනෙකුට පමණක් වූ අතර දහස් ගනන් මිනී ඇටකටුවලට ප්‍රාණය දුන් එසකියේල් තර්කානුකූලව ගත් කල වඩාත් ප්‍රබල පුද්ගලයෙකු හා දේවත්වයෙන් පිදීමට වඩාත් සුදුසු පුද්ගලයා ලෙසින් පිළිගත යුතුයි නොවේද? නමුත් එසේ කිතුනුවන් නොකරන්නේ ඇයි? මරණයෙන් පසුවද තවත් කෙනෙකුට ප්‍රාණය දිය හැකි මොහු එසේ නම් ජේසුස් වහන්සේ ටත් වඩා ප්‍රබලයෙකු විය යුතුයි නොවේද?

**මිනිසුන් මිනියක් වළලන්නට යන විට හමුදවක් දැක එලිෂාගේ සොහොන් ගෙයි ඒ මිනිය දැමූහ. ඒ මිනිය එලිෂාගේ ඇටවල තැවරුණු හැටියේ ම පණ ලැබ නැගිට සිටියේය** (2 රාජාවලිය 13: 21)

## ප්‍රාතිහාර්ය පෙන්වූ තවත් අය

.මෙය හැර ජේසුස් වහන්සේ විසින් සිදු කර පෙන්වනු ලැබූ අනෙකුත් විශ්මයජනක දේ ගැන මඳකට අප විමසා බලමු. එසේ එය විමසිල්ලට ලක් කරන කල එම ප්‍රාතිහාර්යන්ටත් වඩා පුදුම එලවන සුළුදේ අන් අය කර ඇති සැටි බයිබලයේම සඳහන් වෙයි. රොටී පහක් හා මත්ස්‍යයන් දෙදෙනෙකු කිහිප දෙනෙකු අතර ජේසුස් වහන්සේ බෙදා දුන් සිද්ධියක් බයිබලයේ සඳහන් වෙයි. නමුත් අන් කෙනෙකු විසින් සිදු කරන ලද ආශ්චර්යමත් ක්‍රියාවක් ගැන බයිබලයේ මෙසේ සඳහන් වෙයි

**තවද බාල්-ෂාලිසාහි සිට මනුෂ්‍යයෙක් ප්‍රථම අස්වැන්නෙන් යව රොටි විස්සක්ද අලුත් ගොයම් කරල් ද තමාගේ මල්ලේ දමාගෙන දෙවියන්**

වහන්සේට කැප වූ මනුෂ්‍යයා වෙත ගෙනාවේය. ඔහු ද 'සෙනගට කන්න දෙන්නැ'යි කීය. ඔහුගේ මෙහෙකරුවා 'කිමෙක්ද? මේවා මනුෂ්‍යයන් සියයක් ඉදිරියෙහි තබන්න දැ?'යි ඇසීය. එහෙත් ඔහු 'ඒවා සෙනගට කන්න දෙන්න: මන්ද ඔවුන් අනුභව කොට ඉතිරි කරනු ඇත කියා සමිඳාණන් වහන්සේ වදාරන සේකැ'යි පැවසීය. එවිට එයින් අනුභව කොට සමිඳාණන් වදාළ ලෙස ඉතිරි කළෝ ය. (2 රාජාවලිය 4: 42 44)

එවිට ඈ කථා කොට 'බඳුනක පිටි මිටකුත් කුලාවක තෙල් ටිකකුත් මිස මා ළඟ රොටි නැත. ඒවා සාදා ගන්නට දර කෑලි දෙකක් අහුලමි. මටත් මාගේ පුත්‍රයාටත් තිබෙන ඒ අන්තිම කෑම වේල අනුභව කළ පසු නගින්නෙමු'යි ඔබේ ජීවමාන සමිඳාණන් වහන්සෙගේ නාමයෙන් දිවුරමි' යි කීවාය. එලියා ඈට කතා කොට 'බිය නොවන්න. ගොස් ඔබ කී හැටියට කරන්න. එහෙත් පළමුකොට එයින් මට කුඩා රොටියක් සාදා මා ළඟට ගෙනෙන්න.: පසුව ඔබටත් ඔබගේ පුත්‍රයාටත් සාදා ගන්න. මන්ද දෙවි සමිඳුණ් මෙසේ වදාරන සේක: 'සමිඳාණන් මිහි පිට වැස්ස එවන දවස දක්වා පිටි බඳුන ඉවර වන්නේ නැත. තෙල් කුලාව අඩු වන්නේ නැතැ'යි කීවේය. ඈ ගොස් එලියා කී හැටියට කළාය. එසේ ඈ ද ඔහු ද ඇගේ ගෙයි වැසියෝ ද බොහෝ දවස් ඒවා අනුභව කළෝය. සමිඳාණන් වහන්සේ එලියා ලවා දෙන ලද උන් වහන්සේගේ පණිවුඩය ප්‍රකාර පිටි බඳුන හිස් නොවී ය. තෙල් කුලාව අඩු නොවී ය. (1 රාජාවලිය 17: 13 16)

එලිෂා කතා කොට 'මම ඔබට කුමක් කරම්ද? ගෙදර ඔබට තිබෙන්නේ මොනවාදැ යි මට කියන්නැ'යි ඇයට කීය. 'තෙල් කුලාවක් මිස ගෙදර වෙන කිසිවෙක් ඔබේ දසියට නැතැ'යි ඈ කීවාය. එවිට ඔහු කතා කොට 'ඔබ පිටතට ගොස් ඔබේ සියලු අසල්වැසියන්ගෙන් භාජන එනම් හිස් භාජන බොහෝමයක් ඉල්ලා ගන්න. ඔබත් ඔබේ පුත්‍රයනුත් ගෙදරට ඇතුළු වී දොර වසාගෙන ඒ සියලු භාජනවල තෙල් වත් කොට පිරුණු ඒවා පැත්තක තබන්නැ'යි කීවේය. ඈ ද ඔහු වෙතින් ගොස් ඈත් ඇගේ පුත්‍රයෝත් ගෙදරට ඇතුළු වී දොර වසා ගත්හ. ඔව්හු ඈ ළඟට භාජන ගෙනාවෝය. ඈ තෙල් වත් කළාය. භාජන පිරුනු කල ඈ 'තවත් භාජනයක් මට ගෙනෙන්නැ'යි ඇගේ පුත්‍රයාට කීවා ය. 'තවත් භාජනයක් නැතැ' යි ඔහු ඈට කීය. තෙල් ගලා යෑමද නැවතිණි. (2 රාජාවලිය 4:2-6)

ජේසුස් වහන්සේ ගේ ප්‍රාතිහාර්‍ය්‍ය එක දිනකින්ම අවසන් වන්නක් වූ නමුත් එලිෂා හා එලියාගේ ප්‍රාතිහාර්‍ය්‍යයන් දින ගණනාවක් පවතින බව බයිබලයේ සඳහන් වෙයි. එවැනි ප්‍රාතිහාර්‍ය්‍යයන් සිදු කළ මෙම දෙදෙන දේවත්වයෙන් පිදුම් ලැබීමට ඒ අනුව

වඩාත් සුදුස්සන් බව ඔප්පු වී තිබෙන විට ජේසුස් වහන්සේ ට පමණක් එවැනි උසස් තත්ත්වයක් කිතුනුවන් විසින් දෙනු ලබන්නේ ඇයි?

## ප්‍රාතිහාර්යයක් කිරීමට අපොහොසත් වන ජේසුස් වහන්සේ

**පසුදින අළුයම උදයේ ආපසු නගරයට එමින් සිටින අතරේ එතුමාණන්ට කුසගිනි දැනිනි. මග අසල වූ අත්තික්කා ගසක් දුටු එතුමාණන් එතැනට ගිය නමුදු එහි කොළ මිස අන් කිසිවක් නොවිණි. එවිට එතුමාණෝ 'යළි කිසි දිනෙකත් නුඹ ඵල නොදරනු ඇතැ' යි ඒ ගසට පැවසූහ. එසැනින් ඒ ගස වියැලී ගියේය.** (මතෙව් 21: 18-19)

ප්‍රාතිහාර්යයන් සිදු කළ පමණින් ජේසුස් වහන්සේ දෙවියන්වහන්සේ විය නොහැකි බව හා ප්‍රාතිහාර්යයන් සිදු කිරීමේ හැකියාව ජේසුස් වහන්සේ නිතැතින්ම ලැබුනක් නොවන බවට මෙයට වඩා සාධක අවශ්‍ය වන්නේද?

ප්‍රාතිහාර්යයන් සිදු කළ නිසා එතුමන් දෙවියන්වහන්සේ යැයි විශ්වාස කරන්නේ නම් එතුමන්ට කුස ගිනි ඇතිවූයේ කෙසේද? දෙවියන්වහන්සේට කුසගිනි ඇතිවිය හැකිද? එම ගසේ ගෙඩි තිබේද නොතිබේද යන සාමාන්‍ය කරුණක් පවා දෙවියන්වහන්සේ නොදැන සිටියිද? නොදැනුවත්කම හා මුලාවට පත්වීම වැනි දුබලකම් දෙවියන්වහන්සේට තිබිය හැකිද? ගසක් මවන්නේ හා එහි ගෙඩි ඇති කිරීම හෝ නැති කිරීම යනු දෙවියන්වහන්සේගේ බලයට යටත් කරුණක් බවට තර්කයක් නැත. එසේ තිබෙන විට එම ගසේ ගෙඩි නොතිබෙන තත්ත්වයක් තුල ජේසුස් තුමන් දෙවියන්වහන්සේ නම් ඔහුම එයට ශාප කරන්නේ කෙසේද? එසේ ගෙඩි නැති ගසක් ළඟට පැමිණි ජේසුස් වහන්සේ කිතුනුවන් විශ්වාස කරන අන්දමට දෙවියන්වහන්සේ නම් එතුමන්ට එම ගසෙහි නිමේෂයකින් ගෙඩි ඇති කරන්නට තිබුනා නොවේද? අන් අයගේ කුසගින්න නැති කිරීමට ප්‍රාතිහාර්ය සිදු කළ එතුමන්ට තමාගේ කුසගින්න සඳහා එවැන්නක් කළ නොහැකි වූයේ ඇයි? ගෙඩි හට ගැනීම වෘක්ෂවල ස්වාභාවික ලක්ෂණය වේ. එම ස්වාභාවික ක්‍රියාදාමයද ජේසුස් වහන්සේ විෂයයෙහි වෙනස් වී එතුමන්ට දුෂ්කරතා ඇති කරන සැටි මෙහි දැක්වේ.

**කපුටුවෝ උදය කාලයේ රොටි සහ මස් ද සවස් කාලයේ රොටි සහ මස්ද ගෙනාවෝය. ඔහුද ඔයෙන් වතුර බීවේ ය.** (1 රාජාවලිය 17: 6)

මේ අතර අනුන්ගේ ආහාර පවා ඩැහැ ගෙන යාම කපුටන්ගේ ස්වභාවය වන නමුත් උන් එයට ප්‍රතිවිරුද්ධ ගුණාංග දක්වමින් එලියාට දිනපතා ආහාර ගෙනවිත් දෙති. මෙම සිද්ධි මාලා දෙකින් ආශ්චර්යමත් සිද්ධිය යැයි කිතුනුවන් හඳුන්වන්නේ කුමන සිද්ධි මාලාවද?

මේ සියල්ලෙන්ම ඔප්පු වන්නේ ඇතැම් අවස්ථාවල ජේසුස් වහන්සේ ප්‍රාතිහාර්යයන්

සිදු කර පෙන්වූයේ දෙවියන්වහන්සේගේ අනුමැතිය ඇතිවය යන වගයි. එසේ කරන විටද එතුමන් පැවතියේ මිනිසෙකු ලෙසිනි. එපමණක් නොව කුසගින්න නොදැනුවත්කම මුලා වීම තේරුමක් නැති කෝපය වැනි මිනිස් දුර්වලකම්වලින් නිදහස් වූ පුද්ගලයෙකු ලෙසින් ජේසුස් වහන්සේ නොපැවති බව බයිබලයේ සඳහන් සිද්ධීන්වලින්ම සනාථ වේ.

## ලාදුරු රෝගීන් සුව කිරීම

ජේසුස් වහන්සේ විසින් ලාදුරු රෝගීන් සුව කිරීම ප්‍රාතිහාර්යයක් නම් එයම තවත් කිසිප දෙනෙකුම කළ බව බයිබලයේම සඳහන් වෙයි.

**එලිෂා කතා කොට 'ඔබ ගොස් ජෝර්දන් ගඟෙහි සත් වරක් නාන්න: එවිට ඔබේ කුෂ්ඨය සුව වී ඔබේ ශරීරය නැවත පවිත්‍ර වන්නේය.** (2 රාජාවලිය 5:10)

**එවිට ඔහු බැස ගොස් දෙවියන් වහන්සේට කැපවූ මනුෂ්‍යයාගේ කීම ලෙස ජෝර්දන් ගඟෙහි සත් වරක් ගිලී ස්නානය කළේය. ඔහුගේ ශරීරයද කුඩා ළමයෙකුගේ මෙන් පවිත්‍ර විය.** (2 රාජාවලිය 5:14)

**එවිට එලිෂා යාච්ඤා කොට 'සමිඳාණන් වහන්ස ඔහුට පෙනෙන පිණිස ඔහුගේ ඇස් පැහැදුව මැනවැ'යි කීය. සමිඳාණන් වහන්සේ සේවකයාගේ ඇස් පැහැදූ සේක.** (2 රාජාවලිය 6:17)

**තවද ඔහු සමාරියට පැමිණි විට එලිෂා කතා කොට 'සමිඳාණන් වහන්ස පෙනෙන පිණිස මොවුන්ගේ ඇස් පැහැදූ මැනවැ'යි කීය. සමිඳාණන් වහන්සේ ඔවුන්ගේ ඇස් පැහැදූ සේක. ඔවුන් බැලූ විට තමන් සමාරිය මැද සිටින බව දුටුවෝය.** (2 රාජාවලිය 6:20)

## ජලය මතුපිට ගමන් කිරීම

**ඉශ්රායේල් ජනතාව වියළි බිම දිගේ මුහුද මැදට ගියහ. ජලය දකුණු පසින් තාප්පයක් මෙන් විය.** (නික්මයාම 14:22)

තවද එලිෂා යකඩ පොරොවක් දියේ පා කර පෙන්වා ඇත (දෙවෙනි රාජාවලී 6:6)

ප්‍රාතිහාර්යයන් එතුමන්ට පෙර එතුමන්ට වඩා විශිෂ්ඨ ආකාරයෙන් අන් අය සිදු කළ බවට දෙස් දෙන්නේ ශුද්ධ බයිබලයමය.

මෙලෙසින් කිහිප දෙනෙකු විසින්ම ප්‍රාතිහාර්යයන් සිදු කළ හැකි නම් මෙහි පසුබිම

කුමක්ද? මෙම පැනයට බයිබලයම පැහැදිලි කිරීමක් මෙසේ දෙයි:

**'තනි කැමැත්තට කිසිවක් කරන්නට මට නොහැකියි. මා විනිශ්චය කරන්නේ පියාණන්වහන්සේ මට උපදෙස් දෙන ආකාරයටයි. මා මගේම රුචි අරුචිකම් නො ව මා එවූ පියාණන්වහන්සේගේ කැමැත්ත ඉටු කරන නිසා මගේ විනිශ්චය සාධාරණයි. අපක්ෂපාතීයි.** (යොහන් 5:30)

**එනමුත් මම දෙවියන්වහන්සේගේ සුළැඟිල්ල මගින් යක්ෂයන් දුරු කරම් නම් දෙවියන්වහන්සේගේ රාජ්‍යය ඔබ වෙත පැමිණ තිබේ.** (ලූක් 11:20)

**'ඒ දවසෙහි බොහෝ දෙනෙක් මා වෙත අවුත් 'ස්වාමිනී, ස්වාමිනී, ඔබතුමන්ගේ නාමයෙන් අපි දිවැසිවැකි නොකීවෙමුද? ඔබ තුමන්ගේ නාමයෙන් අප යකුන් දුරුකොට නොයෙකුත් හාස්කම් නොකළෙමුදැ?' යි කියනු ඇත. එවිට 'කිසි දිනෙකත් මම ඔබ නොදන්නෙමි. දුර්ජනයෙනි, මා වෙතින් ඉවත් වනු'යි මම ඔවුන්ගේ මුහුණටම කියන්නෙමි'.** (මතෙව් 7:22 23)

**'මට ස්වාමිනී, ස්වාමිනී යි කියන හැම කෙනෙක්ම ස්වර්ග රාජ්‍යයට ඇතුල් වන්නේ නැත. එහි ඇතුල් වන්නේ ස්වර්ගයේ වෙසෙන මාගේ පියාණන්වහන්සේගේ කැමැත්ත ඉටු කරන අය පමණි.** (මතෙව් 7: 21)

මේ සියල්ල ජේසුස් වහන්සේ ගේ අවවාද වේ. මේ අනුව ප්‍රාතිහාර්යයන් සිදු කිරීමෙන් තමා දෙවියන්වහන්සේ නොවන බවද එසේ පවසන්නන්ව තමා අත්හරින බවද ඔවුන්ට එලොව රාජ්‍යයේ ස්වර්ගයේ ඉඩ නැත යැයිද පැහැදිලිවම ජේසුස් වහන්සේ මෙහි අවවාද කරති. තවද තමා සිදු කරන ලද ප්‍රාතිහාර්ය සියල්ලම සිදු කරන ලද්දේ දෙවියන්වහන්සේ ගේ සිතැඟි පරිදිම යැයිද එතුමන් පවසති. ජේසුස් වහන්සේ ම මෙසේ පවසන විට තවත් කාගේ අවවාදයක් හා ප්‍රකාශයක් සඳහා කිතුනුවන් බලා සිටිත්ද?

**තම අත තබා එහි සිටි කිහිප දෙනෙකුව සුව කිරීම හැර වෙන කිසිම හාස්කමක් එහිදී එතුමාණන්ට කළ නොහැකි විය. ඔවුන්ගේ ඇදහිල්ලේ හීනකම ගැන එතුමාණෝ විශ්මයට පත්වූ සේක. ඉන්පසු ජේසුස් වහන්සේ ගමින් ගම සැරි සරමින් ඉගැන්වූ සේක.** (මාර්ක් 6:5,6)

මෙයින් ගම්‍ය වන්නේ මිනිසුන් ජේසුස් වහන්සේ ගෙන් තවත් ප්‍රාතිහාර්යයන් ගනනාවක්ම බලාපොරොත්තු වූ නමුත් ඇතැම් ප්‍රාතිහාර්යයන් හැර වැඩි යමක් කිරීමට එතුමන්ට නොහැකි වූ බවත්, එනිසා මිනිසුන් එතුමන් විශ්වාස නොකළ බවත්ය. මේ

අනුව ප්‍රාතිහාර්යයන් සිදු කර පෙන්වීම ජේසුස් වහන්සේ බලය තුල වූ ක්‍රියාවක් නොව, එය ඉහලින් පැමිණි ආඥා අනුව එතුමන් විසින් කරන ලද දේ බවද පැහැදිලි වේ.

**එකල පරිසිරිවරුන්ගෙන් හා දහම් පඬිවරුන්ගෙන් ඇතැම් දෙනෙක් එතුමන් අමතමින් 'ගුරුතුමනි ඔබගෙන් අනුහස් ලකුණක් දැකීමට අප කැමැත්තෙමු' යි කීහ. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් 'දුෂ්ටවූත්, ද්‍රෝහිවූත් පරම්පරාවක් අනුහස් ලකුණක් ඉල්ලයි. එහෙත් දිවැසිවර යෝනාගේ ලකුණ හැර අන් ලකුණක් ඔවුනට දෙනු නොලැබේ'. (මතෙව් 12:38 39)**

ඉතා ගරුසරු සහිතව මිනිසුන් ජේසුස් වහන්සේ ගෙන් ප්‍රාතිහාර්යයන් ඉල්ලා සිටි විටද එතුමන් කෝපයෙන් එය ප්‍රත්‍යක්ෂප කිරීමෙන් පෙනී යන්නේ එය එතුමන්ගේ ආධිපත්‍යයේ නොවූ කරුණක් බවයි.

**ඒ දුටු ජන සමූහයා ගරුසරු-භයින් පිරී එවන් බලයක් මිනිසුනට දුන් දෙවියන්වහන්සේට ප්‍රශංසා කළහ. (මතෙව් 9:8)**

ප්‍රාතිහාර්යයන් කර පෙන් වූ ජේසුස් වහන්සේ එමගින් තමාව දෙවියන්වහන්සේ යැයි තර්ක කර තිබුනහොත් ජනයන්ද එතුමන්ව දෙවියන්වහන්සේ යැයි පිළිගනු ඇත. නමුත් ජේසුස් වහන්සේ එසේ නොපැවසූ නිසා එතුමන්ව මිනිසෙකු ලෙසින්ම ජනයා පිළිගත්හ. තවද මෙවැනි බලයන් ප්‍රධානය කළ දෙවියන්වහන්සේටම ඔවුන් ප්‍රශංසා කළහ යන කරුණද මෙම වැකියෙන් පැහැදිලි වේ.

## දුෂ්ට පුද්ගලයන්ද ප්‍රාතිහාර්ය සිදු කර පෙන්වා ඇත්තාහ

ප්‍රාතිහාර්ය සිදු කර පෙන්වීම නිසාම කෙනෙකු දෙවියන්වහන්සේ විය නොහැකිවා පමණක් නොව, ප්‍රාතිහාර්යයන් සිදු කරන සියල්ලන්ම යහපත් පුද්ගලයන්ම වෙති යැයිද තර්ක කළ නොහැකි බවට සාධක බයිබලයේම සඳහන් වී ඇති සැටි බලන්න.

**ඔබ අතර දිවැසිවරයෙකු හෝ ස්වප්න තෝරන්නෙකු හෝ පහළ වී ඔබට හාස්කමක් හෝ අරුමපුදුම දෙයක් හෝ පාන්නට යෝජනා කොට ඔහු කී අයුරින් ඒ හාස්කම් හෝ අරුමපුදුම දේ හෝ සිදු වී ඔබ නොහඳුනන ඒ දෙවි දේවතාවන් පසුපස ගොස් 'අපි ඔවුන්ට වැඳුම්පිදුම් කරමු'යි කීවොත් එවැනි දිවැසිවරයෙකුගේ හෝ ස්වප්න තෝරන්නෙකුගේ හෝ කීම්වලට ඔබ සවන් නොදිය යුතුය. මෙවැනි දේවලින් ඔබේ දෙවි සමිඳුණන් වහන්සේට ඔබේ මුළු හෘදයෙන් සහ ඔබේ මුළු සිතින්ම ප්‍රේම කරන්නහු දැ යි උන් වහන්සේ ඔබ පරීක්ෂා කරන සේක. (ද්වීතීය කථාව 13:1-4)**

දෙවියන්වහන්සේන්ගේ සත්‍ය පණිවිඩකරුවෙකු නොවන පුද්ගලයෙකුටද ප්‍රාතිහාර්‍ය සිදු කර පෙන්විය හැක හා අප මුළු හදින් විශ්වාස කළ යුත්තේ දෙවියන්වහන්සේ පමණක්ය යැයි ඉතා පැහැදිලිවම පවසන මෙම වැකි කිතුනුවන් සොහොයුරන්ට මෙතෙක් නොපෙනුනේද?

මෙම අවවාදය ජේසුස් වහන්සේ විසින්ද දෙනු ලැබ ඇති සැටිද බලන්න:

**තෝරා ගත්තවුන් පවා මුළා කරනු පිණිස ව්‍යාජ-ක්‍රිස්තුවරුන්ද ව්‍යාජ-දිවැසිවරුන්ද පෙනී සිටිමින් මහත් ලකුණු හා හාස්කම් දක්වනු ඇත.** (මතෙව් 24:24)

මෙතෙක් අප ඉදිරිපත් කළ කරුණු අනුව ජේසුස් වහන්සේ පමණක් නොව අන් යහපත් පුද්ගලයන්ද ප්‍රාතිහාර්‍යයන් සිදු කර ඇති බවද, ජේසුස්වහන්සේට අවශ්‍ය පරිදි ප්‍රාතිහාර්‍ය සිදු කිරීමට එතුමන් අපොහොසත් වූ බවද, දුෂ්ටයන් විසින්ද ප්‍රාතිහාර්‍යයන් සිදු කර පෙන්වා ඇති බවද ශුද්ධ බයිබලයේම සඳහන් වැකිවලින් සනාථ වෙයි. එබැවින් ප්‍රාතිහාර්‍ය පෙන්වීම කෙනෙකු දේවත්වයෙන් පිදීමට සුදුසු කරුණක් නොවන බවද පැහැදිලි වේ. මෙම කරුණු කිසිවක් පිළි නොගෙන තව දුරටත් ජේසුස් වහන්සේ දේවත්වයෙන් පිදීමට යමෙක් ක්‍රියා කරයි නම් ඔහු ජේසු තුමන්ගේ හා ශුද්ධ බයිබලයේ ආඥාවලටම අවනත නොවන්නෙක් යන තත්ත්වයට පත්වීමේ බිහිසුණු අවදානමට පත් වන බවද දත යුතුය.

## 6. මරණින් පසු නැගිටීම නිසා කෙනෙකු දෙවියන්වහන්සේ විය හැකිද?

'ජේසුස් වහන්සේ කුරුසයේ ඇණ ගසා මරා දැමීමෙන් දින තුනකට පසු නැවතත් මළවුන් අතරින් නැගී සිටි හෙයින් ඔහු දෙවියන්වහන්සේමය' යනු කිතුනු ජනයා මේ සඳහා ඉදිරිපත් කරන තවත් තර්කයකි.

ජේසුස් වහන්සේගේ ඉරණම පිළිබඳ ශුද්ධ කුර්ආනයේ පැහැදිලි කිරීම මෙලෙසින් නොවන නමුත් කිතුනුවන් ගේ ස්ථාවරය අනුවම ගොස් මෙම තර්කයද අප විමසිල්ලට ලක් කරමු.

මරණින් පසු නැගිටීම යන කරුණ ගත් කල එහි සිද්ධීන් දෙකක් අන්තර්ගත වේ. එකක් මරණයට පත් වීම වන අතර අනෙක මළවුන්ගෙන් නැගිටීමය. මළවුන්ගෙන් නැගිටීමේ ප්‍රාතිහාර්‍යය සිදුවීමට පෙර කෙනෙකු මරණයට පත් විය යුතුය. දැන් මරණය ගැන ශුද්ධ බයිබලය කුමක් කියන්නේදැයි බලමු.

**පව් කරන පුද්ගලයාම නසිනු ඇත.** (එසකියෙල් 18:20)

මනුෂ්‍යභවයක් ලබන සියළුම ආත්ම මරණයට පත්වෙයි. ඒ අනුව බලන කල සියළුම මනුෂ්‍යයන් පව් කරති. මෙම ලක්ෂණවලින් නිදහස්ව සිටින්නේ දෙවියන්වහන්සේ පමණී. මෙය අනුව බලන කල ජේසුස් වහන්සේ මරණයට පත් වූ හෙයින් ඔහුද පව් කර ඇති බව මෙන්ම එනිසාම ඔහු දෙවියන්වහන්සේ විය නොහැකි බව මෙයින් ගම්‍ය වනවා නොවේද?

**එහෙත් සමිඳාණෝ සැබෑ දෙවිඳාණෝ ය: ජීවමාන දෙවි තුමාණෝ ය: සදාකාල රජතුමාණෝ ය.** (යෙරමියා 10:10)

දෙවියන්වහන්සේ සදාකල් ජීවත් වන්නෙකු විය යුතු යැයි මෙම වැකිය පවසයි. මරණයට පත් වීමෙන් ජේසුස් වහන්සේ ට මෙම සුදුසුකම අහිමි වෙයි. මෙයින් පසුවද එතුමන් දෙවියන්වහන්සේ යැයි තර්ක කිරීම, බයිබලයට එරෙහිවම කරන තර්ක කිරීමක් වන බව කිතුනුවන්ට නොවැටහෙන්නේද?

**සමිඳුන් සදාකන දෙවිඳුන් බවත් සකල ලෝකය මැවූ බවත් එතුමන්ට වෙහෙස මහන්සි නොදැනෙන බවත් එතුමන්ගේ ප්‍රඥාව අචින්ත්‍ය බවත් ඔබ දන්නේ නැද් ද? අසා නැද් ද?** (යෙසායා 40:28)

සර්වබලධාරී දෙවියන්වහන්සේට විඩාව හෝ මහන්සිය ඇති විය නොහැක. කරුණු එසේ නම් මෙයටත් වඩා දුර්වල ලක්ෂණයක් වන මරණය ජේසුස් වහන්සේ ට ඇති විය හැක්කේ කෙසේද?

**අමරණීය වූ අදෘශ්‍යමාන වූ සදාතන රජ වූ එකම දෙවියන් වහන්සේට ගෞරවයත් මහිමයත් සදහට ම වේ වා! ආමේන්.** (1 තිමති 1:17)

දෙවියන්වහන්සේට මරණය ඇති විය නොහැකි අතර ඔහු අදෘශ්‍යමානද වන්නේය යැයි මෙම වැකිය පවසයි. ජේසුස් වහන්සේ විෂයයෙහි මෙය අදාල වන්නේදැයි සිතා බැලිය යුතුය. කිතුනුවන්ගේ විශ්වාසය අනුව ජේසුස් වහන්සේ කුරුසයේ ඇණ ගසා මරණු ලැබූහ. එමෙන්ම සුභ අසුන් හතරෙහිම සඳහන් සිය ගනන් සාධක අනුව එතුමන් මිනිසුන්ට දෘශ්‍යමාන වෙමින් මිනිසුන් සමගම ජීවත් වූවෝය. මෙයින් පසුවත් කිතුනුවන් ජේසුස් වහන්සේ දෙවියන්වහන්සේ යැයි වාද කරත්ද?

'මරණයට පෙර ලොව ජීවත් වන කාල වකවානුවෙහි ජේසුස් වහන්සේ මිනිසෙකු වශයෙන් ජීවත් වූහ. නමුත් මරණයට පත් කිරීමෙන් පසුව එතුමන් නැවත නැගිටි පසු දෙවියන්වහන්සේ වශයෙන්ම නැගිට ගත්හ' යැයි කිතුනුවන් පූජකයන් පවසන බව අපි දනිමු. නමුත් මොවුන් පවසන එම නැවත නැගිටීමේ සිද්ධියෙන් පසුව ජේසුස් තුමන් තමා සාමාන්‍ය මිනිසෙකි යැයි පවසා ඇති සැටි බයිබලයේම සඳහන් වෙයි.

**ජේසුස් වහන්සේ ඇයට කථා කොට 'මා තවමත් පියාණන්වහන්සේ වෙත නො නැංග නිසා මට අත නොතබන්න. එනමුත් මගේ සොහොයුරන් වෙත ගොස් මම මගේ පියාණන් හා ඔබේ පියාණන්ද මගේ දෙවියන්වහන්සේ හා ඔබේ දෙවියන්වහන්සේද වෙත නැගෙන්නේමියි ඔවුන්ට දන්වන්නැ'යි පැවසූ සේක.** -යොහන් 20:17

මරණින් නැගිටි පසු කී ඉහත වැකියෙන් 'ඔබලාගේත් මාගේත් දෙවියන්වහන්සේ එකෙකි' යැයි ජේසුස් වහන්සේ පවසති.

**ඔවුන් මෙසේ කථා කරමින් සිටියදී ජේසුස් වහන්සේ හදිසියේම ඔවුන් අතරෙහි පෙනී සිට 'ඔබට ශාන්ති වේවා!' යි පැතූ සේක. තමන් අවතාරයක් දකිතියි සිතූ ඔවුහු ත්‍රාසයටත් භීතියටත් පත් වූහ. ජේසුස් වහන්සේ ඔවුන් අමතමින් 'ඔබ කැළඹී සිටින්නේ කිමිද? ඔබේ සිතේ සැකයට ඉඩ දෙන්නේ ඇයි? මාගේ අත් පා දෙස බලන්න. සැබවින්ම මේ මමයි. මට අත තබා බලන්න. ඔබට පෙනෙන ලෙස මා ගත මසෙන් ඇටෙන් සෑදී ඇති මුත් අවතාරයකට ඒවා නැතැ'යි පැවසූ සේක. එසේ පැවසූ එතුමාණෝ (ඇණ කැළැල් සහිත) සිය දෑතත් දෙපයත් ඔවුන්ට පෙන් වූ සේක. ප්‍රීතියත් විශ්මයත් නිසා ඔවුන් විශ්වාස කළ නො හැකිව සිටියදී ඔවුන් ඇමතූ එතුමාණෝ 'කෑමට යමක් මෙහි ඔබ ළඟ තිබේදැ'යි ඇසූ සේක. බදින ලද මාළු කැබැල්ලක් ඔවුන් ඔහුට පිළිගැන්වූයෙන් එය පිළිගත් එතුමාණෝ එය ඔවුන් ඉදිරියේදීම අනුභව කළසේක.** (ලූක් 24:36-43)

මරණින් පසු නැගිටින විටද ජේසුස් වහන්සේ මස් හා ඇටසැකිලිවලින් සැදුම් ලත් පුද්ගලයෙකුවම සිටියේය. තවද ආහාර සඳහා අයැද සිටියේය. ඒ අනුව එතුමන් බදින ලද මාළු අනුභව කර ඇත. තවද එතුමන්ව අනුගාමිකයන් දෑස්වලින් දැක බලා ඇත්තාහ. මේ කිසිවක් දෙවියන්වහන්සේගේ ලක්ෂණ නොවන බවට තර්කයක් නොමැත. මරණයට පෙර තිබූ සියළුම ලක්ෂණ එලෙසින්ම එතුමන්ට තිබුනු බවට මෙම වැකිය සාධක සපයයි.

## මරණින් පසු නැගිට ගත් තවත් අය

තවත් කෝණයකින් ගත් කල, ජේසුස් වහන්සේ පමණක් නොව තවත් පුද්ලයන්ද මරණින් පසු නැගිටීමේ 'ආශ්චර්යය' සිදු කර ඇත්තාහ.

**ඒනොක් දෙවියන් වහන්සේ සමග සුහදතාවයෙන් හැසුරුණේ ය. උන් වහන්සේ ඔහු රැගත් බැවින් අතුරුදහන් විය.** (උත්පත්ති 5:24)

**ඇදහිල්ලෙන් ඒනොක් මරණය නොවිඳ ගෙන යනු ලැබී ය.: දෙවියන් වහන්සේ ඔහු ගෙන ගිය බැවින් ඔහු ජීවතුන් අතර නොවී ය.** (හෙබ්‍රෙව් 11:5)

ජේසුස් තුමන් දෙවියන්වහන්සේ විසින් ගෙන්වා ගනු ලබන්නේ මරණින් පසුවය. නමුත් ඒනොක් ජීවතුන් අතර සිටියදීම දෙවියන්වහන්සේ ඔහුව තමා වෙත ගෙන්වා ගන්නේය. එසේනම් මොහු කිතුනුවන්ට වඩාත් ප්‍රබල පුද්ගලයෙකු විය යුතුයි නොවේද?

**තවද ඔවුන් කතා කරමින් යද්දී ගිනි අශ්ව රථයක් ද ගිනි අශ්වයෝ ද පෙනී ඔවුන් දෙදෙනා වෙන් කළෝ ය. එලියා සුළි සුළඟකින් ස්වර්ගයට නැගී ගියේය. එලිෂා ඒ දැක.** (2 රාජාවලිය 2:11 12)

එපමණක් නොව ජේසුස් තුමන් දෙවියන්වහන්සේ වෙත යනු කිසිවෙකු දැක නැති නමුත් එලියා දෙවියන්වහන්සේ විසින්ම එලොවට ගෙන යනු ලබනු තවත් දේව පණිවිඩකරුවෙකු වන එලිෂා දෑසින්ම දුටු බව බයිබලයේ සඳහන් වෙයි. ජේසුස් වහන්සේ එම සිද්ධියට කිසිදු සාක්ෂියක් නොමැති අතර එලියාගේ සිද්ධියට ප්‍රබල සාක්ෂියක්ද ඇත. ඒ අනුව දේවත්වයෙන් පිදීමට එලියා වඩාත් සුදුස්සෙකු වන්නේ නොවේද?

ඉහත අප ඉදිරිපත් කළ කරුණු අනුව ජේසුස් වහන්සේ මෙන්ම තවත් අයත් මරණින් පසු නැගිට ඇති බවත් ඔවුන් අතරින් ඇතැම් අය ජීවතුන් අතර සිටියදීම දෙවියන්වහන්සේ වෙත ගිය බවත් බයිබලයේ සඳහන් වන හෙයින් එහි ඇති සාධක අනුව වුවද ජේසුස් වහන්සේ ගේ එම සිද්ධිය සුවිශේෂී සිද්ධියක් හෝ කෙනෙකු දේවත්වයෙන් පිදීමට ප්‍රමාණවත් වන සිද්ධියක් යැයි සැලකිය නොහැකි බව සනාථ වේ.

## 7. සුවිශුද්ධ ආත්මයෙන් පිරී තිබෙන නිසා දෙවියන්වහන්සේ විය හැකිද?

සුවිශුද්ධ ආත්මයෙන් පිරී තිබුනු හෙයින් ජේසුස් තුමන් දෙවියන්වහන්සේගේ පුත්‍රයා යැයි කිතුනුවන් පවසති. නමුත් තවත් බොහෝ දෙනෙකු මෙලෙසින් සුවිශුද්ධ ආත්මයෙන් පිරී තිබුනු බව බයිබලයේම සඳහන් වෙයි. ජේසුස් වහන්සේ ට බෞතීස්ම කළ හා එතුමන්ගේ ගුරුවරයා ලෙසින් සිටි යොහාන් ගැන බයිබලය මෙසේ පවසයි.

**මව් කුස තුළ පටන් ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් පූර්ණ වනු ඇත.** (ලූක් 1:15)

**යොහාන්ගේ පියා වූ සෙකරියස් ශුද්ධාතමයාණන්ගෙන් පූර්ණව මෙසේ අනාවැකි පැවසීය.** (ලූක් 1:67)

**මරියාගේ ආචාර බස් ඇසුණු කල එලිසබෙත්ගේ කුසෙහි වූ දරුවා පිනුමක් පැන්නේය. එවිට ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වූ එලිසබෙත්.** (ලූක් 1:41)

ඉහත වැකි අනුව යොහාන් හා ඔහුගේ පියා වන සෙකරියා හා මව එලිසබෙත් යන සියල්ලෝම සුවිශුද්ධ ආත්මයෙන් පුරවන ලද අය වෙති. එසේ නම් මොවුන් දේවත්වයෙන් පුදන්නට කිතුනුවන් ඉදිරිපත් නොවීම අසාධාරණයි නොවේද?

**ජේසුස් වහන්සේ තුල තිබූ සුවිශුද්ධ ආත්මය ඇතැම් අවස්ථාවල ඔහු කෙරෙන් ඈත්වී ඇත. යක්ෂයා විසින්ද එතුමන් ඇතැම් අවස්ථාවල පරීක්ෂණයට ලක් කර ඇත.** (මතෙව් 4:1 10)

**මෙසේ බෞතීස්ම ලද විගස ජේසුස් වහන්සේ දියෙන් පිටතට ආ සේක. එකෙණෙහිම ස්වර්ගය විවර වී දෙවියන්වහන්සේගේ ආත්මයාණන් පරෙවි වෙසින් තමන් වෙත බැස එනු එතුමාණෝ දුටු සේක.** (මතෙව් 3:16)

ඉහත වැකිවලින් පෙනී යන්නේ විටෙක සුවිශුද්ධ ආත්මය ජේසුස් වහන්සේ වෙතින් ඉවත් වූ බව හා එය එතුමන්ට සුවිශුද්ධ ආත්මයෙන් පෙර නොතිබුනු බව හා එය පහළ වූ යේ ඥාණස්නානය කිරීමෙන් පසුවය යන වගයි. එපමණක් නොව යොවාන් සිය මවගේ ගර්භයේ සිටින විටම සුවිශුද්ධ ආත්මයෙන් පුරවනු ලබයි. එසේනම් දෙවියන්වහන්සේ ගේ පුත්‍රයා යැයි කිතුනුවන් විශ්වාස කරන්නට සූදානම් වන්නේ කවුරුන්වද? එයට වඩාත් සුදුස්සා, බයිබලයේ සඳහන් කරුණු අනුවම කවුරුන්ද යැයි අසනු කැමැත්තෙමු. මෙපමණක් නොව තවත් කොපමණ පුද්ගලයන් සංඛ්‍යාවක් තුල ශුද්ධ ආත්මය රැඳී තිබුණේදැයි බලන්න.

**මන්ද ඒ අවස්ථාවේදී කථා කරනු ඇත්තේ සැබවින්ම ඔබ නොවේ. ඔබගේ පියාණන්වහන්සේගේ ආත්මයාණෝ ඔබ තුලින් කථා කරන සේක.** (මතෙව් 10:20)

එසේ නම් සුවිශුද්ධ ආත්මයෙන් කථා කරන ජේසුස් වහන්සේ ගේ ගෝලයන්ද දෙවිවරුන්ද? ජේසුස් වහන්සේ පාවා දුන් යූදස්ද තෙවරක්ම ජේසුස් වහන්සේ ප්‍රතික්ෂේප කළ පේදුරු වැන්නන්ද සුවිශුද්ධ ආත්මයෙන් පුරවනු ලැබූ අයද?

**ඉශ්‍රායේල් සැනසීම එනම් ගැලවුම්කරුවාණන්ගේ පැමිණීම බලාපොරොත්තුවෙන් සිටි සිමියොන් නම් දැහැමි-සැදැහැවත් මිනිසෙක් එදවස් හි යෙරූසලමේ විසීය. ශුද්ධාත්මයාණන් ඔහු කෙරේ බල පෑ සේක.** (ලූක් 2:25)

'මේ කරුණුවලට අපි සාක්ෂිකාරයෝ වෙමු. දෙවියන් වහන්සේට කීකරු වන අයට ප්‍රදානය කර ඇති ශුද්ධාත්මයාණන් වහන්සේ ද අප සමග සාක්ෂිකාරයෙක් වන සේකැ'යි කීහ. (ක්‍රියා 5:32)

බාර්ණබස් වනාහී යහපත් වූ ද ශුද්ධාත්මයාණන්ගෙන් හා ශ්‍රද්ධාවෙන් පූර්ණ වූ ද මිනිසෙකි. මෙසේ මහත් සමූහයක් ස්වාමීන් වහන්සේ සරණ ගියහ. (ක්‍රියා 11:24)

මේ යෝජනා ගැන මුළු මහත් පිරිස සතුටු වූ හ. එවිට ඔවුහු ඇදහිල්ලෙන් හා ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ මිනිසෙකු වන ස්තේපත් ද ඔහු සමගම පිලිප් ද ප්‍රොකොරස් ද නිකනෝර් ද තිමෝන් ද පර්මෙනස් ද ජුදෙව් ආගමට හැරුණු අන්තියෝකියේ නිකොලොස් ද තෝරා ගත්හ. (ක්‍රියා 6:5)

'ඔබට බාර දෙන ලද අගනා සත්‍යය රැක ගන්න. අප තුළ වෙසෙන ආත්මයාණන්වහන්සේගේ සහයෝගයද ලැබ එය සුරකින්න' (ii තිමති 1:14)

මෙසේ සුවිශුද්ධ ආත්මයෙන් පුරවනු ලැබුවන් සීමාවකින් තොරව බයිබලයේ සඳහන්ව තිබෙන විට එය සඳහා ජේසුස් වහන්සේ පමණක් දේවත්වයෙන් පිදීම කෙසේ සාධාරණ වන්නේද?

අනෙක් අතට සුවිශුද්ධ ආත්මයෙන් පුරවනු ලබන්නේය යැයි කීමෙන් අදහස් වන්නේ කුමක්ද? දේවත්වය ලැබුනු බවට එය ලක්ෂණයක්ද? නිශ්චය වශයෙන්ම නැත.

දෙවියන්වහන්සේ ට අවනත වී තමන් ගැත්තන් ලෙසින් සලකන්නෝ කවුරුන්ද, සුවිශුද්ධ ආත්මයෙන් පුරවනු ලබන්නන් යැයි සලකනු ලබන්නේ ඔවුන්වය.

ඉහත සඳහන් ක්‍රියා 5:32 වැකියෙන් මෙය වටහා ගත හැක. අනෙක් අය 'සුවිශුද්ධ ආත්මයෙන් පුරවනු ලැබුවෝය' යන ප්‍රකාශය 'ඔවුන් යහපත් හා දැහැමි අය බවට පත්වූවෝය' යයි නිවැරදිව වටහා ගන්නා කිතුනුවන් එයම ජේසුස් වහන්සේ සඳහා යොදනු ලබන විට එයට දැවැන්ත හා ඇදහිය නොහැකි වෙනසක් ඇති විග්‍රහයක් දෙන්නේ ඇයි? මෙසේ කිරීම සඳහා ඔවුන් වෙත යම් විශේෂ සාධකයක් තිබේද?

තවත් කරුණක් වෙත අප කිතුනුවන්ගේ සැලකිල්ල යොමු කරනු කැමැත්තෙමු. එනම් ශුද්ධාත්මයෙන් පුරවනු ලැබීම නිසා අන් අයට යම් ලෙසකින් දේවත්වය ආරූඩකළද, ජේසුස් වහන්සේ ට එවැන්නක් කිසිසේත් කළ නොහැකිය යැයි බයිබලයම පවසන සැටි බලන්න.

**පරීක්ෂා කරනු ලබන කල 'මා පොළඹවන්නේ දෙවියන් වහන්සේ ය' යි කිසිවෙක් නොකියා වා.** (යාකෝබ් 1:13)

නමුත් ජේසුස් වහන්සේ කිහිප විටක්ම යක්ෂයා විසින්ම පරීක්ෂණයට ලක් කරන ලද්දේ යැයි බයිබලයේ (මතෙව් 4:1-10) සඳහන් වෙයි.

මෙ අනුව ජේසුස් තුමන් සුවිශුද්ධ ආත්මයෙන් පුරවනු ලැබුවද, යක්ෂයා විසින්ද එතුමන් පරීක්ෂණය කරනු ලැබූහ. මෙසේ යක්ෂයා විසින් පරීක්ෂණයට ලක් කරනු ලබන්නන් දෙවියන්වහන්සේ විය නොහැකිය යැයි බයිබලයේම සඳහන් වී තිබෙන විට ජේසුස් තුමන් දෙවියන්වහන්සේ යැයි පිළිගැනීමෙහි අබමල් රේණුවක හෝ සාධාරණත්වයක් තිබේද?

එනිසා කුඩා කල සිටම තමන්ට කියනු ලැබූ කතන්දර පසෙක ලා මධ්‍යස්ථ මනසින් යුතුව බයිබලය නිරීක්ෂණය කිරීමට කිතුනුවන් දැන්වත් ඉදිරිපත් විය යුතුය. එවිට ජේසුස් තුමන් දෙවියන්වහන්සේ හෝ දෙවියන්වහන්සේගේ පුත්‍රයා නොව දෙවියන්වහන්සේගේ ඉතා දැහැමි ගැත්තකු හා විශේෂ පණිවිඩකරුවෙකු හා මිනිසෙකු ලෙසින්ම සිටි උතුමෙකුය යන සත්‍යය ඔවුන්ට පැහැදිලිවම පෙනෙනු ඇත.

# දෙවෙනි කොටස

# දෙවියන්වහන්සේගේ ලක්‍ෂණ

දෙවියන්වහන්සේට හා මනුෂ්‍යයන්ට ඇති ගති ලක්‍ෂණ වෙන් වශයෙන් බයිබලයේ විග්‍රහ කර ඇත. දෙවියන්වහන්සේ සඳහා දක්වා ඇති කිසිදු ලක්‍ෂණයක් ජේසුස් තුමන්ට ගැලපෙන්නේ නැත. එපමණක් නොව මිනිසෙකු සඳහා දක්වා ඇති සියළුම ලක්‍ෂණ එතුමන්ට කදිමට ගැලපෙනුද දැකිය හැකිය.

## 1. දෘශ්‍යමාන වීම දේව ලක්‍ෂණයක් නොවේ

**'කිසිවෙක් කිසිකලෙක දෙවියන්වහන්සේ දුටුවේ නැත.** (යොහාන් 1:18)

දෙවියන්වහන්සේ කිසි විටෙක කෙනෙකුට දෘශ්‍යමාන නොවේ යැයි බයිබලය පවසයි. නමුත් ජේසුස් වහන්සේව දහස් ගනන් මිනිසුන් දැක ඇත්තාහ. කිතුනුවන්ගේ මතය අනුව ඔවුන් මරණයට පත්වී නැවත පැමිණි විටද මිනිසුන් එතුමන් හොඳින් දුටුහ. මේ අනුවම ජේසුස් තුමන් කිසිසේත් දෙවියන්වහන්සේ විය නොහැකිය යන කරුණ සැකයෙන් තොරව සනාථ වේ.

## 2. දෙවියන්වහන්සේට ලේ හෝ මාංශ නොමැත

දෙවියන්වහන්සේට ලේ, ඇට, මස්, නහර කිසිවක් තිබිය නොහැකි අතර දෙවියන්වහන්සේ පවතින්නේ ආත්මයක ස්වරූපයෙන් යැයි බයිබලය පවසයි.

**දෙවියන්වහන්සේ අදෘශ්‍යමාන ජීවාත්මයක් නිසා...** (යොහාන් 4:24)

ඉහත වැකියේ සඳහන් ලක්‍ෂණ සමග ජේසුස් වහන්සේ ගැලපුනේද? නැත යැයි බයිබලය ස්ථිරවම ප්‍රකාශ කරයි. එතුමන්ගේ මුළු ජීවිත කාලය පුරාම එතුමන් ඇට, කටු හා ලේ මස් නහරවලින් හෙබි සාමාන්‍ය මිනිසෙකු ලෙසින්ම ජීවත් වූහ. එතුමන් කුරුසයේ ඇණ ගසනු ලැබූ විටද එතුමන්ගේ තත්ත්වය මෙලෙසින්ම වූයේ යැයි කිතුනුවන් පිළිගනිති. එපමණක් නොව ජේසුස් වහන්සේ ගේ රුව අඳින විටද ලොව පුරා ජීවත් වන කිතුනුවන් එය ලේ පෙරන ආකාරයෙන්ම අඳිති.

**'ඔබ කැළඹී සිටින්නේ කිමිද? ඔබේ සිතේ සැකයට ඉඩ දෙන්නේ ඇයි? මාගේ අත් පා දෙස බලන්න. සැබවින්ම මේ මමයි. මට අත තබා බලන්න. ඔබට පෙනෙන ලෙස මා ගත මසෙන් ඇටෙන් සෑදී ඇති මුත් අවතාරයකට ඒවා නැතැ'යි පැවසූ සේක. එසේ පැවසූ එතුමාණෝ (ඇණ කැළැල් සහිත) සිය දෑතත් දෙපයත් ඔවුන්ට පෙන් වූ සේක.** (ලූක් 24:38)

මළවුන්ගෙන් නැගිටි පසුද එතුමන් ජීවත්වූයේ මිනිසෙකු ලෙසිනි.

## 3. මුලා වීම දෙවියන්වහන්සේ ගේ ලක්ෂණයක් නොවේ

**දුදනන් නිදෙස් කරන මිනිසා ද සුදනන් සදෙස් කරන මිනිසා ද සමිඳුන්ට එකසේ පිළිකුලකි.** (හිතෝපදේශ 17:15)

යහපත් පුද්ගලයෙකුට අයුතු චෝදනා නැගීමද දුෂ්ටයෙකු නිදොස් කිරීමද දෙවියන්වහන්සේට ඉතා පිළිකුල් සහගත ක්‍රියාවන් යැයි දෙවියන්වහන්සේ පවසයි. මෙම ලක්ෂණය ජේසුස් වහන්සේ ට තිබුනේදැයි බලන කල එසේ නොතිබුනු බව පැහැදිලි වෙයි.

**'සාතන් මා පස්සට යව'යි බෙනෙමින් හැරුණු ජේසුස් වහන්සේ, 'නුඹ මට බාධක කඩුල්ලකි. නුඹ සිතන්නේ මිනිස් සිතුවිලි අනුව විනා දෙවියන්වහන්සේගේ කාරණා ගැන නොවේය'යි ඔහුට පැවසූ සේක. (මතෙව් 16:23)**

මෙහි පේදුරු නමැත්තා ගැන ජේසුස් වහන්සේ ඇතැම් ඇගයීම් කරනු දැකිය හැකිය. එපමණක් නොව තමන්ව පේදුරු ප්‍රතික්ෂේප කරනු ඇත යැයි ජේසුස් වහන්සේ පැවසූ බව සුබ අසුන් හතරෙහිම සඳහන් වෙයි. එවැනි දුර්ජනයෙකුට ජේසුස් වහන්සේ හිමි කරදුන් තත්ත්වය කෙබඳු එකක්දැයි අප මොහොතකට විමසා බලමු.

**'ස්වර්ග රාජ්‍යයේ යතුරු මම ඔබට දෙන්නෙමි. පොළොවේදී ඔබ යමක් බඳින්නේද ස්වර්ගයේද එය බඳිනු ලැබේ. පොළොවේ ඔබ යමක් මුදන්නේද ස්වර්ගයේද එය මුදනු ලැබේ' යැයි පැවසූ සේක.** (මතෙව් 16:19)

පේදුරුටත් වඩා යහපත් ගෝලයන් කිහිප දෙනෙකුම සිටින අතරම පේදුරු නිසි ඇගයීමකට ලක් නොකර ඔහු සුදුසු නොවන උසස් දිව්‍යමය රාජකාරීන් කිහිපයක්ම ජේසුස් වහන්සේ ඔහුට පොරොන්දු වෙති. මෙවැනි දැවැන්ත වැරදීමක් දෙවියන්වහන්සේට සිදුවිය හැකිද? මෙයින්ද ජේසුස් වහන්සේ දේවත්වයේ ලක්ෂණ තිබුනු කෙනෙකු නොවන බව පැහැදිලි වේ.

## 4. අස්ථිර බව දේව ලක්ෂණයක් නොවේ

දෙවියන්වහන්සේ යනු අනාදිමත්ය. එනම් ඔහුට ආරම්භයක් හෝ අවසානයක් තිබිය නොහැකිය.

**සමිඳාණෝ සිහසුන් අරා සදා වැඩ සිටින සේක. විනිශය පිණිස සිය සිහසුන පිහිට වූ සේක.** (ගීතාවලිය 9:7)

ජේසුස් වහන්සේ ට නැවත පණ ලැබීම පිළි ගත්තද මරණයට හා නැවත නැගිටීම අතර දින තුනක් එතුමන් කොහිත් 'නොසිටියහ.' මෙයින් එතුමන් සදාකාලිකව සිටින්නෙක් නොවන බවට බයිබලයම දෙස් දෙයි.

## 5. මරණයට පත්කරනු ලැබීම දේව ලක්ෂණයක් නොවේ

දෙවියන්වහන්සේව කිසිවෙකු විසින් ඝාතණය කළ නොහැක. එසේ ඝාතණය කරනු ලබන්නෙක් දෙවියන්වහන්සේ විය නොහැක.

**නුඹ දෙවි කෙනෙකු නොව නුඹ සතුරන් අතට අසු වී හුදෙක් මිනිසෙකු ව සිටින නමුත් නුඹව මරා දමන්නන් ඉදිරියෙහි 'මම දෙවි කෙනෙක් මී' යි එවිටත් නුඹ කියා සිටින්නෙහි ද?** (එසකියෙල් 28:9)

**අප පියවරුන්ගේ දෙවියන් වහන්සේ ඔබ විසින් කුරුසයක එල්ලා මරණයට පත් කළ ජේසුස් වහන්සේ උත්ථාන කොට වදාළ සේක.** (ක්‍රියා 5:30)

මරණයට පත් කරනු ලැබීමෙන් පසු තමා දෙවියන්වහන්සේ විය නොහැකි යැයි ජේසුස් වහන්සේ විසින්ම ප්‍රකාශ කර තිබෙන විට කිතුනුවන් එතුමන්ට දෙවියන්වහන්සේ යැයි කෙසේ කියන්නෝද?

## 6. දෙවියන්වහන්සේ දුකට හෝ සන්තාපයට පත් නොවෙති

දෙවියන්වහන්සේ කිසිදු දුකක් හෝ කරදරයක් ඇති විය නොහැකිය යන කරුණ බයිබලය පමණක් නොව එය සාමාන්‍ය නුවණට පිළිගැනෙන කරුණකි.

**දැමිටුන්ට බොහෝ ආපද ඇතත් හිමි තුමාණෝ ඒ සියල්ලෙන් ඔවුන් මුද හරින සේක.** (ගීතාවලිය 34:19)

නමුත් ජේසුස් වහන්සේ දුක් ගැහැට අසීමිත ලෙසින් විදි කෙනෙකි. එපමණක් නොව, එම දුක් ගැහැට ඉවසා ගත නොහැකිව එයින් තමා මුද ගන්නා ලෙසද ජේසු තුමන් දෙවියන්වහන්සේට කන්නලව් කරයි.

**'දැන් මාගේ සිත කැළඹී ඇත. ඕ මම කුමක් කියම්ද? 'පියාණෙනි, මේ අවස්ථාවෙන් මා මුද ගත මැනවැ'යි කියන්නද? එසේ කිව නොහැක. මා මේ අවස්ථාවට පැමිණියේ හුදෙක්ම මේ බැරෑරුම් තත්ත්වයට මුහණ දීමටයි.** (යොහන් 12:27)

**ඉන්පසු එයින් මඳක් ඔබ්බට ගිය එතුමාණෝ බිම වැටී මුහුණ බිම ඔබා යාච්ඤා කරමින් 'මාගේ පියාණෙනි කළ හැකි වේ නම් මේ ඛේදනීය කුසලානය මවෙතින් ඉවත් කළ මැනව. එනමුත් මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්තම ඉටු වේවා' යි කී සේක.** (මතෙව් 26:39)

**එවිට ඔව්හු උන් වහන්සේගේ මූණට කෙළ ගසා උන් වහන්සේට අතුල් පහරක් දුන්හ. සමහරෙක් අතුල් පහර දී 'ක්‍රිස්තුවරයාණෙනි ඔබට ගැසුවේ කවරෙක් දැයි දිවැසින් බලා අපට කියන්නැ' යි කීහ.** (මතෙව් 26:67)

**ඔවුහු එතුමන් යදමින් බැඳ ගෙන ගොස් ආණ්ඩුකාර පිලාත්ට බාර දුන්හ.** (මතෙව් 27:2)

**ඉන්පසු ඔවුනට බරබ්බස් නිදහස් කර දුන් පිලාත් ජේසුස් වහන්සේ ට තලවා කුරුසියේ ඇණගසන්නට බාර දුන්හ. ඉන්පසු ආණ්ඩුකරුගේ හේවායෝ ප්‍රෙතෝරියම් නම් වූ ආණ්ඩුකාර මූලස්ථානයට ජේසුස් වහන්සේ ගෙන ගොස් මුළු හේවා සේනාංකයම රැස් කරවා එතුමාණන් වටකොට ගත්හ.** (මතෙව් 27:26-27)

**ඉන්පසු කටු ඔටුන්නක් ගොතා එය එතුමාණන්ගේ හිස මත පැළඳවූහ. ඉන්පසු බට දණ්ඩක් එතුමාණන්ගේ සුරතෙහි තැබූ ඔවුහු එතුමන් අබියස දණ ගසා එතුමන්ට සමච්චල් කරමින් යුදෙව්වන්ගේ රජ දිනේවායි පැවසූහ.** (මතෙව් 27:29-30)

**ඔවුහු එතුමාණන් කුරුසපත් කොට ඉන්පසු දදු දමා එතුමාණන්ගේ ඇඳුම් බෙදා ගත්හ.** (මතෙව් 27:35)

**සවස තුනට පමණ 'ඒලි ඒලි ලාමා සබක්තානී?' යි පැවසූහ. එහි අරුත 'මාගේ දෙවියනි මාගේ දෙවියනි ඔබ මා අත්හැරියේ මන්ද?' යනුයි.** (මතෙව් 27:46)

තවද ජේසුස් වහන්සේ එතුමන්ගේ ජීවිතයේ කිව නොහැකි දුක් කරදර විඳි කෙනෙකු බව සුබ අසුන් හතරෙහිම සඳහන් වෙයි. අප ඉහත සඳහන් කර ඇති වැකිවලින් විස්තර වන්නේ ජේසුස් වහන්සේ එතුමන්ගේ මෙලොව ජීවිතයේ අවසන් දින කිහිපයක විඳි ගැහැට ගැන පමණී. තවද එතුමන්ගේ සතුරන් විසින් ඉතා නීච හා පහත් ආකාරයෙන් එතුමන් සලකනුද ලැබූහ. 'මා අත් හැරියේ මන්ද මාගේ දෙවියනි?' යැයි එතුමන් පවසන තරමට එතුමන්ට දුක් කරදර ඇති වී යැයි බයිබලය පවසයි.

මේ අනුව දෙවියන්වහන්සේ යනු කිසිදු අසීරුතාවයකට හෝ දුකකට පත් නොවන්නෙකු යැයි බයිබලය දෙවියන්වහන්සේගේ ගති ලක්‍ෂණ ගැන විස්තර කරන හෙයින් හා එම ගති ලක්‍ෂණ ජේසුස් වහන්සේ ට නොතිබුනු හෙයින් එතුමන්ට දෙවියන්වහන්සේ යැයි කීම කෙසේ කළ හැක්කේදැයි කිතුනුවන් සිතා බැලිය යුතුය.

මෙම කරුණු අනුව ජේසු තුමන් දෙවියන්වහන්සේ යැයි විශ්වාස කිරීමට කිතුනුවන් විසින් ඉදිරිපත් කරන මෙම තර්කද බිඳ වැටෙන්නේය.

## 7. දෙවියන්වහන්සේ කිසි විටෙක වරදක් නොකරයි

දෙවියන්වහන්සේ යනු කිසි විටෙක අපරාධයක් හෝ වරදක් කරන කෙනෙකු නොවිය යුතු යැයි බයිබලය දෙවියන්වහන්සේ පිළිබඳ තවත් ගති ලක්‍ෂණයක් මෙසේ සඳහන් කරයි:

**සමිඳුන්හට තුති පුදන්න. මන්ද එතුමාණෝ යහපත් ය.** (1 වංශාවලිය 16:34)

මෙම සුදුසුකම තමාට නැත යැයි ජේසුස් වහන්සේ ම පවසා තිබීම බයිබලයේ මෙසේ සඳහන් වෙයි:

**එතුමාණෝ පිළිතුරු දෙමින් 'යහපත් ය කියා මා අමතන්නෙ මන්ද? දෙවියන්වහන්සේ හැර අන් කිසිවෙක් යහපත් නැත'.** (මාර්ක් 10:18)

## 8. දෙවියන්වහන්සේ නොදැනුවත්කම නම් දුබලත්වයෙන්ද සුවිශුද්ධය

කිසිදු කරුණක් හෝ දෙයක් පිලිබඳ දෙවියන්වහන්සේ නොදැනුවත් විය නොහැක. මන්ද සියල්ල නිර්මාණය කරන්නේද සියල්ල සැලසුම් කරන්නේද සර්වබලධාරී දෙවියන්වහන්සේ විසින් වන බැවිනි. වෙනෙකක් තබා මිනිසුන්ගේ සිතේ අභ්‍යන්තරයේ ඇති වන සිතුවිලි පවා දෙවියන්වහන්සේ අසන්නේය. බයිබලයද මෙලෙසින්ම පවසයි.

**සෑම මනුෂ්‍යයෙකුගේ ම සිත් ඔබ පමණක් දන්නා සේක.** (1 රාජාවලිය 8:39)

මිනිසුන්ගේ සිතේ සැඟවී තිබෙන දෙය කෙසේ වෙතත් පිටතින් ඇති ඇතැම් දේ පවා ජේසුස් වහන්සේ නොපෙනුනු අවස්ථා ඇති බවට බයිබලයම දෙස් දෙන සැටි බලන්න:

**'මට අත ගැසුවේ කවරෙක්ද'යි ජේසුස් වහන්සේ ප්‍රශ්න කළ සේක.** (ලූක් 8:45)

**පසුදින අළුයම උදයේ ආපසු නගරයට එමින් සිටින අතරේ එතුමාණන්ට කුසගිනි දැනිනි. මග අසල වූ අත්තික්කා ගසක් දුටු එතුමාණන් එතැනට ගිය නමුදු එහි කොළ මිස අන් කිසිවක් නොවිණි. එවිට එතුමාණෝ 'යළි කිසි දිනෙකත් නුඹ එල නොදරනු ඇතැ' යි ඒ ගසට පැවසූහ. එසැනින් ඒ ගස වියැලී ගියේය.** (මතෙව් 21: 18 19)

**ජේසුස් වහන්සේ පිළිතුරු දෙන සේක් 'සත්තකින්ම මම ඔබට කියන්නම්. සියල්ල අළුත් වූ කල්හි මනුෂ්‍ය-පුත්‍රයාණන් ස්වර්ගික තේජෝමහිමයෙන් යුතුව තම සිහසුනෙහි වැඩ හිඳින කල මා අනුව ආ ඔබත් ඉශ්‍රායේල් ගෝත්‍ර දොළොස විනිශ්චය කරමින් සිහසුන් දොළොසක් මත හිඳගනු ඇත.** (මතෙව් 19:28)

නමුත් එම ගෝලයින් දොළොස් දෙනෙකුගෙන් කෙනෙකු තමන්ව පාවා දෙනු ඇත යන කරුණ පවා ජේසුස් වහන්සේ එවිට දැන නොසිටියහ.

**'ඒ දවස ගැනවත් ඒ පැය ගැනවත් කිසිවෙක් හෝ නොදනිති. ස්වර්ගයේ**

**දේව දූතයෝ පවා නොදනිති. පුත්‍රයාණන්වත් නො දනිති. පියාණන්වහන්සේ පමණක් එය දන්නා සේක'. (මාර්ක් 13:32)**

මෙලෙසින් සැඟවුනු මෙන්ම නොසැඟවුනු කරුණු ගනනාවක් ගැන ජේසුස් වහන්සේ නොදැන හා ව්‍යාකූලව සිටි බව පවසන්නේ අප නොව බයිබලයමයි.

ගැත්තන් රැකීම පිණිස සියළු දේ පිළිබඳ දෙවියන්වහන්සේ දැන සිටීම අත්‍යවශ්‍ය වනවා නිසැකය. නමුත් තම සිරුරට අත තැබුවේ කවුද යන කරුණ පවා අනුන්ගෙන් අසන තත්ත්වයේ දැනුමක් පමණකි ජේසුස් වහන්සේ ට දෙනු ලැබ තිබුණේ.

## 9. දෙවියන්වහන්සේ නිදා නොගනියි

**ඉශ්රායේල් ජාතියේ රැකවරණයාණන් හට නිදි බරවීමක්වත් නිදගැනීමක් වත් නැත්තේ ය. (ගීතාවලිය 121:4)**

**හදිසියේම රළ පෙළින් ඔරුව වැසී යන තරම් වූ චණ්ඩ කුණාටුවක් විළ ඔස්සේ හැමීය. එහෙත් ජේසුස් වහන්සේ නිදමින් සිටියහ. (මතෙව් 8:24)**

මිනිස් දිවියක් ගතකළ ජේසුස් වහන්සේ දිනපතා නිද ගත් බව අපට සලකා ගත හැකි නමුත් බයිබල් වැකියකින්ද මෙම දෛනික සිදුවීම සනාථ වෙයි.

## 10. දෙවියන්වහන්සේ පව් කරන්නෙක් විය නොහැකිය

**තමාව කුරුසයේ ඇණ ගසනු ලැබීමෙන් ඇති විය හැකි මරණයෙන් ගලවා ගන්නා මෙන් ජේසුස් තුමන් ප්‍රාර්ථනා කර ඇත. (මතෙව් 26:38-45 මාර්ක් 14:36 ලූක් 22:44)**

**දෙවියන්වහන්සේ අසත්පුරුෂයින්ගේ කන්නලව් අසන්නෙ නැති බව අප දන්නවා. එනමුත් උන්වහන්සේට විශ්වාසවන්තයින්ව වැඩ කරන ශ්‍රද්ධාවන්තයින්ගේ ඉල්ලීම ඉෂ්ට කරන බව කවුරුත් දන්නවා. (යොහාන් 9:31)**

ජේසු තුමන්ගේ ප්‍රාර්ථනය දෙවියන්වහන්සේ විසින් පිළි ගනු නොලැබීමෙන් ගම්‍ය වන්නේ කුමක්ද?

එයින් පෙනී යන්නේ එතුමන් වැරදි කර ඇති බව හා එතුමන් පූර්ණ අන්දමින් වැරදිවලින් තොර පුද්ගලයෙකු නොවන බව නොවේද?

## 11. දෙවියන් හනික කිපෙන්නෙක්ද?

**කෝපයට පමා වන්නා ඉතා නුවණැති කෙනෙකි. වහා කිපෙන්නා සිය මෝඩකම විදහා පාන්නේ ය. (හිතෝපදේශය 14: 29)**

ක්ෂණයකින් කෝපයට පත් නොවිය යුතුය යන මෙම උපදෙස ජේසුස් වහන්සේ කිහිප විටක්ම උල්ලංඝණය කර ඇත.

**'එම්බා පොළොං පැටවුනි දුෂ්ට වූ නුඹලා යහපතක් පවසන්නේ කෙසේද?'** (මතෙව් 12:34)

**'දුෂ්ටවූත් ද්‍රෝහිවූත් පරම්පරාවක් අනුහස් ලකුණක් ඉල්ලයි.** (මතෙව් 12:39)

**ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් 'දරුවන්ගේ ආහාර ගෙන බල්ලන්ට විසිකිරීම යුතු නැතැ'යි කී සේක.** (මතෙව් 15:2)

**'සර්පයිනි පොළොං පැටවුනි'.** (මතෙව් 23:33)

මෙසේ සැහැසි වචන භාවිතා කරමින් සන්සුන් ශාන්ත බව ජේසුස් වහන්සේ අත්හැරි අවස්ථා ගැන බයිබලයේ කොතෙකුත් සඳහන් වේ. එසේ නම් එතුමන්ට දෙවියන්වහන්සේ යැයි කිව හැකිද?

## 12. දෙවියන්වහන්සේට කුසගිනි හා පිපාසය ඇතිවේද?

**ප්‍රීතියත් විශ්මයත් නිසා ඔවුන් විශ්වාස කළ නො හැකිව සිටියදී ඔවුන් ඇමතූ එතුමාණෝ 'කෑමට යමක් මෙහි ඔබ ළඟ තිබේදැ'යි ඇසූ සේක. බදින ලද මාළු කැබැල්ලක් ඔවුන් ඔහුට පිළිගැන්වූයෙන් එය පිළිගත් එතුමාණෝ එය ඔවුන් ඉදිරියේදීම අනුභව කළසේක.** (ලූක් 24:41-43)

**(ජේසුස් වහන්සේ) 'මට හරි පිපාසයැ'යි පැවසූ සේක** (යොහාන් 19:28)

එතුමන් කෑම අනුභව කරන්නෙකු පමණක් නොව එය රසවිඳිමින් අනුභව කරන්නෙකුව සිටියේ යැයි බයිබලය කියයි. 'ආහාරවලට ගිජු පුද්ගලයෙක්' යැයි (මතෙව් 11:19) එහි සඳහන් වෙයි.

## 13. දෙවියන්වහන්සේ මළපහ කරයිද?

මුවෙන් ඇතුල් කරනු ලබන සියල්ල පසු ද්වාරයෙන් පිටවනු ඇති බව ජේසුස් වහන්සේ පවසති. ආහාර අනුභව කරන මිනිසෙකු ලෙසින් ජීවත්වූ එතුමන්ද මෙසේ එය පිට කළ බවට තර්කයක් තිබිය නොහැක. එසේ මළපහ කරන්නෙකු සර්ව බලධාරි දෙවිකෙනෙකු විය හැකිද?

## 14. දෙවියන්වහන්සේ තමන්ව විශ්වාස කළ කෙනෙකු අත් හරියිද?

ජේසුස් වහන්සේ ව බව්තීස්ම කළ ගුරුන් වන යොහන් සිරභාරයේ සිටින බව දැනත් (මතෙව් 4:12) ඔහු මුදා ගැනීම සඳහා කිසි වෑයමක් ජේසුස් වහන්සේ නොගත්තේය.

තමාව බව්තීස්ම කළ යොහන් සිරගතව සිටින බව දැන දැන ඒ ගැන කිසිවක් නොකර ජේසුස් වහන්සේ ගලීලියෙන් පිටවී යති. ඔහු මුද ගැනීමට හෝ එසේත් නැතිනම් යොහන්ගේ පවුලේ අයට උදව් කරනු පිණිස හෝ ජේසුස් වහන්සේ එහි රැඳී සිටියේ නැත.

## 15. දෙවියන්වහන්සේට බිය හෝ සන්ත්‍රාසයක් ඇතිවිය නොහැක

සර්වබලධාරී දෙවියන්වහන්සේට කිසිම බියක් නැත. ඔහු එවැනි මනුෂ්‍ය දුබලතා අභිබවා සිටින්නෙකි. 'බිය' යන හැඟීම පවා දෙවියන්වහන්සේගේ එක් නිර්මාණයක් හෙයින් එයට ඔහු යටපත් විය යුතු නැත. නමුත් විටෙක බදු එකතු කරන්නන්ට බියෙන් බදු ගෙවා දමන මෙන් ජේසුස් වහන්සේ උපදෙස් කර ඇත.

**ජේතෘස් ගෙට වන් කල ඔහු කථා කරන්නට කලින් ඔහු ඇමතූ ජේසුස් වහන්සේ ණී 'සිමොන් හොඳයි ඔබ සිතන්නේ කුමක්ද? මිහිපිට රජුන් අය බදු හා වරිපනම් අය කරන්නේ තමන්ගේම පුතුන්ගෙන්ද? නැතිනම් අන්‍යයන්ගෙන්දැ'යි ඇසූ සේක. 'අන්‍යයන්ගෙනි'යි ජේතෘස් පිළිතුරු දුණි. 'එසේ නම් පුත්‍රයින් ඉන් නිදහස්' යයි අදහස් දැක්වූ ජේසුස් වහන්සේ 'එසේ වුවත් අප ඔවුන්ට බාධාකළ යුතු නැහැ. එනිසා විලට ගොස් බිලි බා මුලින්ම හසුවන මාළුවා ගන්න. උගේ මුව ඇරිය විට, ඔබගේත් මගේත් බද්ද ගෙවන්න සරිලන කාසියක් ඔබට හමුවෙයි. එය ගෙන ගොස් ඔබේත් මගේත් බද්ද ගෙවන්නැ'යි කී සේක.** -මතෙව් 17:25-27

පිට දේශක්කාරයින්ගෙන් පමණක් බදු ගැනීමේ සිරිතක් තිබෙන විටම එකල පාලකයින් රටවැසියන්ගෙන්ම බදු ගැනීමේ නීතිවිරෝධී ක්‍රියාවක් කරන්නට පටන් ගත්හ. එයට අවනත නොවීමෙන් හිරිහැර ඇති විය හැකි යයි බියට පත්වන ජේසුස් වහන්සේ " එය ගෙවා දමන මෙන් උපදෙස් කළා මිස සාපරාධී ලෙසින් පාලකයන් පැනවූ නීතියකට එරෙහිව නොබියවසටන් කිරීමට ඉදිරිපත් නොවූහ. බදු නොගෙවීමෙන් ඇති විය හැකි ප්‍රතිවිපාක ගැන බියවී එයට අවනත වූහ. අන් ලෙසකින් කිවහොත් යුදෙව්වන් විසින් තමාට හිරිහැර ඇති වේදෝ යැයි ජේසුස් වහන්සේ බියට හා දුකට පත් වී ඇත්තාහ. බිය වීම හා දුක් වීම දේව ගති ලක්ෂණදැයි අප පොදුවේ අසනු කැමැත්තෙමු. -

**ගෝලයින්ට ජේසුස් වහන්සේ 'මා යාච්ඥාවේ යෙදෙන අතර ඔබ මෙහි හිඳ සිටින්නැ'යි පැවැසූ සේක. ජේතෘස්, යාකොබ් හා යොහන්ද කැටිව ඉදිරියට ගිය එතුමාණෝ අතිශයින්ම සංවේගයට හා පීඩාවට පත්ව ඔවුන් අමතමින් 'මා මැරෙන තරමටම මාගේ ජීවය ඉමහත් ශෝකයෙන් මිරිකෙයි. මා සමග මෙහි නැවතී අවදිව සිටින්නැ'යි කී සේක.** -මාර්ක් 14:32-34

**එකෙනෙහිම යුදෙව්වෝ එතුමන්ට ගසනු පිණිස ගල් අවුලා ගත් නමුත් ජේසුස් වහන්සේ ඔවුන්ගෙන් මුවා වී දෙව් මැදුරු බිමෙන් බැහැර වූ සේක** -යොහන් 8:59

**එබැවින් ජේසුස් වහන්සේ තව දුරටත් යුදෙව්වන් අතර ප්‍රසිද්ධියේ නො ගැවසී පාළුකරයට යාබද එප්‍රායිම් නම් ගම්මානයට ගොස් සිය ගෝලයින් සමග එහි නැවතී සිටි සේක.** -යොහන් 11:54

යුදෙව්වන් තමා සොයති යැයි දැන ගත් විට ජේසුස් වහන්සේ ට ඇති වන භීතිය සුළුපටු එකක් නොවේ. 'මරණය සමාන දුකකින් වෙලී සිටිමි' යැයි මේ පිළිබඳ එතුමන්ම පවසති. තවද තමා ජප කරන විට කිසිවෙකු තමාව ග්‍රහණය කර ගැනීම වළක්වා ගනු පිණිස නොනිදා මුර කරමින් සිට උදව් වන මෙන්ද ජේසුස් වහන්සේ සිය ගෝලයින්ගෙන් ඉල්ලා ඇත. යුදෙව්වන්ගෙන් ගැලවීම සඳහා අඳුර සොයාද කැලය සොයාද තවත් නගරයක් සොයාද ජේසුස් වහන්සේ පලා ගොස් ඇත යනාදී වශයෙන් මෙම වැකි පෙළ පවසයි.

තමා රැක ගන්නා මෙන් මිනිසුන්හට කන්නලව් කිරීමද මිනිසුන්ට බියෙන් ගම රට අත හැර පලා යාමද දෙවියන්වහන්සේ කරනු ඇතිද?

## 16. දෙවියන්වහන්සේ යක්ෂයා විසින් පරීක්ෂණයට ලක් කරනු ලබයිද?

**ඉන්පසු ජේසුස් වහන්සේ යක්ෂයා විසින් පරීක්ෂා කරනු ලබනු පිණිස ආත්මයාණන් වහන්සේ විසින් පාළුකරයට ගෙන යනු ලැබූ සේක.** -මතෙව් 4:1

## 17. දෙවියන්වහන්සේ මන්දෝත්සාහී වනු ඇතිද?

.**ජේසු වහන්සේ පිළිතුරු දෙමින් 'සිවලුන්ට ගුහාත් අහසේ පක්ෂීන්ට කැදළිත් තිබේ. එහෙත් හිස තැබීමට හෝ තැනක් මනුෂ්‍ය-පුත්‍රයාණන්ට නැතැ' යි කී සේක.** (මතෙව් 8:20)

## 18. ක්‍රමක්‍රමයෙන් වර්ධණය වීමක් දෙවියන්වහන්සේට තිබේද?

දරුවා වැඩි ශක්තිමත්ව ප්‍රඥාවෙන් පූර්ණව දෙවියන්වහන්සේගේ ප්‍රසාදයට පාත්‍රව සිටියේය.

**එතුමන්ට දොළොස් හැවිරිදි වූ කල ඔවුහු සිරිත් පරිදි උළෙලට සහභාගී වූහ.** (ලූක් 2:42)

'ජේසුස් වහන්සේ දෙවියන්වහන්සේගේ මෙන්ම මිනිසුන්ගේද ප්‍රසාදය ලබමින් නැණ නුවණින්ද උස මහතින්ද වැඩුණු සේක. (ලූක් 2:52)

ජේසුස් වහන්සේ සාමාන්‍ය මිනිස් දුබලකම් සියල්ලෙන්ම හෙබි පුද්ගලයෙකු යැයි ඉහත බයිබල් වැකිවලින් සනාථ වේ.

## 19. දෙවියන්වහන්සේ මවකට උපන් කෙනෙක්ද?

ඕ ඇයගේ කුළුඳුලා එනම් පුතකු බිහිකර රෙදිවලින් ඔතා ගව ඔරුවක තැබුවාය. (ලූක් 2:7)

මවකගේ කුසයෙන් උපදින්නෙක් දෙවියන්වහන්සේ වීම තබා ඔහු පවිත්‍ර කෙනෙකු වීම පවා බයිබලය පිළිනොගනියි.

මෙලෝ උපන් දනන් අතර නිමල කෙනෙකු සිටිය හැකිද? (ජෝබ් 25:4)

## 20. දෙවියන්වහන්සේ මව් කිරි පානය කරනු ඇතිද?

ජේසුස් වහන්සේ මෙසේ පවසද්දී රැස්ව සිටියවුන් අතරේ සිටි එක් කාන්තාවක් 'ඔබ කුස දැරූ ඔබට කිරි දුන් තැනැත්තී ආශිර්වාද ලද්දීයැ'යි හඬ නගා පැවසුවාය. (ලූක් 11:27)

## 21. දෙවියන්වහන්සේ චර්මඡේදනය කරනු ඇතිද?

අට දිනකට පසු එනම් ළදරුවා චර්මඡේදනය කිරීමේ අවස්ථාවේදී එතුමන්ට ජේසු යන නම තබන ලදී. (ලූක් 2:21)

## 22. දෙවියන්වහන්සේ රැකියාවක් කරනු ඇතිද?

'මේ අර මරියාගේ පුතා වඩුවා නො වේද? අර යාකොබ්, යෝසෙස්, යුදස් හා සිමොන්ගේ සොහොයුරා නෙවේද? මොහුගේ සොහොයුරියනුත් මෙහි අප අතරේ සිටිනවා නොවේදැ?'යි පවසමින් ඔවුහු එතුමාණන් හෑල්ලු කළහ. (මාර්ක් 6:3)

## 23. දෙවියන්වහන්සේ සිය පාපයන් ගැන පාපොච්චාරණයක් කරනු ඇතිද?

ඔවුහු තම පාප කියා දෙමින් යොර්දන් නදියෙහි ඔහු අතින් බෞතීස්ම ලදහ. (මතෙව් 3:6 3:13)

ජේසුස් වහන්සේ ගේ කාලයේ සිටි යොහන්ගෙන් මිනිසුන් බෞතීස්ම ලැබූ බව

මෙම වැකිය පවසයි. එසේ බෞතීස්ම ලබන විට තමාගේ පාපයන් පිළිබඳ පාපොච්චාරණයක් කළ යුතුය. ජේසුස් වහන්සේ ද යොහන් අතින් බෞතීස්ම ලැබූ බව බයිබලය කියයි. මේ අනුව ජේසුස් වහන්සේ පාපොච්චාරණයක් කළ බව අපට සිතා ගත හැකිය.

## 24. දෙවියන්වහන්සේ අන් අයගේ දෙපා සෝදනු ඇතිද?

**ඉන්පසු එතුමාණෝ දිය බඳුනක් ගෙන ඉන් සිය ගෝලයින්ගේ පා සෝදමින් ඉන බැඳි තුවායෙන් පිස දමන්නට වන් සේක** (යොහාන් 13:5)

## 25. දෙවියන්වහන්සේ සුවඳ විළවුන් තවරා ගැනීමට රුචිකත්වයක් පෙන්වනු ඇතිද?

**මේසයට වාඩිගෙන සිටියදී කිරිගරුඬ බඳුනක බහාලූ ඉතා මිළ අධික සුවඳ විලෙවුන් රැගෙන ආ එක් ස්ත්‍රියක් ඒ විලෙවුන් එතුමාණන්ගේ හිසෙහි වත් කළාය. ඒ දුටු කල ඉන් කුපිත වූ ගෝලයෝ 'මේ මොන නාස්තියක්ද? මේ විලෙවුන් ඉහළ මිළකට විකුණා ඉන් ලැබෙන මුදල් දුප්පතුන්ට බෙදා දෙන්න තිබිණැ'යි කීවෝය. ජේසුස් වහන්සේ ඒ වග දැන ඔවුන් ඇමතූ සේක 'ඔබ මේ ස්ත්‍රියට කරදර කරන්නේ ඇයි? ඇය මට කර තිබෙන්නේ ඉතා ශෝභමාන දෙයක්'.** (මතෙව් 26:7-10)

## 26. දෙවියන්වහන්සේ ගේ පරම්පරාව පහත් එකක් විය හැකිද?

**අවජාතක යමෙකු ද සමිඳුණන් වහ්න්සේගේ සභාවට නොයා යුතු ය.** (ද්විතීය කථාව 23: 2 3)

ගණිකාචාරයේ යෙදෙන පරම්පරා දෙවියන්වහන්සේ සම්පතරයන් නොවෙති යැයි පැහැදිලිව පවසන බයිබලය ජේසුස් වහන්සේ එවැනි පහත් පරම්පරාවකින් පැවත එන පුද්ගලයෙකු යැයිද පවසයි.

### තාමාර්

තාමාර් සිය මාමණ්ඩි වන යූද සමග අයථා සම්බන්ධකම් පවතා දරුවන් දෙදෙනකු බිහි කළ බව බයිබලය පවසයි.

**ඔබේ මාමණ්ඩි ඔහුගේ බැටළුවන්ගේ ලොම් කපන පිණිස තිම්නාට යන්නේ ය කියා තාමාර්ට දන්වන ලදින් ඇය තම කණාවැන්දුම් ඇඳුම් ඉවත ලා මුහුණු වැස්මකින් තම මුහුණ වසා පොරවා ගෙන තිම්නාවට යන මග**

ඒනයිම් නම් නුවරට ඇතුල් වන ස්ථානයෙහි වාඩි වූවා ය. මන්ද ෂේලා වැඩි වියට පැමිණි නමුත් ඔහුට ඈ භාර්යාව කොට නුදුන් බව ඈ දුටු හෙයිනි. ජුද ඈ දුටු විට ඈ තම මුහුණ වසා ගෙන සිටි බැවින් ඈ වේශ්‍යාවකැ යි ඔහු සිතී ය. ඔහු ද මග අසල සිටි ඈ වෙත ගොස් 'කරුණාකර එන්න. ඔබ සමග සයනය කිරීමට මට ඉඩ හරින්නැ' යි කී ය. මන්ද ඈ තම යෙහෙළිය බව ඔහු නොදත් හෙයිනි. ඈ ද උත්තර දෙමින් 'ඔබ මා සමග සංවාසයේ යෙදෙනු පිණිස මට කුමක් දෙන්නෙහි දැ' යි ඇසුවාය. 'පට්ටියෙන් එළු පැටියෙකු එවන්නෙමි' යි ඔහු කී විට 'හොඳයි ඔබ එය එවන තුරු මට අත්තිකාරමක් දෙන්නෙහි දැ' යි විචාළා ය. එවිට ඔහු ද 'කුමන අත්තිකාරමක් ඔබට දෙන්න දැ' යි ඇසුවෙන් ඈ ද 'ඔබගේ මුද්‍රාවත් මාලයත් අතේ තිබෙන සැරයටියත් ය' යි උත්තර දුන්නාය. ඔහු ඒවා ඈට දුන් පසු ඈ සමග සයනය කෙළේ ය. ඈ ද පිළිසිඳගත්තා ය. පසුව ඈ නැගිට පිටත්ව ගොස් සළුව ඉවත ලා කණවැන්දුම් ස්ත්‍රියකගේ ඇඳුම් ලා ගත්තා ය. ජුද අදුල්ලම් නගරවාසී තම මිතුරා අත ස්ත්‍රියගෙන් අත්තිකාරම ආපසු ලබා ගන්නා පිණිස එළු පැටියෙකු යැව්ය. එහෙත් ඔහුට ඈ සම්බ නො වූවා ය. එවිට ඔහු එහි සිටිය මිනිසුන්ට කතා කොට 'ඒනයිම් නම් ස්ථානයේ මග අසල සිටි වේශ්‍යාව කොහි දැ?' යි ඇසූ විට 'එහි වේශ්‍යාවක් සිටියේ නැතැ' යි ඔවුහු උත්තර දුන්හ. පසුව ඔහු ජුද වෙත ආපසු ගොස් 'මට ඈ සොයා ගන්නට බැරි ය. ඇරත් එහි සිටි මිනිස්සු පවා එහි වේශ්‍යාවක් සිටියේ නැත කියා කීවෝ ය' යි සැළ කෙළේ ය. එවිට ජුද කතා කොට 'ඈ ගත් දේ ඈ ම තබා ගත්තාවේ. නැත්නම් මිනිසුන් අපට සිනාසෙන්නට පුළුවනි. ඔබට ඈ සම්බ නුවූ නමුත් බලන්න මම මේ බැටළු පැටියා යැව්මි' යි කී වේය. මාස තුනක් පමණ ගත වූ පසු 'ඔබේ යෙහෙළිය වන තාමාර් වේශ්‍යාකම් කළාය' කියා ද 'ඇරත් වේශ්‍යාකමින් පිළිසිඳගෙන සිටින්නී ය' කියා ජුදට දන්වන ලදින් ඔහු ද 'ඈ පිටත ගෙනවුත් පුළුස්සා දමන්නැ' යි කීවේය. ඈ ද පිටතට ගෙනෙනු ලැබූ විට තම මාමණ්ඩිට පණිවුඩයක් යවමින් 'මේවා යම් කෙනෙකුගේ ද ඒ මිනිසාට දරු මම පිළිසිඳ ගත්තෙමි. එබැවින් කරුණාකර මේ බඩු වන මුද්‍රාවත් මාලයත් සැරයටියත් කාගේද කියා විමසා බලන්නැ' යි කීවා ය. ජුද ද ඒවා හඳුනා ගෙන 'මා පුත් ෂේලා ඈට නුදුන් බැවින් මට වඩා හරි දේ කර ඇත්තේ ඈ යැ'යි කීය. එහෙත් ඉන් පසු ඈ සමග ඔහු සයනය කෙළේ නැත. ඈ ප්‍රසව වේදනාවෙන් පසු වන විට පුදුමයකි ඇගේ කුසේ නිඹුල්ලු සිටියහ. ඈ දරුවන් ලබන කල එක දරුවෙක් අත පිටතට දැමී ය. වින්නඹු මව ද එය ගෙන 'මොහු පළමුවෙන් පිට වී ය' යි කියා ඔහුගේ අතේ තද රතු නූලක් බැන්දය. එහෙත් ඔහු අත ඇතුලට ඇද ගත් විට

ඔහුගේ සහෝදරයා බිහි විය. එවිට වින්නඹු මව ද 'ඔබ කඩා ආ හැටි යස යි' කියා ඔහුට පෙරෙශ් යන නම තැබුවා ය. (උත්පත්ති 38:13 29)

ජේසුස් වහන්සේ උපත ලැබුවේ ඉහත සඳහන් කරනු ලබන අශීලාචාර ස්ත්‍රියක් වන තාමාර්ගේ පරම්පරාවේම යැයි බයිබලය කියයි. මතෙව් පළමු පරිච්ඡේදයේ ජේසුස් වහන්සේ ගේ පරම්පරා විස්තර සඳහන් වී ඇත. එහි ආබ්‍රහම්ගේ පුත්‍රයා වන දාවිද්ගේ පුත් ජේසුස් වහන්සේ ගේ පරම්පාරව මෙසේ යැයි සඳහන් වී තිබේ.

1. ආබ්‍රහම්ගෙන් පැවත එන දාවිත් රජුගේ පෙළපතින් බිහිවූ ජේසු ක්‍රිස්තුස්වහන්සේගේ පෙළපත් නාමාවලිය මෙසේය.

2. ආබ්‍රහම් ඊසාක්ගේ පියාය, ඊසාක් යාකොබ්ගේ පියාය, යාකොබ් යුදා හා ඔහුගේ සහෝදරයින්ගේ පියාය.

3. යුදා පෙරෙශ්ගේත් සෙරාගේත් පියාය. ඔවුන් දෙදෙනාගේ මෑණියන් වූයේ තාමර්ය. පෙරෙශ් හෙශ්රොන්ගේ පියාය. හෙශ්රොන් රාම්ගේ පියාය.

4. රාම් අම්නාදබ්ගේ පියාය. අම්නාදබ් නාෂොන්ගේ පියාය. නාෂොන් සලමොන්ගේ පියාය.

5. සලමොන් බෝවස්ගේ පියාය. බෝවස්ගේ මව රාහාබ්ය. බොවස් ඔබෙද්ගේ පියාය. ඔබෙද්ගේ මව රූත්ය. ඔබෙද් යෙස්සේගේ පියාය.

6. යෙස්සේ දාවිත් රජුගේ පියාය. දාවිත් සලමොන්ගේ පියාය. සලමොන්ගේ මව වූයේ උරියාගේ බිරිඳය.

7. සලමොන් රෙහෙබොවාම්ගේ පියාය. රෙහෙබොවාම් අබියාගේ පියාය. අබියා ආසාගේ පියාය.

8. ආසා යෙහෝෂාපාට්ගේ පියාය. යෙහෝෂාපාට් යොරාම්ගේ පියාය. යොරාම් උස්සියාගේ පියාය.

9. උස්සියා යෝතාම්ගේ පියාය. යෝතාම් ආහාස්ගේ පියාය. ආහාස් හෙසකියාගේ පියාය.

10. හෙසකියා මනස්සේගේ පියාය. මනස්සේ ආමොන්ගේ පියාය. ආමොන් යොෂියාගේ පියාය.

11. යොෂියා යෙකොනියාගෙත් ඔහුගේ සහෝදරයින්ගේත් පියාය. ඒ ඉශ්‍රායේලවරුන් බැබිලෝනියාවට පිටුවහල් කරනු ලැබූ දවස්ය.

12. බැබිලෝනියාවට පිටුවහල් කරනු ලැබූ පසු: යෙකොනියා ෂෙයල්තියල්ගේ පියාය. ෂෙයල්තියල් සෙරුබ්-බාබෙල්ගේ පියාය.

13. සෙරුබ්බාබෙල් අබියුද්ගේ පියාය. අබියුද් එලියාකිම්ගේ පියාය. එලියාකිම් අශෝර්ගේ පියාය.

14. අශෝර් සාදොක්ගේ පියාය. සාදොක් ආකිම්ගේ පියාය. ආකිම් එලියුද්ගේ පියාය.

15. එලියුද් එලයාසර්ගේ පියාය. එලයාසර් මත්තාන්ගේ පියාය. මත්තාන් යාකොබ්ගේ පියාය.

16. යාකොබ් යෝසෙප්ගේ පියාය. මෙම යෝසෙප් මරියාගේ පුරුෂයාය. ක්‍රිස්තුස් නම් වූ ජේසුස් වහන්සේ උපන්නේ මෙම මරියාගෙනි. -මතෙව් 1:1-16

මෙහි තුන්වැනි වැකිය බලන්න. තාමාර් නමැත්තිය සිය මාමා සමග දුරාචාරයේ යෙදුනද එයට පෙර ඇය ඇයගේ නීත්‍යානුකූල පුරුෂයෙකුට දව ළමුන් බිහි කරන්නට ඇත යැයි අපට සිතා ගන්නට තිබිනු නමුත් එයටද හරස් කපන්නේ බයිබලයමයි. ඇයිද යත් ජේසුස් වහන්සේ ගේ පරම්පරා ලැයිස්තුවට ඇතුලත් කර ඇත්තේ තාමාර් සිය මාමණ්ඩිය සමග දුරාචාරයේ යෙදී බිහිකළ එම අවජාතක දරුවන් දෙදෙනාගේ නම් පමණී.

මේ අනුව බලන කල බයිබලය මෙම ස්ථාවරය පිළිබඳ දක්වන්නේ පැහැදිලි පටහැනිතාවයකි. එක් අතකින් දුරාචාරයේ යෙදුනු පරම්පරාවක් දෙවියන්වහන්සේට සමීප විය නොහැකි යැයි කියන බයිබලය, ජේසුස් වහන්සේ ගේ පරම්පරාවේම අවජාතක දරුවන් සිටි බව පවසයි.

කිතුනුවන්ගේ තර්කය අනුවම ගොස් දෙවියන්වහන්සේට පුත්‍රයෙකු සිටියේය යැයි මඳකට සිතමු. එසේ තිබුනද දුරාචාරයේ යෙදුනු කාන්තාවක් සිටි පරම්පරාවක් දෙවියන්වහන්සේ සිය පුත්‍රයා ලොවට බිහි කිරීම සඳහා තෝරා ගනු ඇතිද? එවැනි පරම්පරාවක් දෙවියන්වහන්සේට සමීප විය නොහැකි යයි බයිබලයම නිර්දේශ කරන අතරම මෙවැන්නක් විය හැකිදැයි අප කිතුනුවන් ගෙන් අසනු කැමැත්තෙමු.

මේ අතර එම පරම්පරා ලැයිස්තුවෙහිම මෙසේද සඳහන් වෙයි:

## රාහාබ්

බෝවස්ගේ මව රාහාබ්ය.-මතෙව් 1:5

ජේසුස් වහන්සේ ගේ පරම්පරාවේ ඇතුලත් වී ඇති මෙම රාහාබ් කවරෙක්ද?

ඔව්හු ගොස් රාහාබ් නම් වෙසගනකගේ ගෙදරට පැමිණ එහි නවාතැන් ගත්හ. -ජෝෂුවා 2:1

ජේසුස් වහන්සේ උපන්නේ මෙම ගණිකාවගේ පරම්පරාවේම යැයි පවසන්නේ අප නොව බයිබලයයි.

## රූත්

ජේසුස් වහන්සේ ගේ පරම්පරාවේ ඇතුලත් වී ඇති මෙම රූත් කවරෙක්ද? ඇයද දුරාචාරයේ යෙදුනු තැනැත්තියක් යැයි. (රූත් 1:4 හා 4:10) බයිබලය පවසයි.

මේ ලෙසින් බයිබලයේ සඳහන් කරුණු අනුවම ගත් කල, ජේසුස් වහන්සේ ට තිබුනු මිනිස් දුබලකම්, එතුමන්ගේ පරම්පරාවේ තත්ත්වය යනාදිය සැලකිල්ලට ගත් කල ජේසුස් වහන්සේ කිසිසේත් දෙවියන්වහන්සේ විය නොහැකිය යැයි කිතුනුවන් පිළිගත යුතුමය. එසේ නොකළහොත් ඔවුන් බයිබලයේ වැකි, විස්තර හා නිර්දේශ ප්‍රතික්ෂේප කරන්නන් වනු ඇත.

## දෙවියන්වහන්සේට තිබිය නොහැකි දුබලතා

අප මෙතෙක් විස්තර කළ කරුණු ගැන නැවතත් මෙනෙහි කර බලන්න. එය පහසු කරනු පිණිස එය කෙටියෙන් නැවත මෙසේ ලැයිස්තු ගත කරන්නෙමු:

- ජේසුස් වහන්සේ කඳුළු සලා දුක්වී සංතාපයට පත් වී ඇත්තාහ
- ජේසුස් වහන්සේ ට පිපාසය ඇති වී තිබේ
- ජේසුස් වහන්සේ ආහාර අනුභව කරන්නෙකුව සිටියෝය
- ජේසුස් වහන්සේ රජුන්ට පමණක් නොව මිනිසුන්ටද බියවී ඇත්තාහ
- ජේසුස් වහන්සේ ව්‍යාකූල වී ඇත්තාහ
- ජේසුස් වහන්සේ යක්ෂයා විසින් පරීක්ෂණය කරනු ලැබූහ
- ජේසුස් වහන්සේ තම ගුරුවරයාට පිහිට නොවී පලා ගියහ
- ජේසුස් වහන්සේ කළකිරී ඇත්තාහ
- ජේසුස් වහන්සේ මත්පැන් පානය කර ඇත්තාහ
- ජේසුස් වහන්සේ මළ පහ කර ඇත්තාහ
- ජේසුස් වහන්සේ දුෂ්ඨ පාලකයන්ට බිය·වී බදු ගෙවා ඇත්තාහ
- ජේසුස් වහන්සේ නින්දිත ආකාරයෙන් අනුන්ට බැණ වැදී ඇත්තාහ
- ජේසුස් වහන්සේ චර්ම ඡේදනය කරනු ලැබූහ

- ජේසුස් වහන්සේ මව් කිරි පානය කර ඇත්තාහ
- රැකියා කර ඇත්තාහ
- මිනිසෙකු ලෙසින්ම ජීවත් වී ඇත්තාහ
- පාපොච්චාරණය කර ඇත්තාහ
- අන්‍යයන්ගේ දෙපය සෝද ඇත්තාහ
- පලා ගොස් සැඟවී ඇත්තාහ
- සුවඳ විළවුන් තවරා ගැනීමට කැමැත්ත දක්වා ඇත්තාහ
- හිරිහැර කරනු ලැබූහ
- එතුමන්ගේ මුහුණට මිනිසුන් කෙළ ගැසූහ
- එතුමන්ට මිනිසුන් වේවැලින් පහර දුන්හ
- කටු ඔටුන්නක් හිසෙහි පළඳවනු ලැබූහ
- නිරුවත් කරනු ලැබූහ
- වේදනාව ඉවසා ගත නොහැකිව එතුමන් විලාප තබා ඇත්තාහ

මෙලෙසින් සාමාන්‍ය මිනිසෙකුට තිබිය හැකි සියළුම දුර්වලතා ජේසුස් වහන්සේට තිබුනේය. මෙයට බයිබලයම සාක්ෂි දරයි. එතුමන්ගේ පරම්පරාවද වැදගත් එකක් නොවේ යැයි බයිබලය පවසයි. එවැනි කෙනෙකු සිය දෙවියන්වහන්සේ යැයි විශ්වාස කිරීමට කිතුනු ලෝකයා තවත් සූදානම්ද?

මිනිස් වර්ගයා ඇතුළු මේ මුළු මහත් විශ්වයද ජේසුස් වහන්සේ ඇතුළු දෙවියන්වහන්සේගේ සියළුම පණිවිඩකරුවන් මවා ලොවට එවූ සර්වබලධාරී දෙවියන්වහන්සේ එකෙකි. ඔහු ඉතා ප්‍රබලය. අසීමිත බලයෙන් යුක්තය. ඔහුට ආරම්භයක් හෝ අවසානයක් නැත. ඔහු කිසිවෙකු විසින් වදනු නොලැබූ අතර ඔහු කිසිවෙකු නොවැදුවේය. අප සියල්ල නැමදිය යුත්තේ හා පිහිට සොයා හැරිය යුත්තේ ඔහු දෙසටය. එවන් එකම දෙවියන්වහන්සේට අවනත වීම සඳහා කිතුනුවන් ඇතුළු ලොව ජීවත් වන සියල්ලන්ටම අප සාදරයෙන් ඇරයුම් කරමු.

# තුන්වෙනි කොටස

# දෙවියන්වහන්සේගේ උපදෙස්

ජේසුස් වහන්සේ කිසිසේත් දෙවියන්වහන්සේ විය නොහැකිය යන්නට සාධක මෙතෙක් බයිබලය උපුටා දක්වමින්ම අප ඉදිරිපත් කළෙමු. අවසන් වශයෙන් ඇතැම් උපදෙස් කිහිපයකට අවධානය යොමු කරවනු කැමැත්තෙමු. සර්වබලධාරී දෙවියන්වහන්සේ එකෙකි යන්නට බයිබලයෙන්ම අප කරුණු ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමු.

# මෝසස්ගේ ද්වීතීය නීති සංග්‍රහය

**එබැවින් සමිඳාණන් වහන්සේ ඉහළ ස්වර්ගයෙහිත් පහළ මිහිපිටත් වැඩ වසන දෙවියන් වහන්සේ බවත් උන් වහන්සේ හැර අන් දෙවි කෙනෙකු නැති බවත් වටහා ගෙන තරයේ සිතින් මෙනෙහි කරන්න.** - ද්වීතීය නීති සංග්‍රහය 4:39

**'ඉශ්රායේල්වරුනි සවන් දෙන්න. අපේ සමිඳාණන් වහන්සේ වන දෙවියන් වහන්සේ අසහාය සමිඳාණන් වහන්සේ ය. දෙවි සමිඳාණන් වහන්සේට ඔබේ මුළු හෘදයෙන් ද ඔබේ මුළු සිතින් ද ඔබේ මුළු වීර්යයෙන් ද ප්‍රේම කළ යුතු ය. අද දින මා ඔබට දෙන මෙම අණ පණත් සිතේ ධාරණය කර ගත යුතු ය. ඔබේ දරු දැරියන්ට ඒවා ඉගැන්විය යුතුය. ඔබ ගෙදර සිටින විට ද පාරේ යන එන විට ද සැතපෙන විට ද අවදි වන විට ද ඒවා ගැන ඔවුන්ට කතා කළ යුතු ය.** - ද්වීතීය නීති සංග්‍රහය 6:4-7

**ඔබ අතර දිවැසිවරයෙකු හෝ ස්වප්න තෝරන්නෙකු හෝ පහළ වී ඔබට හාස්කමක් හෝ අරුමපුදුම දෙයක් හෝ පාන්නට යෝජනා කොට ඔහු කී අයුරින් ඒ හාස්කම් හෝ අරුමපුදුම දේ හෝ සිදු වී ඔබ නොහඳුනන අන් දෙවි දේවතාවන් පසුපස ගොස් 'අපි ඔවුන්ට වැඳුම්පිදුම් කරමු'යි කීවොත් එවැනි දිවැසිවරයෙකුගේ හෝ ස්වප්න තෝරන්නෙකුගේ හෝ කීම්වලට ඔබ සවන් නොදිය යුතුය. මෙවැනි දේවලින් ඔබේ දෙවි සමිඳාණන් වහන්සේට ඔබේ මුළු හෘදයෙන් සහ ඔබේ මුළු සිතින්ම ප්‍රේම කරන්නහු දැ යි උන් වහන්සේ ඔබ පරීක්ෂා කරන සේක.** (දිවිතීය කථාව 13:1-4)

**එහි දී ඔබ හැම ලීයෙන් සහ ගලින් නෙළූ මිනිස් අත් කම්වල ප්‍රතිඵල වන කිසිත් නොදකින නොබලන ගඳ සුවඳ නොදැනෙන දෙවි දේවතාවන්ට වැඳුම් පිදුම් කරන්නහු ය. එහෙත් එහිදී ඔබේ මුළු හෘදයෙන්ද ඔබේ මුළු සිතින් ද ඔබ දෙවි සමිඳාණන් වහන්සේ සොයා ගියොත් උන් වහන්සේ ඔබට සම්බ වනු ඇත.** - දිවිතීය කථාව 4:28-29

මේවා මෝසෙස්ට දෙවියන්වහන්සේ විසින් පහළ කරනු ලැබූවේ යැයි කිතුනුවන් විශ්වාස කරන ඒක දේවත්වය පිළිබඳ වැකි සමහරකි. මේ සියල්ල ඔවුන් පිළි නොගතහොත් බයිබලයට ඔවුන් අවනත නොවන තත්ත්වයකට පත්වෙති. අවසාන තීන්දු දිනයෙහි මේ පිළිබඳ දෙවියන්වහන්සේ විසින් ප්‍රශ්න කරනු ලැබුවහොත් කිතුනුවන් එයට කුමක් කියන්නට සිතා සිටින්නේද?

# යෙසායාට දෙවියන්වහන්සේ කථා කරමින්

**මම ආරම්භයත් අවසානයත් වන්නෙමි. මා හැර අන් දෙවි කෙනෙක් නැත.** -යෙසායා 44:6

**'මාගෙන් බැහැර අන් දෙවි කෙනෙක් ඇත්තේ නැත. සිටියේත් නැත. සිටින්නේත් නැත. එසේය. මම පමණක් සමිඳාණන් වහන්සේ ය. මා හැර අන් ගැලවුම්කාරයෙක් නැත. සිදු වන්න යන දේ මම කලින් දැන්වීමි.** - යෙසායා 43:10-12

**සගලෝ මැවූ පොළොව සාද එය නිම කළ පාළු ඉඩමක් ලෙස නොව විසුමට තැනක් ලෙස පොළොව මැවූ එක ම දෙවි වන සමිඳාණෝ මෙලෙස වදාරන සේක 'මම සමිඳුන් වෙමි. හුදෙක් මා හැර අන් දෙවි කෙනෙක් නැත** -යෙසායා 45:18

**ලී රූප උසුලා ගෙන යන ගැලවීම ගෙන දෙන්න නොහැකි දෙවි වරුන් යදින අයට නැණ නුවණ නැත. ඉදිරියට අවුත් නුඹලාගේ නඩුව දන්වා එකිනෙකා සමග මන්ත්‍රණය කර ගනිත් වා! සිදුවන්න යන දේ බොහෝ ඉහත දී කීවේ කවරෙක් ද? එසේ කෙළේ සමිඳාණන් වන මම නොවෙමි ද? මා හැර අන් දෙවි කෙනෙක් නැත. මම ධර්මිෂ්ඨ ගැලවුම්කාර දෙවිඳාණෝ ය. වෙන දෙවි කෙනෙක් ඇත්තෙම නැත. ලෝ වැසි සියල්ලෙණි මා වෙත එන්න. දැන් මාගේ ගැලවීම ලබා ගන්න. මා හැර අන් දෙවි කෙනෙක් නොමැත. මාගේ මුවින් ගිලිහෙන කිසිදු වචනයක් වෙනස් නොවේ. එය සත්‍යයකි. සියළු දණ හිස් මට නැමෙන බව සියළු දිව් මා ගැන දිවුරන බව සහතික ලෙස දිවුරා කියමි.** -යෙසායා 45:20-23

**'පිළිම සාදන සියල්ලෝ චපලයෝ ය. ඔවුන් උසස් කොට සලකන දෙවිවරු වැදගැම්මකට නැත. ඒ දෙවිවරුන් නමදින සියල්ලෝම අන්ධය. අඥානය. ඔව්හු නින්දවට පැමිණෙන්නෝ ය. දෙවි කෙනෙකු වශයෙන් නැමදීමට ලෝහ-පිළිමයක් වාත්තු කිරීම නිෂ්ඵලය. එයට නමස්කාර කරන සියල්ලෝ නින්දවට පැමිණෙන්නෝ ය. පිළිම සාදන කම්කරුවෝ සාමාන්‍ය මනුෂ්‍යයෝ ය. ඊට වැඩි දෙයක් ඔවුන්ට නැත. ඔවුහු නඩු විනිශ්චයය සඳහා ඉදිරිපත් වෙත්වා. ඔව්හු බිය වී නින්ද ලබත'.** -යෙසායා 44:9-11

**මම සමිඳාණන් වහන්සේය. අන් කෙනෙක් නැත. මා හැර අන් දෙවි කෙනෙක් නැත. නුඹ මා නොදන්න නමුත් මම නුඹ ශක්තිමත් කරන්නෙමි. මා එසේ කරන්නේ මා හැර අන් දෙවි කෙනෙකු නැති බව නැගෙනහිර සිට බස්නාහිර දක්වා සිටින සියළු දෙනා දැන ගන්න පිණිස ය. මම ස්වාමීන් වහන්සේ ය. මා හැර අන් දෙවි කෙනෙක් නැත'.** -යෙසායා 45 :5-6

**'පුරාණයේ සිදු වූ දේ සිහි කර ගෙන මා පමණක් දෙවිඳාණන් බව මා හා සමාන අන් කිසිවෙකු නැති බව පිළි ගන්න. අවසානය තෙක් කුමක් වන්නේ දැ යි පටන් ගැනීමේ සිට ම මම කීවෙමි. සිදු වන්න යන දේ පුරාණයේ සිට ම මම ප්‍රකාශ කෙළෙමි.** -යෙසායා 46:9- 10

**දෙවිඳාණන් කවරෙකුට සම කළ හැකිද? එතුමන්ගේ හැඩ රුව කෙසේ විස්තර කළ හැකි ද? කම්කරුවෙකු වාත්තු කළ රන් කරුවෙකු රන් ආලේප කළ රිදී දමයෙන් සරසන ලද පිළිමයකට එතුමන් සමාන නැත.** -යෙසායා 40:18-19

ඉහත අප උපුටා දක්වා ඇත්තේ යෙසායා නම් දේව පණිවිඩකරුට දෙවියන්වහන්සේ පහළ කළ වැකිය. මෙය අනුව කුරුසයද ජේසුස් වහන්සේ හා එතුමන්ගේ මවද පිළිරූ ලෙසින් අඹා එයට වැඳුම් පිදුම් කරන කිතුනුවන් තමන්ව නියම කිතුනුවන් යැයි කීමට ඇත්තෙන්ම සුදුස්සන්දැයි අසනු කැමැත්තෙමු. බයිබලයේම ඇති උපදෙස් අහකට දමා පූජකයන් විසින් කියන ලද ත්‍රිත්වයේ සංකල්පය විශ්වාස කිරීමට පෙළඹීම කෙතරම් වැරදි ක්‍රියාවක්ද? ගැඹුරු අන්දමින් කරුණු අධ්‍යයනය කරන කිතුනුවන්ට ඒක දේව සංකල්පය ඉතා පැහැදිලි අන්දමින් දෙසන හා ජේසුස් වහන්සේ ගේ ආශ්වර්‍යමත් උපත තහවුරු කරන ඉස්ලාමය වැළඳ ගැනීම හැර විමුක්තිය සඳහා අන් මගක් නොමැති බව නොපෙනෙන්නේද?

-නැවතත් අප ඉදිරිපත් කර ඇති ඉහත වැකි ගැන මෙනෙහි කරන්න. අහස් ගැබේ හා පෘතුවියේ ඔහු හැර අන් දෙවියෙක් නැත. ඔහු අද්විතීයය. සදාකාලිකය. ප්‍රාතිහාර්‍යයන් දැක කෙනෙකු දේවත්වයෙන් පුදනු එපා. සියල්ලන්වම ආරක්ෂා කිරීමට හැකියාව ඇති සර්වබලධාරී දෙවියන්වහන්සේ එකෙකි. අප හිස පහත් කළ යුත්තේ, දණ ගැසිය යුත්තේ ඔහු ඉදිරියේ පමණි යනාදී ලෙසින් උපදෙස් කරන මෙම වැකි පියා, පුත්‍රයා, ශුද්ධ ආත්මය යන ත්‍රිත්වයේ සංකල්පය සුනු විසුනු නොකරන්නේද? ජේසුස් වහන්සේ ඇතුළු කිසිවෙකු දෙවියන්වහන්සේගේ පුත්‍රයෙකු විය නොහැකිය යන සත්‍යය මෙම වැකි තහවුරු නොකරන්නේද?

කිතුනු පූජකයන් විසින් පසුව ගොතන ලද ත්‍රිත්වයේ සංකල්පය මනඃකල්පිත එකක් යැයිද එයට හා බයිබලයේ සත්‍ය ඉගෙනුම්වලට කිසිදු සම්බන්ධයක් නැත යැයිද වැඩිදුරටත් ඔප්පු කිරීමට අප තවත් බයිබල් වැකි කිහිපයක් ඉදිරිපත් කරමු.

## මෝසෙස්ගේ ලේවියර් ආගම

'බොරු දේව පිළිම වෙත නොහැරෙන්න. ලෝහයෙන් වාත්තු කළ දෙවිවරුන් සාදා නොගන්න. නුඹලාගේ දෙවි සමිඳාණන් වහන්සේ මම වෙමි'. (ලෙවි කථාව 19:4)

'නුඹලාගේ දේශයෙහි නුඹලාගේ වන්දනාව පිණිස දේව පිළිම හෝ කැටයම් කළ ප්‍රතිමා හෝ ශිලාස්තම්භ හෝ නෙළූ ගල් රූප හෝ නොසෑදිය යුතුය'. (ලෙවි කථාව 26:1)

## නික්මයාමෙහි මෙසේ දෙවියන්වහන්සේ වදාළ සේක

'වහල්කමේ නිවාසය වූ මිසර දේශයෙන් නුඹ පිටතට ගෙනා සමිඳාණන් වහන්සේ මම ය. මා හැර අන් කිසි ම දෙවි කෙනෙකු නුඹට නොසිටිය යුතු ය. නුඹ සඳහා නෙළූ රූපයක් හෝ ඉහළ අහසෙහි වත් පහත පොළොවෙහි වත් පොළොවෙන් යට ජලයෙහි වත් ඇති කිසිම වස්තුවකට සමාන දෙයක් හෝ සාදා නොගන්න. නුඹ ඒවාට නමස්කාර නොකරන්න. ඒවාට නොවඳින්න. මන්ද නුඹේ දෙවි සමිඳාණන් වහන්සේ වන මා ප්‍රතිවාදීන් නො ඉවසන දෙවි කෙනෙකු වන බැවිනි. මට වෛර කරන පියවරුන්ගේ පාපය නිසා තුන් වන හතර වන පරම්පරාව දක්වා ඔවුන්ගේ දරුවන්ට මම දඬුවම් කරමි. -නික්මයාම 20:2-5

'නුඹලා ඔවුන්ගේ දෙවිවරුන්ට හිස නමා වැඳුම්පිදුම් නොකළ යුතු ය. ඔවුන් ක්‍රියා කරන ලෙස ක්‍රියා නොකළ යුතු ය. තවද නුඹලා ඔවුන්ගේ රූප සහමුලින් ම වනසා ඔවුන්ගේ ශිලාස්තම්භ කඩා බිඳ දැමිය යුතුය. නුඹලාගේ දෙවි සමිඳාණන් වහන්සේට නුඹලා වැඳුම්පිදුම් කළ යුතු ය. මා ආහාර පාන දී නුඹලාට ආශිර්වාද කරමින් නුඹලා අතරින් ලෙඩ රෝග දුරු කරමි'. -නික්මයාම 23: 24-25

මෙහි පිළිමයක් කඩා දමන්නැයි දෙවියන්වහන්සේ විසින් කර තිබෙන ආඥාවට තමා අද පිටුපාන බව කිතුනුවන් නොවැටහෙන්නේද? එපමණක් නොව ඒක දේව විශ්වාසය කෙතරම් ප්‍රබල අන්දමින් බයිබලයේ බල කරනු ලැබ තිබේදැයි බලන්න.

## ජෙරමියාට දෙවියන්වහන්සේ කී දේ

විජාතීන්ගේ කැපූ රූප පුහු දේවල් ය. වනයේ ගසකින් කපා ගත් ලී පමණකි. ලී කැටයම් කරුවෙක් ඒවා සිය ආයුධවලින් නෙලයි. ඔහු ඒවා රන් රිදියෙන් සරසා මිටියෙන් ඇණ ගසා නොසෙල්වෙන ලෙස සවි කරයි. ඒවා වනාහී කැකිරි වත්තක සිටුවා ඇති කතා කරන්නට බැරි පඹයන්

වැනි ය. ඒවාට ඇවිදින්නට බැරි නිසා ඔසවාගෙන යා යුතු ය. ඒවාට බිය නොවන්න. මන්ද නුඹලාට අනතුරක් කරන්න වත් යහපතක් කරන්න වත් ඒවාට බැරි ය. සමිඳුනි ඔබට සම කිසිවෙක් නැත. ඔබ පරාක්‍රමවත් ය. ප්‍රබලතාවෙන් ඔබේ නම උතුම් ය. ජෙරමියා 10:3-6

## ගීතාවලියේ දාවිත් රජු පවසා ඇති කරුණු

සමිඳුන්ට සම කළ හැකි කිසිවෙක් අහස් තලයෙහි ඇද් ද? දෙවිවරුන් අතර සමිඳුන්ට සමාන වනුයේ කවරෙක් ද? -ගීතාවලිය 89:6

'අහෝ සමිඳුනි දෙවිවරුන් අතර ඔබට සමාන අන් කෙනෙක් නැත්තේ ය. ඔබේ ක්‍රියාවන්ට සම කළ හැකි අන් ක්‍රියා ද නැත්තේ ය'. -ගීතාවලිය 86:8

'ඔබ පමණක් දෙවිදුණෝ ය'. -ගීතාවලිය 86:10

අපේ දෙවි සමිඳුන්ට සමාන අන් කෙනෙක් නැත. එතුමාණෝ උසස් තැන්හි වැඩ හිඳින සේක. එහෙත් අහසත් පොළොවත් බලන පිණිස එතුමාණෝ පහතට නැමෙන සේක. -ගීතාවලිය 113: 5- 6

## 1 රාජාවලිය

ඉශ්රායේල්වරුන්ගේ දෙවි සමිඳාණන් වහන්සේ ඉහළ ස්වර්ගයෙහි වත් පහළ පොළොවෙහි වත් ඔබට සමාන දෙවි කෙනෙක් ඇත්තේ නැත. -1 රාජාවලිය 8:23

මේ සියල්ල බයිබලයේ පරණ ගිවිසුමේ ඇති වැකි කිහිපයකි. ආරම්භයෙහිදී පැවතියේ එකම දෙවියන්වහන්සේ නැමදීමේ සිරිතක් පමණි. කුරුසය හා පිළිම වැඳීම පසුව මිනිසුන් විසින් ඇතිකරගත් දේ බව මෙයින් සනාථ වේ. අවසාන දිනයෙහි තමාගෙන් ප්‍රශ්න කරනු ඇත යැයි අවංකව විශ්වාස කරන කිසිදු පුද්ගලයෙකු මෙම ත්‍රිත්වයේ සංකල්පයට හසු නොවනු නිසැකය.

දැන් අප අළුත් ගිවිසුමේ ඒක දේවත්වය පිළිබඳ ඇති වැකිවලට යොමු වෙමු.

## ජේසුස් වහන්සේ ගේ ඒක දේව ප්‍රතිපත්තියේ ප්‍රකාශය

"සමිඳුන්ට නමස්කාර කරනු. උන් වහන්සේට පමණක් කීකරු වනු කියා දේව වචනයෙහි සඳහන් කර තිබෙයැ"යි කී සේක. -මතෙව් 4:10

එකම දෙවියන්වහන්සේ හැර අන් දෙවියන් නමදින්නෝ සාතාන්වරුන් යැයි ජේසුස් තුමන් මෙහි කියති.

**එවිට ජේසුස් වහන්සේ 'සාතන් මාවෙතින් ඉවතට යව. මන්ද 'නුඹේ දෙවි වූ ස්වාමීන්වහන්සේට පමණක් නමස්කාර කරව උන්වහන්සේට පමණක් සේවය කරව'කියා ලියා ඇති බව දැනුව'යි කී සේක. -මතෙව් 6:24**

ස්වාමීන් දෙදෙනෙකුට සේවය කළ නොහැකි යැයි මෙහි ජේසු වහන්සේ පවසන විට ස්වාමීන් තිදෙනෙකුටම සේවය කළ හැකි යැයි කිතුනුවන් කියති.

**'මට ස්වාමිනී ස්වාමිනී'යි කියන හැම කෙනෙක්ම ස්වර්ග රාජ්‍යයට ඇතුළු වන්නේ නැත. එහි ඇතුළු වන්නේ ස්වර්ගයේ වෙසෙන මාගේ පියාණන්වහන්සේගේ කැමැත්ත ඉටු කරන අය පමණි. ඒ දවසෙහි බොහෝ දෙනෙක් මා වෙත අවුත් 'ස්වාමිනී ස්වාමිනී ඔබතුමන්ගේ නාමයෙන් අපි දිවැසිවැකි නොකීවෙමුද? ඔබ තුමන්ගේ නාමයෙන් අප යකුන් දුරුකොට නොයෙකුත් හාස්කම් නොකළෙමුදැ?' යි කියනු ඇත. එවිට 'කිසි දිනෙකත් මම ඔබ නොදන්නෙමි. දුර්ජනයෙනි මා වෙතින් ඉවත් වනු'යි මම ඔවුන්ගේ මුහුණටම කියන්නෙමි' එබැවින් මාගේ වචන අසා ඒවා ක්‍රියාවට නගන හැම කෙනෙක්ම පර්වතය මත සිය නිවස තැනූ නැණවතුන්ට සමාන වෙයි. මහ වැසි වැස ගං වතුර ගලා සැඩ සුළං හමා ඒ ගෙට පහර දිණි. එහෙත් පර්වතය මත එහි අත්තිවාරම ලා තුබූ බැවින් ඒ කිසිවකින් එය බිඳ නොවැටිණ. එහෙත් මාගේ මෙම වචන අසා ඒවා ක්‍රියාවට නො නගන හැම කෙනෙක්ම වැල්ල මත සිය නිවස තැනූ මෝඩ මිනිසුන්ට සමාන වෙයි. මහ වැසි වැස ගං වතුර ගලා සැඩ සුළං හමා ඒ ගෙට පහර දිණි. බරපතල හානි සහිතව එය බිඳ වැටිණි'. -මතෙව් 7:21-27**

මෝඩයන්ටත් වැටහෙන ආකාරයෙන් සරල නිදසුන් සහිතව ජේසු වහන්සේ විසින් මෙහි කියන උපදෙස් කිතුනු ලෝකයට ප්‍රමාණවත් නොවේද? 'ජේසුනි' යැයි ඝන්නලව් කිරීමෙන් ස්වර්ග රාජ්‍යයට ඇතුල්වීමට නොහැකි තත්ත්වයක් ඇති කර ගැනීමට කිතුනුවන් කැමති වන්නහුද? දෙවියන්වහන්සේ යැයි ජේසුස් තුමන් ඇමතීමෙන් වැලි ගොඩක් මත සිය නිවස ගොඩනගන්නට කිතුනුවන් සිතන්නේද?

**'දහම් පඬිවරුනි පරිසිවරුනි ඔබට වන විපතක මහත! වංචනිකයිනි එක් කෙනෙකු ඔබගේ දහමට හරවා ගනු සඳහා ඔබ මුහුදත් ගොඩබිමත් පුරා සැරි සරති. යමකු එසේ හරවා ගත් පසු ඔබේ ඉගැනීම මගින් ඔබ මෙන් දෙගුණයක්ම නිරයේ පුතකු බවට ඔහු පත්කරයි'. -මතෙව් 23-15**

මෙම වැකිය අද සුභාරංචි රැස්වීම් පවත්වන්නවුන් පිළිබඳ ජේසුස් තුමන් කළ අනතුරු ඇඟවීමක් යැයි කිතුනුවන්ට නොවැටහෙන්නේ මන්ද?

**'දහම් පඬිවරුනි පරිසිවරුනි ඔබට වන විපතක මහත! වංචනිකයිනි ඔබ**

මිනිසුන්ගේ මුහුණටම ස්වර්ග රාජ්‍යයේ දොරටු වසති. ඔබම එහි ඇතුළු වන්නේ නැත. ඇතුළු වීමට වෙර දරන අයට ඉඩ දෙන්නේද නැත'. -මතෙව් 23:13

ස්වාමීනි යැයි ජේසුස් තුමන් අමතන්නන්ට පරලොව රාජ්‍යයේ තැනක් නැත යැයි එතුමන්ම පැවසූ පසුවත් එතුමන්ට එවැනි තත්ත්වයක් දෙමින් පූජකයන් ස්වර්ග රාජ්‍යයේ දොරටු වසමින් සිටින වර්තමාන තත්ත්වය මෙම වැකිය හා කෙතරම් කදිමට ගැලපෙන්නේද?

'කරන සෑම දෙයක්ම ඔවුන් කරන්නේ මිනිසුන්ට පෙනෙනු පිණිසයි. ඔවුහු තම පිලස්තාරී පළල් කර ගනිති. තම වස්ත්‍ර-වසලය මහත් කර ගනිති. ඔවුහු ප්‍රිය සාදයන්හිද විශේෂ අමුත්තන්ගේ බුහුමන් ලැබීමටත් ධර්මාශාලාවන්හිදී විශේෂ ආසන දැරීමටත් ලොල් වෙති. ඔවුන් ප්‍රසිද්ධ ස්ථාන වලදී උපහාර ලැබීමටත් මිනිසුන්ගෙන් ගුරුදේව කියා අමතා ගැනීමටත් ලොල් වෙති. එහෙත් ඔබ අනුන් ලවා ගුරුදේව කියා අමතා නොගත යුතුය. මන්ද ඔබට සිටින්නේ එකම ගුරුදේවයාණන් කෙනෙකු පමණී. ඔබ හැම සහෝදරයෝයි. මිහිපිට කිසිවෙකුට හෝ 'පියාණෙනි'යි නො කියන්න. මන්ද ඔබට සිටින්නේ එකම පියාණන් කෙනෙකු පමණී. උන්වහන්සේ ස්වර්ගයේ වැඩ වසන සේක. ඔබ අනුන් ලවා 'ගුරු හිමියනි'යි අමතා නො ගත යුතුය. මන්ද ඔබට සිටින්නේ එකම ගුරු හිමිතුමකු පමණී. ඒ ක්‍රිස්තුස්වහන්සේය'. -මතෙව් 23:5-10

කිසිවෙකුට පියා යැයි ආමන්ත්‍රණය නොකළ යුතුය යැයි බයිබලයේම සඳහන්ව තිබියදී තමන්ට පියාණෙනි (ෆාදර්) යැයි අමතන සිරිතක් කිතුනුවන් පූජකයන් ඇතිකර තිබෙන සැටියෙන්ම ඔවුන්ගේ වංචනික සැලැස්ම කිතුනුවන්ට නොපෙනේද? දිගු ලෝගු පැළඳ විශේෂ ගරුබුහුමන් ලැබීමට ක්‍රියා නොකළ යුතු යැයි ජේසු වහන්සේ පවසා ඇති නමුත් එය උල්ලංඝණය කරමින් සිටින පූජකයන්ගේ ක්‍රියා කලාපය ගැන කිතුනුවන්ට කියන්නට තිබෙන්නේ කුමක්දැයි අසනු කැමැත්තෙමු. බයිබලයේ දෙසුම් වසන් කරමින් හා එය විකෘති කරමින් ආරම්භයේ පටන්ම කිතුනුවන් වැරදි මාර්ගයේ ගමන් කරවූයේ මෙම පූජකයන්ය බවට තවත් සාධක අවශ්‍යද?

දැන්වත් සත්‍යය තත්ත්වය වටහා වැරදි මාර්ගයෙන් ඉවත් වී අවම වශයෙන් බයිබලයේ දෙසුම් අනුව හෝ ජීවත් වීමට කිතුනුවන් සූදනම් විය යුතුය. ජේසුස් තුමන් පවසන තවත් කරුණක් බලන්න:

'ඒ දවස ගැනවත් ඒ පැය ගැනවත් කිසිවෙක් හෝ නොදනිති. ස්වර්ගයේ දේව දූතයෝ පවා නොදනිති. පුත්‍රයාණන්වත් නො දනිති. පියාණන්වහන්සේ පමණක් දනිති'. -මතෙව් 24:36

එකම දෙවියන්වහන්සේ නැමදිය යුතුය යන කරුණ මෙම ප්‍රකාශයෙන් පිළිබිඹු වන සැටි කිතුනුවන්ට නොපෙනෙන්නේද?

**'ගුරුතුමනි දහම් නීතියෙහි ශ්‍රේෂ්ඨතම ආඥාව කවර එකදැයි ඇසීය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙන සේක් 'ඔබේ මුළු හෘදයෙන්ද ඔබේ මුළු ජීවයෙන්ද ඔබේ මුළු බුද්ධියෙන්ද ඔබේ දෙවියන් වහන්සේ වූ ස්වාමීන්වහන්සේට ප්‍රේම කරනු. එයයි මූලිකවූත් ශ්‍රේෂ්ඨ වූත් ආඥාව. -මතෙව් 22:36-38**

මෙම ප්‍රධාන මූලධර්මය කිතුනුවන් අතර අද තිබේද? මෙම මූලික සංකල්පය අත්හැර ඔවුන් කෙසේ තමන්ව කිතුනුවන් යැයි හඳුන්වා ගනිත්ද?

**ඉන්පසු සෙබදීගේ පුත්‍රයන් වූ යාකොබ් හා යොහන්ගේ මව තම පුතුන් දෙදෙනද සමගින් ජේසුස් වහන්සේ වෙත අවුත් දණින් වැටී එතුමණ්ගෙන් වරයක් ඉල්ලුවාය. 'ඔබට අවශ්‍ය මොනවාදැ?'යි එතුමාණෝ ඇසූ සේක. 'ඔබගේ රාජ්‍යයේදී මාගේ මේ පුතුන් දෙදෙනාගෙන් කෙනෙකු ඔබගේ දකුණු පසෙහිද කෙනෙකු වම් පසෙහිද හිඳවන්නට ඔවුන්ට වර දුන මැනවැ'යි ඕ පැවසුවාය. 'ඔබ කුමක් ඉල්ලනවාදැයි සැබැවින්ම ඔබ දන්නේ නැහැ'යි ඔවුනට පැවැසූ ජේසුස් වහන්සේ 'මට බොන්නට තිබෙන දුක් කුසලානයෙන් බොන්නට ඔබටත් පුළුවන්දැ'යි ඇසූ සේක. 'අපට පුළුවනැ' යි ඔවුහු පිළිතුරු දුන්හ. එවිට ජේසුස් වහන්සේ ඔවුන් අමතමින් 'සැබවින්ම ඔබ මාගේ කුසලානයෙන් පානය කරනු ඇත. එහෙත් මාගේ දකුණු පස හෝ මාගේ වම් පස හෝ හිඳ ගැනීමට වර දීම මා සතු වූවක් නොවේ. මාගේ පියාණන්වහන්සේ කවරකු ඒ සඳහා පිළියෙල කරන ලද සේක්ද ඒවා අයිති ඔවුනටයැ'යි පැවැසූ සේක.** (මතෙව් 20:20-23)

ජේසුස් තුමන් ලොවට පැමිණියේ එකම දෙවියන්වහන්සේ නැමදිය යුතු යැයි දේශනා කිරීමට මිස තමන්ව දෙවියන්වහන්සේ යැයි හඳුන්වා දීමට නොවේ. එය මෙම වැකි පෙලෙන් ඉතා පැහැදිලිවම සනාථ වේ. මෙතරම් සවිස්තරාත්ම උපදෙස් බයිබලයේ තිබෙන විටම කිතුනුවන් මේ කොහි යමින් සිටින්නේද?

**සවස තුනට පමණ 'ඒලි ඒලි ලාමා සබක්තානී?' යි පැවසූහ. එහි අරුත 'මාගේ දෙවියනි මාගේ දෙවියනි ඔබ මා අත්හැරියේ මන්ද?' යනුයි. - මතෙව් 27:46**

මරණය ඇති වන විටත් ජේසුස් තුමන් දෙවියන්වහන්සේ අමතා ඇත යන්නෙන් පැහැදිලි වන සත්‍යය කුමක්ද? එම මොහොතේ තමා ගලවා ගත හැක්කේ දෙවියන්වහන්සේට පමණක්ය යන හේතුව නිසා නොවේද?

අප මෙතෙක් බැලුවේ මතෙව් සුභ අස්නේ ඇති ජේසුස් තුමන්ගේ ඇතැම්

දෙසුම්ය. දැන් අප අනෙක් සුභ අසුන්වල මේ සම්බන්ධයෙන් ඇති දේශනා වෙතට අප යොමු වෙමු.

**ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් 'ප්‍රධානතම ආඥාව මෙයයි. අහෝ ඉශ්‍රායේල් වැසියෙනි සවන් දෙන්න අපේ දෙවියන්වහන්සේ වූ ස්වාමීන්වහන්සේට ඔබේ මුළු හෘදයෙන්ද ඔබේ මුළු ආත්මයෙන්ද ඔබේ මුළු බුද්ධියෙන්ද ඔබේ මුළු ශක්තියෙන්ද ප්‍රේම කරන්න'.** (මාර්ක් 12:29-30)

ජේසුස් තුමන් මරණාසන්න වූ අවස්ථාවේ 'දෙවියන්වහන්සේ මා අත් හැරියේ ඇයි දැයි?' කන්නලව් කළ විස්තරය මාර්ක් 15:34 හිද සඳහන් වේ. එමෙන්ම 'එම හෝරාව හා දිනය පියාණන්වහන්සේ හැර අන් කිසිවෙකු නොදනිති' යැයි ජේසුස් වහන්සේ කී බව මාර්ක් 13:32 හිද සඳහන්ය.

**'.... සත්‍යතාවය නම් මා එවූ තැනැන්වහන්සේයි. මා ලෝකයට ප්‍රකාශ කරන්නේ උන්වහන්සේගෙන් අසා ඉගෙන ගත් දේමයැ'යි පැවැසූ සේක.** (යොහාන් 8:26)

මේ සියල්ල අළුත් ගිවිසුමෙහි සඳහන් වී ඇති දෙසුම් වේ. කරුණු මෙසේ තිබියදී ත්‍රිත්වයේ සංකල්පය ඇති කළේ පාවුල් යන විත්තිය සියල්ලෝම දනිති. පාවුල් මේ පිළිබඳ කරන පාපොච්චාරණයට අප යොමු වෙමු.

**'පියාණන්වහන්සේ ඉගැන්වූ දේම දේශනා කළා මිස මාගේම සහජ හැකියාවෙන් මා කිසිවක් නොකළ බවත් හොඳකාරව දැනගන්නවා ඇත'.** (යොහාන් 8:28)

**'යමෙක් මාගේ වචන අසා ඒවා පිළිපදින්නේ නැති වූවත් මා නම් ඔහු විනිශ්චය නොකරමි. මා ආවේ ලෝකය ගලවා ගැනීමට මිස එය විනිශ්චය කිරීමට නොවේ'.** (යොහාන් 12:47)

ජේසු තුමන් දෙවියන්වහන්සේ හෝ දෙවියන්වහන්සේගේ පුත්‍රයා හෝ නොවන බවට මෙයට වඩා සාධක අවශ්‍යද? ඇත්තෙන්ම බයිබලය විශ්වාස කරන්නන්ට කිසිසේත් ජේසු තුමන් දෙවියන්වහන්සේගේ පුත්‍රයාය යන කියමන පිළිගත නොහැක. එසේ එම ප්‍රතිපත්තියේ රැඳී සිටීම අවශ්‍ය නම් ඔවුන් එසේ කළ හැක්කේ බයිබලය පසෙකට විසිකර දැමීමෙන් පසුව පමණී.

ජේසු වහන්සේ කිසිවිටෙක තමා දෙවියන්වහන්සේගේ පුත්‍රයා යැයි කියා නොගත්හ. එතුමන් දෙවියන්වහන්සේගේ අණ පරිදි ක්‍රියා කළ ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකි. සත්‍ය හා සුවිශේෂී දේව පණිවිඩකරුවෙකි. යහපත් දැහැමි උත්තමයෙකි. බයිබලයේ වැකි හොඳින් අධ්‍යයනය කරන්නන්ට පැහැදිලි වන පරම සත්‍යය මෙයයි.

# සිව්වැනි කොටස

# ජේසුස් තුමන් පිළිබඳ ශුද්ධ කුර්ආනය පවසන්නේ කුමක්ද?

කිතුනු සහෝදරවරුනි! ඔබලාගේ පූජකයන්ගේ වැරදි ආකල්පයන් නිසා ජේසු වහන්සේ දේශනා කළ ඒක දේව සංකල්පය ඔබලා අතර වැනසී ගොස් ඇත. අප මෙතෙක් ඉදිරිපත් කළ බයිබල් වැකිවලින්ම මෙම සත්‍යය පැහැදිලි වන්නට ඇත. එසේ නම් ජේසු වහන්සේ විසින් දේශනා කරන ලද සත්‍ය උපදෙස් තිබෙන්නේ කොහිද? එය පිළිපදින්නේ කෙසේද? ජේසු වහන්සේ විසින් ඇත්තෙන්ම දෙසන ලද ඒක දේව සංකල්පය කිසිම කිතුනු පූජකයෙකුගෙන් ඔබට ලබා ගත නොහැක.

'මාගේ දෙවියන්වහන්ස! මාගේ දෙවියන්වහන්ස!! මා අත්හැරියේ ඇයිද?' යි අවසාන මොහොතේ යේසුස් තුමන් කන්නලව් කළේ යැයි බයිබලය පවසයි.

මෙයින්ම 'මා දෙවියන්වහන්සේ නොවේ' යැයිද 'මවිසින් මාව රැකගත නොහැක' යැයිද 'මාව මැවූ දෙවියන්වහන්සේගේ සිතැඟි පරිදිම සියල්ල සිදුවේ' යැයිද ජේසු වහන්සේම පිළිගත් බව ඔප්පුවේ.

මෙම මොහොතේ පවා ලොවට ජේසු වහන්සේ හඬ නගා කී එම ඒක දේව මූලධර්මය එලෙසින්ම පිළිපැදීමට ඔබ අවංකව සිතන්නේ නම් ඉස්ලාමය ඔබ පිළිගත යුතුය. ඉස්ලාමයේ ආගමික හෙළිදරව්ව වන ශුද්ධ කුර්ආනය ජේසු වහන්සේ විසින් දේශනා කරන ලද එම ඒක දේව මූලධර්මය එලෙසින්ම හා කිසිදු විකෘති කිරීමකට ඉඩ නොදෙමින් දෙසයි. ජේසු වහන්සේ දේවත්වයක් නොතිබුනු බව ඉඳුරා පවසන ශුද්ධකුර්ආනය ඒ අතරම එතුමන්ගේ සුවිශේෂත්වයන් ගැනද විස්තරාත්මකව හා කිසිදු පටහැනිතාවයකින් තොරව පැහැදිලිකරයි. මුහම්මද් තුමන් කෙලෙසින් දෙවියන්ගේ පණිවිඩය මිනිසුන්ට සැල කර සිටියේද, එලෙසින්ම ජේසු තුමන් දෙවියන්වහන්සේගේ පණිවිඩය ජනයාට සැල කිරීමට පැමිණි ප්‍රබල දූතයෙකි යැයි ශුද්ධ කුර්ආනය පවසයි.

කිතුනු සහෝදරවරුනි! ඔබලාගේ අධ්‍යයනය සඳහා මෙහි මෙම කරුණ හා සම්බන්ධ කුර්ආන් වැකි කිහිපයක් අප ඉදිරිපත් කර ඇත්තෙමු.

## මේරි තුමිය පිළිබඳ

**'තවද ඔවුන්ගේ ප්‍රතික්ෂේපය නිසා හා මර්යම්හට ඇවැන්ත බොරු චෝදනාවක් ඔවුන් ගෙතූ නිසා (දෙවියන්වහන්සේ ඔවුන්ට ශාප කළ සේක).** -ශුද්ධ කුර්ආනය 4:155-156

**සිය පතිවත රැකගත් (මර්යම් නම්) තැනැත්තිය මෙනෙහි කරනු. අපගේ ආත්මයෙන් අප ඇයට පිම්බෙමු. තවද ඇයව හා ඇයගේ පුත්‍රයාව අප**

ලොවට අනුහස් සලකුණක් බවට පත් කළෙමු. -ශුද්ධ කුර්ආනය 21: 91

තවද මර්යම්ගේ පුත්‍රයාව හා ඔහුගේ මව අප අනුහස් සලකුණක් කළෙමු. -ශුද්ධ කුර්ආනය 23:50

තවද ඉම්රාන්ගේ දූ මර්යම්වද (දෙවියන්වහන්සේ නිදසුනක් ලෙසින් විශ්වාසිකයන්ට පවසයි) ඇය සිය මර්මස්ථානය (හෙවත් පතිවත) රැක ගත්තීය. එහෙයින් අපගේ ජීවයෙන් ඇයට අප පිම්බෙමු. ඔහු සිය ස්වාමීන්වහන්සේගේ වැකි හා ඔහුගේ ආගම්ද සත්‍ය (බවට තහවුරු) කළේය. (තවද) ඔහු මුලුමනින්ම අවනත වූවන්ගෙන් කෙනෙකුවද සිටියේය. -ශුද්ධ කුර්ආනය 66:11-12

ඉම්රාන්ගේ බිරිය (ඇය ගැබ්ගත් විට) 'දෙවිඳුනි නිශ්චය වශයෙන්ම මාගේ කුසෙහි ඇති දෑ ඔබවහන්සේ වෙනුවෙන් පිදූ දෙයක් ලෙසින් ඉටා ගතිමි. එහෙයින් එය මා වෙතින් පිළිගනු මැනව. නිශ්චය ලෙසින්ම ඔබවහන්සේමය සවන් දෙන්නා. සියල්ල දන්නා' යයි ප්‍රාර්ථනා කළ සැටි මෙනෙහි කරනු. -ශුද්ධ කුර්ආනය 3:35-37

තවද සුර දූතයන් 'ඕ මර්යම්! නිශ්චය වශයෙන්ම දෙවියන්වහන්සේ ඔබව තෝරා ඔබව පවිත්‍රද කර ලොව සිටින සියළු කතුන් අතරින් ඔබව තෝරා ඇති සේක' යයි පැවසූ විට (සිදු වූ දෙය මෙනෙහි කරනු). -ශුද්ධ කුර්ආනය 3:42-43

## ජේසුස් තුමන් පිළිබඳ

### ශුද්ධ කුර්ආන වැකි

තවද දෙවියන්වහන්සේගේ පණිවිඩකරු මර්යම්ගේ පුත් ජේසුව අප ඝාතණය කළෙමු යයි ඔවුන් කී නිසා (දෙවියන්වහන්සේ ඔවුන්ට ශාප කළේය) ඔවුන් ඔහුව ඝාතණය කළේ නැත. ඔවුන් ඔහුව කුරුසියේ ඇණ ගැසුවේද නැත. ඔවුන්ට (පෙනුමෙන් ජේසු වැනි වූ තවත් කෙනෙකුව) පත් කරන්නට යෙදුනි. තවද මේ පිළිබඳ පටහැනි වෙමින් සිටින්නන් ඒ පිළිබඳ සැකයෙන්ම පසුවෙති. අනුමානයක් පිළිපැදීම හැර ඔවුන්ට එහි පැහැදිලි දැනුමක් නොමැත. තවද නිශ්චය වශයෙන්ම ඔවුන් ඔහුව ඝාතණය කළේ නැත්තේමය. -ශුද්ධ කුර්ආනය 4:156-159

යුදෙව්වන්ට ග්‍රහණය කර ගන්නට ඉඩ නොතබා දෙවියන්වහන්සේ විසින් ජේසු තුමන්ව තමන් වෙත ඔසවා ගනු ලැබුවේ යැයි ශුද්ධ කුර්ආනයේ සර්වබලධාරී දෙවියන්වහන්සේ පවසයි.

තවද ජේසු (සාධක වශයෙන්) පැහැදිලි දෑ රැගෙන පැමිණ 'කුමක් පිළිබඳ ඔබලා පටහැනි වෙමින් සිටින්නේද එයින් ඇතැමක් ඔබලාට පැහැදිලි කරනා ඥාණය මා ඔබ වෙත ගෙනැවිත් ඇත්තෙමි. ඔබලා දෙවියන්වහන්සේට බියබැති වී මට අවනත වන්න' යැයි පැවසීය. -ශුද්ධ කුර්ආනය 43:63-64

'ඕ මර්යම්! නිශ්චය වශයෙන්ම දෙවියන්වහන්සේ තමා වෙතින් වන ('වනු' නම් වූ) එක් වචනයක් මගින් ඔබට (දරු ගැබක) සුභාරංචි පවසන සේක. ඔහුගේ නම 'මසීහ්' මර්යම්ගේ පුත් ජේසු වේ. ඔහු (දෙවියන්වහන්සේට) ඉතා සමීපතරයන්ගෙන් කෙනෙකු වනු ඇත'. -ශුද්ධ කුර්ආනය 3:45-56

නිශ්චය වශයෙන්ම දෙවියන්වහන්සේ වෙත ජේසුස්ගේ නිදසුන ආදම්ගේ නිදසුන වැනිය. දෙවියන්වහන්සේ ඔහුව පසෙන් නිමවා පසුව එයට 'වනු' යයි කී සේක. (එවිට) ඔහු (එසේම) වුණේය. -ශුද්ධ කුර්ආනය 3:59

එම ගෝලයින් 'මර්යම්ගේ පුත් ජේසු! ඔබගේ දෙවියන්වහන්සේ අප වෙනුවෙන් අහසේ සිට (ආහාර පිරි) බන්දේසියක් පහළ කරන්නට තරම් බලසම්පන්නදැ'යි ඇසූ විට (ජේසු) 'ඔබලා විශ්වාස කළවුන්ව සිටිත් නම් (මෙවැනි ප්‍රශ්න ඇසීම පිළිබඳ) දෙවියන්වහන්සේට බිය වන්න' යයි කීහ. -ශුද්ධ කුර්ආනය 5:112-115

තවත් මර්යම්ගේ පුත් ජේසු 'ඉශ්‍රායේල්ගේ දරුවනි! මා මට පෙර එවනු ලැබූ තෝරාතය සත්‍ය යයි තහවුරු කරන්නෙකුවද මාගෙන් පසු අහමද් නමින් දූතයෙකු එනු ඇත යන සුබාරංචිය දන්වන්නෙකුවද පැමිණි දෙවියන්වහන්සේගේ දූතයෙකු වෙමි. -ශුද්ධ කුර්ආනය 61:6

විශ්වාසවන්තයිනි! 'දෙවියන්වහන්සේ වෙනුවෙන් මට උදව් කරන්නවුන් කවරහුදැ'යි මර්යම්ගේ පුත් ජේසු සිය ගෝලයින්ගෙන් ඇසූ විට එම සහකරුවන් 'අප අල්ලාහ්ට සහය දක්වන්නන් වම්හැ'යි කීවාක් මෙන් ඔබලාද දෙවියන්වහන්සේගේ සහකරුවන් බවට පත් වන්න. -ශුද්ධ කුර්ආනය 61:14

මෙම ආගමෙහි මර්යම් ගැනද මෙනෙහි කරන්න. ඇය සිය නිවැසියන් වෙතින් ඈත් වී නැගෙනහිර දෙස පිහිටි එක් තැනෙක හුදෙකලා වූ විට තමාව ඔවුන්ගෙන් වසන්කර ගැනීමට තිරයක් ඇති කර ගත්තාය. එවිට අපගේ (ගේබ්රියල් නම්) ආත්මයාණන් ඇය වෙත යැව්වෙමු. ඔහු නියම මිනිසෙකුගේ ස්වරූපයෙන් ඇය ඉදිරියේ දෘශ්‍යමාන විය. (ඔහුව දුටු ඇය) 'නිශ්චය වශයෙන්ම ඔබගෙන් මා රැක ගන්නා මෙන් මා පරම දයාන්විතයාගෙන් රැකවල් පතමි. ඔබ බියබැතියෙක් නම් (මා සමීපයට නොඑනු)' යයිද කීවාය. (එයට) ඔහු 'ඔබට පවිත්‍රවූ පුතකු මා දයාද කිරීමට ඔබගේ ස්වාමීන් වෙතින් පැමිණි (සුර) දූතයෙකුම වෙමි'යයි පැවසීය. එයට ඇය 'මට කෙසේ පුතකු ඇති විය හැකිද? කිසිදු පුරුෂයෙකු මා (මෙතෙක්) ස්පර්ශ කරද නැත්තේය. තවද මා අශීලාචාර පැවතුම් ඇති තැනැත්තියක්ද නොවෙමි'යයි කීවාය. එයට ඔහු 'එය එසේම වනු ඇත. තවද 'එය මා හට ඉතා පහසු දෙයකි. ඔහුව මිනිසුන්ට සලකුණක් ලෙසින් හා අපගෙන් ආශීර්වාදයක් ලෙසින් කරනු පිණිස මෙය තීන්දු වූ දෙයකැ'යි ඔබගේ ස්වාමීන්ම පවසන සේක' යයිද (සුර දූතයා) කීය. පසුව ඇය (ජේසු වන) ඔහුව පිළිසිඳියාය. පසුව එය සමග ඈත තැනකට ගියාය. පසුව ප්‍රසූත වේදනාව ඉඳි ගසෙක පා මුල දක්වා ඇය රැගෙන

ගියේය. 'මෙයට පෙරම මා මරණයට පත් වී අමතක කරනු ලැබූ තැනැත්තියක් බවට පත් වන්නට තිබුනි නොවේදැ'යි ඇය කීවාය. එවිට ඇයට පහළින් සිට (ගේබ්‍රියෙල් වන) ඔහු ශබ්ද නගා ඇය අමතා 'ඔබ දුක් නොවන්න. ඔබට පහළින් එක් උල්පතක් ඔබගේ ස්වාමීන් ඇති කර ඇති සේක. තවද මෙම ඉඳි ගසේ පහළ කොටස ඔබ දෙසට අදිනු. (එවිට) එය ඉදුනු ගෙඩි ඔබ මත හෙලනු ඇත. එවිට ඔබ අනුභව කරන්න. තවද ජලයද පානය කරන්න. (තවද මෙම දරුවා ලැබූ නිසා) සතුටු දෑසින් යුතුව සිටින්න. පසුව මනුෂ්‍යයන් කිසිවෙකු ඔබ දුටුවහොත් 'මා පරම දයානුකම්පිතයාට උපවාසය ඉටා ඇත්තෙමි. එහෙයින් කිසිදු මිනිසෙකු සමග අද දින කිසිසේත් කථා නොකරමි' යයි (හස්ත මුද්‍රාවෙන්) කියන්න' යයිද කීය. පසුව (එම බිළිඳා වැදූ පසු) එය ඔසවා ගෙන සිය සමූහයා වෙත පැමිණියාය. ඔවුන් 'ඕ මර්යම්! නිශ්චය වශයෙන්ම තහනම් කරනු ලැබූ ක්‍රියාවක් (කිරීමේ දුෂ්ට ඵලය) නුඹ ගෙනැවිත් ඇත' යයි කීහ. (තවද ඔවුන්) 'හාරූන්ගේ සොයුරියේ! නුඹගේ පියා නරක මිනිසෙකුව සිටියේ නැත. නුඹගේ මවද නොමනා හැසිරීම් ඇති ස්ත්‍රියක්ව සිටියේ නැත' යයිද කීහ. එවිට ඇය (මේ පිළිබඳ දරුවාගෙන් අසා ගන්නැයි කියන්නාක් මෙන්) බිළිඳා වෙත (අත දිගු කරමින්) සංඥා කළාය. (එයට) ඔවුන් 'තොටිල්ලේ සිටින බිළිඳෙකුගෙන් අප කෙසේ කථා කරමුදැ?'යි (පෙරලා) ඇසූහ. එවිට (ජේසු බිළිඳා කථා කරමින්) 'නිශ්චය වශයෙන්ම මා දෙවියන්වහන්සේගේ ගැත්තා වෙමි. ඔහු මට පුස්තකයක්ද දී පණිවිඩකරුවෙකු බවටද පත් කර ඇත්තේය' යයි පැවසීය. (තවද) 'මා කොහි සිටියද මා භාග්‍යවන්තයෙකු බවට ඔහු පත් කර ඇත්තේය. තවද මා ජීවත්ව සිටිනතාක් වන්දනයෙන්ද සකාතයෙන්ද තවද මාගේ මවට මා තුති පුදන්නෙකු විය යුතු යයිද උපදෙස් කර ඇත්තේය. (එමෙන්ම) මා උපත ලැබූ දිනයේද මා මරණයට පත් වන දිනයේද මා නැවත ජීවය ලැබී නැගිටවනු ලබන දිනයේද මා කෙරෙහි ශාන්තිය ඇති වේවා' යයිද (ජේසුස් බිළිඳා) පැවසීය. මර්යම්ගේ පුත් ජේසු මොහුය. කුමක් පිළිබඳ ඔවුන් තර්ක කරමින් සිටිත්ද ඒ පිළිබඳ සත්‍ය වදන මෙයයි. දෙවියන්වහන්සේ (වන) ඔහු කිසිදු පුත්‍රයෙකු ගත යුතු නැත. ඔහු ඉතා සුවිශුද්ධය. යම් කාරියක් තීරණය කළ කල්හි ඔහු ඒ සඳහා පවසනුයේ (එසේ) 'වනු' යනුවෙනි. එය (එසේම) වන්නේය. ජනයිනි! මාගේ ස්වාමීන් හා ඔබගේ ස්වාමීන් දෙවියන්වහන්සේ පමණි. එහෙයින් ඔහුව පමණක් ඔබලා නමදින්න. එයයි ඍජු මාර්ගය වන්නේ (යයිද ජේසුස් බිළිඳා පැවසීය). -ශුද්ධ කුර්ආනය 19: 16-36

## දෙවියන්වහන්සේට දරුවන් නැත

(පූර්ව) නිදසුනක් නොමැතිවම ඔහු අහස් ගැබ හා පොළොව මවා ඇත. ඔහුට සහකාරියක්ම නැතිව තිබෙන විට කෙසේ දරුවෙකු තිබිය හැක්කේද? තවද සියළුම දේ මැවුවේ ඔහුය. (එනිසාම එම) සියළු දේ ගැන ඔහු හොඳින් දන්නේය. -ශුද්ධ කුර්ආනය 6:101

'තවද යුදෙව්වන් 'හුසෙයිර්' දෙවියන්වහන්සේගේ පුත්‍රයා යයි කියති. කිතුනුවන් 'මෙසේයා' (නම් වන ජේසු) දෙවියන්වහන්සේගේ පුත්‍රයා යයි කියති. එය මොවුන් ඔවුන්ගේ මුවෙන් කියනා වචන (හැර අන් කිසිවක් නො) වේ. මොවුන්ට පෙර සිටි ප්‍රතික්ෂේප කරන්නන් සමග කීමෙන් මොවුන්ද සමාන වෙති. දෙවින්වහන්සේ මොවුන් විනාශ කරත්වා. (සත්‍යයට පටහැනිව) මොවුන් කොහි හරවනු ලබන්නෝද? -ශුද්ධ කුර්ආනය 9:30-31

දෙවියන්වහන්සේ පුතෙකු ගත්තේ යයි ඔවුන් පවසති. ඔහු ඉතා සුවිශුද්ධය. අනාධීනය. අහස්වල හා පොළොවේ ඇති දේද හිමි ඔහුටමය. (ඔහු පුතෙකු ගත්තේය යන එම ප්‍රකාශයට) කිසිදු සාධකයක් නැත. ඔබලා නොදන්නා දෙයක් දෙවින්වහන්සේට පවසන්නෙහිද? 'නිශ්චය වශයෙන්ම දෙවියන්වහන්සේ විෂයයෙහි බොරුවක් ගොතන්නන් ජය නොලබති' යි කියනු. -ශුද්ධ කුර්ආනය 10:68-69

'(තමන් වෙනුවෙන්) දරුවෙකු නොගත් පාලනයේ කිසිදු සහයක් (අවශ්‍ය) නැති හා නිගරුවෙන් ඔහු රකින්නන්ද කිසිවෙකු නැත්තාවූ එවන් (බලසම්පන්න) දෙවියන්වහන්සේටමය සියළු ප්‍රශංසා' යයි කියනු. -ශුද්ධ කුර්ආනය 17:111

'තවද පරමදයානුකම්පිතයා (තමාට) පුතෙකු ගත්තේය' යයි (කිතුනුන් වන) ඔවුන් කියති. නිශ්චය වශයෙන්ම (මෙසේ කීමෙන් ඔබලා) දරුණු අසත්‍ය චෝදනාවක් කර ඇත. (මෙමගින්) අහස් පිපිරෙන්නටද පොළොව දෙබෑවන්නටද කඳු පුපුරා සුණුවිසුණු වී යන්නටද ඉඩ ඇත'. -ශුද්ධ කුර්ආනය 19:88-93

ඔහු කෙබන්දෙක්ද යත් අහස්හි හා පොළෝතලයෙහි රාජ්‍යය හිමි ඔහුටමය. (තවද) ඔහු තමාට පුතෙකු ගත්තේද නැත. -ශුද්ධ කුර්ආනය -25:02

දෙවියන්වහන්සේ (දරුවෙකු) වැදුවේය (යයි) මොවුන් අසත්‍යයක්ම කියත. -ශුද්ධ කුර්ආනය 37:151-152

තවද දෙවියන්වහන්සේ පුතෙකු ගත්තේය යයි ඔවුන් කියති. (නමුත්) ඔහු ඉතා සුවිශුද්ධය. -ශුද්ධ කුර්ආනය 2:116

ඔහු (කිසිවෙකු) නොවැදුවේය (තවද) ඔහු (කිසිවෙකු විසින්) වදනුද නොලැබුවේය. -ශුද්ධ කුර්ආනය 112:3-4

පුස්තකයේ ජනයිනි! ඔබලාගේ ආගමෙහි සීමාව ඉක්මවා නොයන්න. තවද දෙවියන්වහන්සේ විෂයයෙහි සත්‍යය හැර අන් කිසිවක් නොකියන්න. නිශ්චය වශයෙන්ම මේරිගේ පුත් 'මෙසේයා' ජේසු දෙවියන්වහන්සේගේ දූතයෙකු හා ඔහුගේ (සත්‍ය) වචනයක්ද වෙයි. දෙවියන්වහන්සේ ඔහු වෙතින් (එවනු ලබන අන් ආත්ම සේම) ආත්මයක් ලෙසින් එය මේරි වෙත එවුවේය. එහෙයින් දෙවියන්වහන්සේ හා ඔහුගේ දූතයන් ඔබලා විශ්වාස කරන්න. තවද 'ත්‍රිත්වය' යයි නොකියා එයින් ඉවත් වන්න. එයින් යහපත

වන්නේ ඔබටමය. නිශ්චය වශයෙන්ම දෙවියන්වහන්සේ එකම දෙවියෙකි. දරුවන් තිබීමෙන් ඔහු සුවිශුද්ධය. -ශුද්ධ කුර්ආනය 4: 173

'මෙසේයා' (නම් වන ජේසු) හෝ දෙවියන්වහන්සේට සමීප සුරදූතයන් ඔහුගේ ගැත්තන්ව සිටීම පහත් කොට නොසලකති. -ශුද්ධ කුර්ආනය 4:173

'නිශ්චය වශයෙන්ම දෙවියන්වහන්සේ මේරිගේ පුත් මෙසේයාමය' යයි පැවසුවන් ස්ථිරවම ප්‍රතික්ෂේප කළවුන් (බවට පත්) වූහ. (නමුත්) එම මෙසේයා කීවේ 'ඉශ්‍රායේල්ගේ දරුවනි! මාගේ ස්වාමීන් හා ඔබලාගේ ස්වාමීන් වන දෙවියන්වහන්සේටම නමදින්න' යනුවෙන්මය. කවුරුන් දෙවියන්වහන්සේට (අනෙකෙක්) සමාන කරන්නේද ඔහුට ස්ථිරවම දෙවියන්වහන්සේ ස්වර්ග රාජ්‍යය වසා දමන්නේය. තවද ඔවුන්ගේ රැඳුම්පළ නිරයයි. තවද අපරාධකරන්නන්ට පරලොවෙහි උපකාර කරන්නන් නොසිටිති. නිශ්චය වශයෙන්ම දෙවියන්වහන්සේ ත්‍රිත්වයේ තෙවැන්නාය යයි පැවසුවන් තිර වශයෙන්ම ප්‍රතික්ෂේප කරන්නවුන් බවට පත්වූහ. එකම දෙවියෙකු හැර අන් දෙවියෙකු නැත්තේමය. එහෙයින් ඔවුන්ගේ කීමෙන් ඔවුන් ඉවත් නොවුවහොත් ඉතා වේදනාකාරී හිංසා ඔවුනතර සිටින ප්‍රතික්ෂේප කරන්නන් ග්‍රහණය කරගනු ඇත. ඔවුන් දෙවියන්වහන්සේ වෙතට යොමුවී සිය පාපයන් වෙනුවෙන් ඔහුගෙන් සමාව නොඅයදින්නෝද? දෙවියන්වහන්සේ අතිශයින්ම ක්ෂමා කරන්නාය. පරමදයාන්විතයාය. -ශුද්ධ කුර්ආනය 5:72-75

ජේසුස් වහන්සේ ට විශේෂ හැකියාවන් හා ගති ලක්ෂණ කිහිපයක්ම ප්‍රදානය කළ බව ශුද්ධ කුර්ආනය පවසයි. එසේ වුවද ඔහු එම ලක්ෂණ නිසා දෙවියන් විය නොහැකි බවද ශුද්ධ කුර්ආනය පැහැදිලි කරයි. ජේසුස් වහන්සේ විසින් ඇත්තෙන්ම කුමක් දේශනා කරන ලද්දේද හා කුමන සත්‍යය කිතුනු ලෝකය අද විකෘති කර තිබේද, එම සත්‍ය පණිවිඩය ශුද්ධ කුර්ආනය මනා අන්දමින් විස්තර කරන බවට අප මෙතෙක් ඉදිරිපත් කළ වැකි ප්‍රමාණවත් සාධක වෙයි. ජේසුස් වහන්සේ ට මෙන්ම තවත් දෙවියන්වහන්සේගේ පණිවිඩකරුවන් ගණනාවකටම විශේෂ හැකියාවන් ලබා දී තිබුනද, මුහම්මද් තුමන්ද ඇතුලත්ව ඔවුන් කිසිවෙකු දේවත්වයෙන් පිදීමට ඉස්ලාමය කිසිසේත් අනුමැතිය දෙන්නේ නැත. ජේසුස් වහන්සේ විසින් එද ප්‍රචාරය කළ සත්‍ය පණිවිඩය එලෙසින්ම හා කිසිදු විකෘතියකට ලක් වීමට ඉඩ නොදී රැක ගෙන සිටින්නේ ශුද්ධ කුර්ආනය පමණී.

නිශ්චය වශයෙන්ම දෙවියන්වහන්සේ (අන් කිසිවෙකු නොව) ඔහු මේරිගේ පුත් 'මෙසේයා' මය යයි පැවසුවන් තිර ලෙසින්ම ප්‍රතික්ෂේප කළවුන් බවට පත් වූහ. 'මේරිගේ පුත් 'මෙසේයා' හා ඔහුගේ මෑණියන්වද (එපමණක් නොව) පොළොවෙහි ජීවත් වන සියල්ලන්වම විනාශ කරන්නට දෙවියන්වහන්සේ සිතුවහොත් දෙවියන්වහන්සේගේ හිංසාවෙන් ඔවුන් මුදා ගැනීමට මඳ වශයෙන් හෝ හැකියාව ලබන්නා කවුරුන්ද?' යයි ඔබ අසනු. අහස්හි හා පොළොවෙහිද ඒ අතර ඇති සියළුම දේහි පාලනය හිමි ඔහුටමය. ඔහු තමා සිතන දෙය මවන්නේය. තවද දෙවියන්වහන්සේ සියළුම දේ මත බලය ඇත්තාය. -ශුද්ධ කුර්ආනය 5:17

මෙම වැකියේ අදහස වන්නේ ජේසු වහන්සේ හා එතුමන්ගේ මව්තුමිය දෙවියන්වහන්සේ විසින් විනාශ කරනු ඇත යනු නොවේ. මෙයින් ගම්‍ය වන්නේ ජේසුස් වහන්සේ වේවා මුහම්මද් ඇතුළු දෙවියන්වහන්සේගේ ඕනෑම පණිවිඩකරුවෙක් වේවා මේ සියල්ලෝම දෙවියන්වහන්සේ ගැත්තන් පමණී යනුයි. තවද ඔවුන්ට දෙවියන්වහන්සේ හා කිසිදු නෑකමක් හෝ බලයක් නැත යන්නයි.

කිතුනු සහෝදරවැනි! පරලොව රාජ්‍යයේ ඔබලා නැගිටවනු ලබන විට ජේසුස් වහන්සේ විසින් ඔබලා රැක ගනු ඇත යැයි විශ්වාස කරමින් සිටින්නනි! එසේ තමාට මිනිසුන් රැක ගත නොහැකි යැයි ජේසුස් තුමන් විසින්ම බයිබලයේම ප්‍රකාශ කර ඇති සැටිද එම ප්‍රකාශයම ශුද්ධ කුර්ආනයේද තිබෙන සැටිද අප ඔබට මෙතෙක් පැහැදිලි කළෙමු.

**තවද 'මේරිගේ පුත් ජේසුනි! 'දෙවයන්වහන්සේ හැර මා හා මාගේ මවුතුමිය නැමදීමට සුදුසු දෙදෙනෙකු ලෙසින් ගනු' යයි ජනයින්ට ඔබ කීවෙහිද?' යනුවෙන් දෙවියන්වහන්සේ අවසාන දිනයෙහිදී (ජේසුගෙන්) අසනු ඇත. (එයට ජේසු) 'ඔබ ඉතා සුවිශුද්ධය. මට කිසිසේත් නොගැලපෙන්නක් කීම මට යෝග්‍ය නොවේ. එසේ මා පවසා තිබුනහොත් එය නිශ්චය ලෙසින්ම ඔබ දන්නෙහිය. මාගේ සිතෙහි හට ගන්නා සිතුවිලි ගැන (පවා) ඔබ දන්නෙහිය. (නමුත්) ඔබගේ සිතෙහි තිබෙන දෙය මා නොදනිමි. නිශ්චය වශයෙන්ම වසන් වී ඇති දේ පිළිබඳ (මනාව) දන්නා ඔබමය' යයි කියනු ඇත. (තවද) 'මාගේ ස්වාමීන් හා ඔබලාගේ ස්වාමීන් වන දෙවියන්වහන්සේටම නමදින්න' යයි (කියනා මෙන්) ඔබ අණ කළ දෙය හැර අන් කිසිවක් මා ඔවුන්ට නොකීවෙමි. මා ඔවුන් සමග සිටින තාක් ඔවුන්ගේ ක්‍රියාවන් ගැන දැන සිටියෙමි. (පසුව) ඔබ මා අත්පත් කළ පසු ඔවුන් පිළිබඳ අධීක්ෂණය කරන්නා ලෙසින් සිටියේ ඔබමය. ඔබ සියළුම දේ සඳහා වන සාක්ෂිකරුවාය. ඔබ ඔවුන්ට හිංසා කළද ඔවුන් ඔබගේම වහලුන් වෙති. (එසේ නොකර) ඔවුන්ට සමා වුවහොත් (එය වඩා යහපති. ඇයිද යත්) ඔබ සියල්ල අභිබවන්නාය. සර්වඥයාය' (යයිද පවසනු ඇත).** -ශුද්ධ කුර්ආනය 5:116-118

එනිසා කිතුනුවනි! පරලෝක ස්වර්ග රාජ්‍යයට ඇතුල්වීමට ඔබ පතන්නේ නම් ජේසුස් තුමන් දෙවියන්වහන්සේගේ යහපත් පණිවිඩකරුවෙක් ලෙසින් පමණක් පිළිගන්න. එය හැර එතුමන් දේවත්වයෙන් නොපුදන්න. එය මහා පාපයකි. ජේසුස් තුමන්ගේ උපතේ ආශ්චර්යය හා එතුමන්ගේ සත්‍ය පණිවිඩය වසර 1400 ටත් අධික කාලයක් පුරා එලෙසින්ම සංරක්ෂණය කරමින් සිටින ඉස්ලාමයට ඔබද ඇතුල් වන්න. සදාකාලික ජය ලබන්න. මෙසේ කිරීමෙන් ජේසුස් තුමන් ප්‍රතික්ෂේප කළ අය බවට ඔබ කිසි විටෙක පත්වන්නේ නැත. එය වෙනුවට ඉස්ලාමය පිළිගැනීමෙන් ජේසුස් තුමන්ට දිය යුතු නියම ගරුත්වය හා නියම ස්ථානය දුන් සත්‍ය විශ්වාසිකයන් බවටම ඔබලා පත් වී ජය ලබනු ඇති බවට කිසිදු සැකයක් නැත.

පරලෝක රාජ්‍යයේ සදාකාලික ජය ලැබීමට දෙවියන්වහන්සේ ආශීර්වාද කරත්වා ආමේන්!